ISSN 1391 - 1031
2018 මාර්තු
23 වෙළුම 11 කලාපය

ආධාරය රු 30/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

*"එය ධනපති ආණ්ඩුවක් නිසා පාන් දීම එයට කළ නොහැකිය. එයට දිය හැකි හොඳම දෙය, 'දක්ෂ ලෙස සංවිධානය කළ දුර්භික්ෂය' වන්නේය. නමුත් ජනතාව දුර්භික්ෂය පිළිනොගනු ඇත. පාන් තිබෙන බවත්, එය ලබා ගත හැකි බවත්, එහෙත්, එය ලබා ගත හැක්කේ ප්‍රාග්ධනයේ හා ඉඩම් හිමිකමෙහි ශුද්ධත්වයට ගරු නොකරන ක්‍රමවලින් පමණක් බවත්, ඔවුන් ඉගෙන ගනු ඇත. සමහර විට ඉතා ඉක්මනින් ඔවුන් එය ඉගෙන ගනු ඇත."*

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05 වැනි වෙළුම,**
**19 පිටුව**

## බල වුවමනාවන් වෙනුවෙන්

# ආණ්ඩුව රට අරාජික කරලා

## ජ.වි.පෙ. අවධාරණය කරයි

ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ කණ්ඩායම සහ මෛත්‍රීපාල සිරිසේන කණ්ඩායම එකිනෙකාට එරෙහිව තමන්ගේ බල වුවමනාවන් වෙනුවෙන් කටයුතු කරමින් සිටීමත් ජනතාවට ඉටුකළ යුතු වගකීම් අමතක කිරීමත් හේතුවෙන් මේ වන විට රට අරාජික තත්වයකට පත්වී ඇතැයි කියා සිටි ජනතා විමුක්ති පෙරමුණ, ජනතාවගේ වුවමනාවන් වෙනුවෙන් ජනතාව සමඟ ආණ්ඩුවට එරෙහිව සටන් කරන්නට ජ.වි.පෙ. සූදානම් යැයි අවධාරණය කරයි.

පසුගිය 28වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පැවති ජනමාධ්‍ය හමුවේදී අදහස් දැක්වූ ජ.වි.පෙ. නායක නායක අනුර දිසානායක සහෝදරයා මේ බව ප්‍රකාශ කළේය.

පළාත් පාලන මැතිවරණය අවසන් වී මේ වන විට සති තුනකට ආසන්න කාලයක් ගතවී තිබෙන නමුදු රට තුළ වර්ධනය වී තිබෙන අරාජික තත්වය හමුවේ රට ආණ්ඩුවක් නොමැති තත්වයකට පත්ව ඇතැයි පැවසූ අනුර දිසානායක සහෝදරයා රටේ ආර්ථික අර්බුදයේ ගැඹුර තවදුරටත් තීව්‍ර වෙමින් ඇති බව පෙන්වා දුන්නේය.

"ආණ්ඩුව අද රටේ ජනතාවගේ ප්‍රශ්න නොසලකා කටයුතු කරනවා. රටක ආර්ථික වර්ධනයේදී ආණ්ඩුවක ස්ථාවරත්වය ඉතා වැදගත්. මේ වනවිට රුපියල කඩා වැටී තිබෙනවා. කොටස් වෙළඳපොළේ අර්බුද පැන නගිමින් තිබෙනවා. විදේශ ආයෝජන රට තුළට කැඳවාගත නොහැකි තත්වයක් ඇතිවී තිබෙනවා. මේ වනවිට රැකියා විරහිත උපාධිධාරීන් පමණක් 50,000කට ආසන්න ප්‍රමාණයක් රට තුළ ඉන්නවා. රටේ වගා කළ යුතු කන්න 3-4ක් වගා කරගත නොහැකිව තිබෙනවා. අස්වැන්න මිලදී ගැනීමට ආණ්ඩුවේ කිසිදු වැඩපිළිවෙළක් නොමැතිව ගොවි ජනතාව පීඩාවට පත්වී තිබෙනවා. ඒ වගේම මහජනතාවට එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාමට නොහැකි ආකාරයෙන් ආහාර මිල ගණන් වැඩිවෙමින් තිබෙනවා." ඔහු ***15 වැනි පිටුවට***





**05 දේශපාලනයේ සැබෑ අර්බුදය...**



2015 ජනාධිපතිවරණයේදී එම බලවේග යහපත් පාලනයක් වෙනුවෙන් කළ කාර්යභාරය ඔවුන්ගේ...

**07 අයිතිකරුවෙකු නැති ආර්ථිකයේ...**



රටේ ඇති ප්‍රධානම අර්බුදය අගමැතිවරයෙකු තෝරා පත්කිරීම නොව ණය උගුලෙන්...

**11 මිනිසුන්ගේ චින්තනය...**



සමාජ විඥානය සමාජ ව්‍යාපාර විසින් සිදුකරනු ලබන මතවාදී හා අධ්‍යාපනික අරගලයක් මගින්ම...

**12 රාජ්‍ය බැංකුවලට වැටෙන...**




පැවති සහ පවතින ආණ්ඩුවල ප්‍රබලයින්ගේ මැදිහත් වීමෙනුත්, ඉහළ සිටින දූෂිත නිලධාරීන්ගේ...

සංවාදය.......................... 03
තරුණ.......................... 04
ආවර්ජනා.......................... 06
ජාත්‍යන්තර .......................... 08
විශේෂ.......................... 09
කාන්තා.......................... 10
වේදිකාව.......................... 13
විශේෂාංග.......................... 14

***යුක්තිගරුක දේශයක්!   සාධාරණ සමාජයක්!!   නිවහල් මිනිසෙක්!!!***

## සමාජ සාධාරණත්වය...

03 පිටුවෙන්



ආයතන 160කට ආසන්න ප්‍රමාණයක් තියෙනවා. ඉන් බොහොමයක දැන් පෙනෙන විදිහට රනිල්, මෛත්‍රී කණ්ඩායම් එක් වුවහොත් ඔවුනට හවුල් පාලන පිහිටුවන්නත් පුළුවන්. ඒ නිසා ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ වනවිට පෙනුමට තිබූ "මහා ජයග්‍රහණය" ඇත්තටම මහින්දලට නැහැ. අනෙක් අතට මේ ඡන්ද ප්‍රමාණය ඉදිරි මහමැතිවරණයකදී මෙලෙසම ලබා ගත්තත් මහින්ද පිලට පාර්ලිමේන්තුවේ ආසන 105ක්වත් ලබාගන්න බැහැ. පසුගිය මහමැතිවරණයේදී එ.ජා.ප.ය ඡන්ද ලක්ෂ 51කට ආසන්න ප්‍රමාණයක් ලබාගෙනත් මන්ත්‍රී ධුර ලැබුණේ 106යි. දැන් මහින්ද පිල ලක්ෂ 49ක් ලබාගෙන ආණ්ඩුවක් පිහිටුවීමට තරම් බහුතර මන්ත්‍රී සංඛ්‍යාවක් ලබාගන්නේ කොහොමද? ඒ නිසා මහින්ද ලැබුවායැයි කියන 'ජයග්‍රහණය' ඇත්තටම තිබෙන එකක් නෙමෙයි. අගමැති වෙන්න ඡන්ද ඉල්ලපු මහින්ද පිලට දැන් පාර්ලිමේන්තුවේ යළි විපක්ෂ නායකකම ඉල්ලීමට සිදුවීමෙන්ම ඔවුන්ගේ ඊනියා ජයග්‍රහණයේ මිථ්‍යාව මතුවී පේනවා. කොහොම වුණත් ඔවුන් ලද ඡන්ද සංඛ්‍යාව අපි අවතක්සේරු කළ යුතු නැහැ.

***නියමුවා:- මේ ඡන්දයෙන් පසු අපේ රටේ ඡන්ද දායකයාගේ හැසිරීම ගැනත් යම් විවේචනාත්මක අදහස් මතුවුණා. ඒ ගැන ඔබේ අදහස කුමක්ද?***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** ඇත්තටම විද්‍යාවේ, තාක්ෂණයේ දියුණුවත් සමග වඩාත් තාර්කිකව කල්පනාකොට කටයුතු කළ යුතු ජනතාව ඒ වෙනුවට වඩ වඩාත් අතාර්කිකත්වය තුළ, මිථ්‍යාවන් තුළ ගිලී යන තත්වයක් අප දකිනවා. ඒ වගේම ව්‍යාජ ප්‍රතිරූප මවාගෙන ඒවාට වන්දනාමාන කරන තත්වයකුත් තිබෙනවා. රාජපක්ෂ මේනියාව එහෙම එකක්. පසුගිය ඡන්දය පළාත් පාලන ඡන්දයක්. ඉන් කළ හැකිව තිබුණේත් කළ යුතුව තිබුණේත් තමන්ගේ ජීවිතයේ කටයුතු පහසුකර ගැනීම සඳහා තම කොට්ඨාසයට හොඳම මන්ත්‍රීවරයෙක් පත්කර ගැනීමට හා තම සභාවට හොඳ කණ්ඩායමක් පත්කර ගැනීමට ඡන්දය දීමයි. එහෙත් අපේ රටේ ඡන්ද දායකයන්ගෙන් බහුතරයකට ආසන්න ප්‍රමාණයක් ඒ වෙනුවට 'මහින්ද අගමැති' කිරීමට ඡන්දය දුන්නා. ඒක මොනතරම් අතාර්කික ක්‍රියාවක්ද? ඒත් එහෙම වුණා.

එහි බරපතළකම පිළිබිඹු වන උදාහරණ රැසක් තිබෙනවා. ඉන් ප්‍රධාන එක තමයි මහරගම නගර සභාව. එහි මහින්ද පිලේ නාමයෝජනා ලැයිස්තුව ප්‍රතික්ෂේප වුණාම ඔවුන් ස්වාධීන කණ්ඩායමක් සමග එකඟතාවයකට ආවා. එම ස්වාධීන කණ්ඩායමත් මැතිවරණ නීතියට අනුව නීති විරෝධියි. එහි සියලු අපේක්ෂකයන් මහරගම බල ප්‍රදේශයේ පදිංචිකරුවන් නොවෙයි. බහුතරයක් ගම්පහ දිස්ත්‍රික්කයේ අය. ඒ වගේම මැතිවරණ කොමිසම නිතර අවධාරණය කළා එම කණ්ඩායමේ අපේක්ෂකයන් වෙනුවට, ඊට පිටින් අයට මන්ත්‍රී ධුර දෙන්න බැහැ කියලා. ඒත් මේ කිසිවක් නොසලකා ඡන්ද දායකයා මහරගමදි ස්වාධීන කණ්ඩායම දිනවනවා. තවත් සමහර දිස්ත්‍රික්කවල සමහර කොට්ඨාසවලට තරග කළේ මහින්ද පිළේ අපේක්ෂකයන්, නීතියෙන් ප්‍රතික්ෂේප වී අපේක්ෂකත්වය අහෝසි වී තිබියදීත් එම කොට්ඨාසවලත් මහින්දගේ ලකුණට වැඩිපුර ඡන්ද ලැබී තිබෙනවා. ඉන් පැහැදිලිව පේනව අපේ රටේ ඡන්ද දායකයාගෙන් සෑහෙන ප්‍රමාණයක් රාජපක්ෂ උන්මාදයකට ගොදුරුවෙලා තමන් කර ඇත්තේ කුමක්ද කියා හෝ නොදැන ඡන්දය දෙන බව.

අපේ රටේ ජනතාව මේ වගේ තත්වයකට පත්වුණේ නිකම්ම නොවෙයි. පසුගිය වසර 40ක පමණ විවෘත ආර්ථිකය විසින් නිර්මාණය කළ සමාජ තත්වයන් තුළත් රාජපක්ෂවරු රට තුළ තම පාලන කාලය පුරා තහවුරු කළ දේශපාලන සංස්කෘතිය තුළත් කල්පනා කරන තර්ක කරන මිනිසුන් වෙනුවට, අන්ධ භක්තික අනුගාමිකයින් හදා තිබෙනවා. මේ තත්වයෙන් මිදීමට ජනතාවට ලොකු වගකීමක් තිබෙනවා. ඒ වගේම ජනතාව වෙනස් කිරීම සඳහා තවදුරටත් මැදිහත්වීමට අපි ඇතුළු ප්‍රගතිශීලී බලවේගයන්ටත් වගකීමක් තිබෙනවා.

නමුත් කනගාටුවට කරුණ වන්නේ, අපේ රට ජනමාධ්‍යයත්, සමහර උගතුන් යයි කියා ගන්නා අයත් සමහර ආගමික නායකයනුත් ජනතාව මේ මිථ්‍යාවේම ගිල්වා තැබීමට කටයුතු කිරීමයි. ඒ නිසා ජනතාව වෙනස් කිරීමේ අරගලය සරල නැහැ. දුෂ්කරයි. නමුත් එය කළ යුතුයි. එය කළ හැකියි.

***නියමුවා:- හොඳයි අවසාන වශයෙන් මේ ඡන්ද ප්‍රතිඵලය ජනතා විමුක්ති පෙරමුණේ අනාගත හා ඉදිරි අරමුණුවලට ක්‍රියාමාර්ගවලට බලපාන්නෙ කොහොමද? මේ තත්වය තුළ ජනතා විමුක්ති පෙරමුණේ ඉදිරි ක්‍රියාමාර්ග මොනවාද කියල අප දැනගන්න කැමතියි.***

***ටිල්වින් සිල්වා සහෝදරයා:-*** අපි පසුගිය කාලයේ 2020 මහමැතිවරණය ඉලක්ක කරගෙන දේශපාලන මධ්‍යස්ථානයක් ගොඩ නැගීමේ අරමුණින් කටයුතු කළා. මේ ප්‍රතිඵලය විසින් එම ඉලක්කය අහෝසි කර නැතත් එයට අභියෝගයක් එල්ල කර තිබෙනවා. ඒ නිසා අපි එයට මුහුණ දිය යුතුව තිබෙනවා. මේ මොහොතේ බලනවිට අභියෝගයක් වන දේවල් තව ටික කලකින් වෙනස් වෙනවා. ඒක තමයි දේශපාලනයේ ස්වභාවය. ඒ නිසා අපි ඒ වෙනුවෙන් කටයුතු කරනවා.

කොහොම වුණත් අපේ රටේ මේ තිබෙන ඉතාම බරපතළ ආර්ථික හා සමාජ, දේශපාලන අර්බුදවලට ධනවාදී කිසිම පක්ෂයකට විසඳුම් නැහැ. ඒ නිසා මේ අර්බුදයට විකල්පය විය හැක්කේ, ජනතා විමුක්ති පෙරමුණට පමණයි. මේ ඡන්ද ප්‍රතිඵලයෙන් එය පෙන්වා තිබෙනවා.

අනෙක් අතට යළි රාජපක්ෂවරුන්ගේ දූෂිත පවුල් පාලනයක් බිහිවීමට සමාජයේ බහුතරය කැමති නැහැ. එය වැළැක්වීමේ දේශපාලන වුවමනාව, මහින්ද විරෝධී හා ප්‍රගතිශීලී බලවේග තුළ තිබෙනවා. එහිදී ඔවුන්ට ඒ සඳහා විශ්වාසය තැබිය හැකි එකම බලවේගය ජනතා විමුක්ති පෙරමුණ පමණයි. අනෙක් අතට 2015 ජනාධිපතිවරණයේදී මෙටර ජනතාවගේ බහුතරය අපේක්ෂා කළේ "සාධාරණ සමාජය" ගොඩ නැඟීමට වත්මන් ආණ්ඩුවේ බලවේග අසමත් වුණා. තවදුරටත් ඔවුන්ට එය ඉටුකළ නොහැකි බව තහවුරු වෙලා තිබෙනවා. රනිල් මෙන්ම මෛත්‍රීද ඒ සඳහා අසමත් බව ජනතාව දන්නවා. ඒ නිසා 'සාධාරණ සමාජයක්' ගොඩ නැඟීමට තවමත් කැමති, ඒ සඳහා උත්සාහ කරන සමාජ බලවේගයන්ට ඒ සඳහා දැන් තෝරාගැනීමට ඉතිරිව තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණයි. තනි වචනයෙන් කිවහොත් ලංකාවේ නිර්මාණය විය හැකි ප්‍රජාතන්ත්‍ර විරෝධී මර්දනකාරී, දූෂිත පාලනය වැළැක්වීමට හා සාධාරණ සමාජයක් ගොඩනැඟීමට එ.ජා.ප.යට මෙන්ම මෛත්‍රීටත් බැහැ. එය කළ හැක්කේ, ජනතා විමුක්ති පෙරමුණට පමණක් බව දැන් තහවුරු වී අවසන්.

මේ තත්වය තුළ ප්‍රජාතන්ත්‍රවාදය ගැන, සමාජ සාධාරණත්වය ගැන, විශ්වාස කරන බලවේග ඒකාරාශී කරගත් දේශපාලන මධ්‍යස්ථානයක් ගොඩනැඟීමේ හා එහි නායකත්ව කාර්යභාරයක් දැරීමේ ඉඩකඩ අප හමුවේ විවර වී තිබෙනවා. අපේ මාවත දැන් පැහැදිලියි; නිරවුල්. ඉතින් අප එම මාවතේ ගමන් කළ යුතුයි. ඒ අතරම මේ පවතින දුර්වල පාලනයේ ප්‍රතිවිරෝධයන් උපයෝගී කරගෙන ජනතාව වෙත ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ලබාගැනීමට අප කටයුතු කළ යුතුයි. එහිදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරගැනීම මූලික වෙනවා. ඒ නිසා එක් අතකින් බිමේ පංති සටන්වලට නායකත්වය දෙමින්, අනෙක් අතට ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් දිනාගනිමින්, දිගුකාලීනව රට වෙනස් කිරීමේ අරමුණ සහිතව සමාජ සාධාරණත්වය විශ්වාස කරන බලවේග එකතුකර ගනිමින් එවැනි මධ්‍යස්ථානයක් ගොඩනැඟීමට අප කටයුතු කළ යුතු වෙනවා. මේ මොහොතේ අපේ වගකීමත්, කාර්යයත් වන්නේ එයයි.

# එතෙරින්...

## වැලිකතරේ කලා උළෙල අභිමානවත්ව



කුවේට්හි එතෙර අපි ශාඛාව සංවිධානය කළ "වැලිකතරේ ලාංකීය සිත්තම" කලා උළෙල අභිමානවත් ලෙස කුවේට්හි නවාලි බොයිස් ස්කවුට් ශාලාවේදී 2018 පෙබරවාරි 16 දිනය පුරා පැවැත්විණි. මාස කිහිපයක් පුරා නර්තන, චිත්‍ර, ගද්‍ය, පද්‍ය, කෙටි නාට්‍ය, රචනා, තරග පවත්වන ලද අතර ළමා සහ විවෘත අංශය ලෙස පැවැති ඇගයීම් සඳහා සහතික සහ කුසලාන සම්මාන පිරිනමන ලදී. අවසන් මහා කලා උත්සවය නර්තන ගායනා වශයෙන් විචිත්‍ර වූ අතර ප්‍රධාන ආරාධිතයින් ලෙස 'එතෙර අපි' සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාද කලා උළෙල සඳහා කලා ශිල්පී, මිත්‍ර කපුගේ, ප්‍රවීණ නාට්‍ය ශිල්පී චන්ද්‍රසෝම බිංදුහේවා, මඩකලපුව විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය කථිකාචාර්ය කාලිදාස් මුණියන්ඩි සහ ප්‍රවීණ කලා ශිල්පී ප්‍රේමරත්න තෙන්නකෝන්ද සහභාගි වූහ.

## මැතිවරණයට ජ.වි.පෙ. විදෙස් කමිටු සහය



පසුගියදා පැවති පළාත් පාලන මැතිවරණයට සමාන්තරව ජනතා විමුක්ති පෙරමුණේ විදේශ අංශය විසින් රටවල් රැසක වාසය කරන ශ්‍රී ලාංකිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් සංවිධානය කර තිබුණි. ඒ අතර ජනහමු, පත්‍රිකා බෙදීම සහ කර්මාන්ත ශාලා - වැඩපළ මට්ටමින් දැනුවත් කිරීම් සංවිධානය කර තිබුණි. රෝමයේ මිලානෝ සහ කටාර්හි දොහාවල එවැනි දැනුවත් කිරීම් සිදුවිය.

## මහාචාර්ය රාජ් සෝමදේව කටාර් සංචාරයක




එතෙර අපි කටාර් ශාඛාව සංවිධානය කල ශ්‍රී ලංකාවේ ඉතිහාසය පිළිබඳව මහජන දේශනයක් කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේවයන් විසින් ජනවාරි 19 දින කටාර්හි හොටෙල් ප්ලාස්හිදී අති සාර්ථක ලෙස සිදු කරනු ලැබීය. එම දේශනය සඳහා කටාර්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින් විශාල පිරිසකගේ සහභාගිත්වය පැවති අතර ඊට අමතරව රාජ් සෝමදේවයන් විසින් කටාර්හි විශේෂ ඓතිහාසික ස්ථාන නැරඹීමටද එක්විය.

## බිමල් - හඳුන් රටවල් රැසක රැස්වීම්වල



පළාත් පාලන මැතිවරණයෙන් පසු " පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵල සහ රටේ අනාගතය" මැයෙන් දේශපාලන සාකච්ඡා රැසක් එක්සත් රාජධානියේ, ස්වීඩනයේ, ප්‍රංශයේ සහ ඩෙන්මාර්කයේ පැවැති අතර ඒ සඳහා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික බිමල් රත්නායක සහ සුනිල් හඳුන්නෙත්ති සහෝදරවරු සහභාගි වූහ. මෙම රැස්වීම්වලදී මැතිවරණ ප්‍රතිඵලයෙන් පසු රටේ ඇතිවන දේශපාලන අර්බුදය හමුවේ ජ.වි.පෙ. ක්‍රියාමාර්ග පිළිබඳව දීර්ඝ ලෙස අවධානයට යොමුකර ඇත.

## COPE වැඩමුළුවකට බිමල් - හඳුන් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කෝප් (පොදු ව්‍යාපාර - පිළිබඳව කාරක සභාව) කමිටුවට බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙන් ලැබුණු ආරාධනාවකට අනුව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මූල්‍ය පාලනය පිළිබඳ දෙදින වැඩමුළුවක් සඳහා බිමල් රත්නායක සහ කෝප් සභාපති සුනිල් හඳුන්නෙත්ති සහෝදරවරුන් පසුගියදා සහභාගි වූහ. මෙහිදී බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවට සමාන්තර මූල්‍ය පාලනයට අදාළ කමිටු සැසිවාර සඳහා සජීවී ලෙස සහභාගි වීමටද එම ප්‍රායෝගික පුහුණු සැසිවාරයන්හිදී එම සහෝදරවරුන්ට අවස්ථාව ලැබී ඇත.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## පාර්ලිමේන්තු නාඩගම්වලින් වැසී ගිය ආර්ථික අර්බුදයේ අනතුර...

පසුගිය දිනවල ලංකාවේ දේශපාලනයේ ප්‍රධාන අර්බුදය ලෙසත්, සංවාදයට ලක්වුණ ප්‍රධාන කරුණු ලෙසත් පැවතියේ හවුල් ආණ්ඩුව දිගටම පවතීද, මහින්ද 'අගමැති' වෙයිද, රනිල්ට අගමැතිකම අහිමි වෙයිද වැනි කරුණුය. හවුල් ආණ්ඩුව දිගටම පැවතියද, පාර්ලිමේන්තු අර්බුදය හා ආණ්ඩුවේ අභ්‍යන්තර අර්බුදය පිළිබඳ 'ඇඟ කිළිපොලා යන' පුවත් තවමත් හිඟ නැත. එහෙත් මෙම පුවත්වලින් සැඟව ගිය සැබෑ අර්බුදයක් රට තුළ පවතී. ඒ ලංකාව රටක් ලෙස මුහුණ දී සිටින ඉතාම බරපතළ ආර්ථික අර්බුදයය.

දන්නා කාලයක සිට ලංකාවේ ආර්ථිය තුළ වත්කම් උපයන, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය පවතින්නේ ඉතාම දුර්වල මට්ටමකය. බලයට පත් ධනවාදී ආණ්ඩු කෝටි ගණනින් ණය ලබාගෙන 'ආර්ථික සංදර්ශන' පෙන්වුවද ආර්ථික සංවර්ධනය සිදුවූයේ නැත. ලංකාවේ ආර්ථිකය තුළ නව ආදායම් මාර්ග නිර්මාණය කිරීමට ඔවුහු අසමත් වූහ. තවමත් ලංකවේ ආර්ථිකය යන්තමින් හෝ රඳා පවතින්නේ, යටත්විජිතවාදීන් විසින් හඳුන්වා දුන් වැවිලි ආර්ථිකය (තේ, රබර්, වැනි) මත හා විදේශ රැකියා, සංචාරක ව්‍යාපාරය වැනි අස්ථාවර ක්ෂේත්‍ර මතය. ලංකාවේ ආදායම් මාර්ග වර්ධනය නොවුණද වියදම් මාර්ග දිනපතා වර්ධනය වෙමින් පවතී. විදේශ වෙළඳාම පවතින්නේ, සියයට සියයක පාඩුවක් මතය. මේ ගැටලුව විසඳීමට ලංකාවේ සියලුම පාලකයින් අනුගමනය කළ විසඳුම වූයේ හැකි තරම් ණය ගැනීමය. එහි අවසන් ප්‍රතිඵලය වී ඇත්තේ, ලංකාව ණය අර්බුදයක හා ණය උගුලක පැටලී ආර්ථිකය අනතුරුදායක මට්ටමකට පැමිණීමය.

පසුගිය පෙබරවාරි 07වැනිදා ලංකාවේ විගණකාධිපතිවරයා විසින් මාධ්‍ය හමුවක් පවත්වා ණය අර්බුදයේ තරම හෙළිකළ අතර එම මාධ්‍ය සාකච්ඡාව විශාල ආන්දෝලනයකටද හේතු විය. මෙහිදී විගණකාධිපතිවරයා ප්‍රකාශ කළ බරපතළම කරුණ වූයේ ලංකාවේ සැබෑ ණය ප්‍රමාණය වයිමාට තබා වයිමාගේ පුතාටවත් කිව නොහැකි බවය. ඉන් පෙන්නුම් කරන්නේ පසුගිය පාලනයන් 'පාලනයකින් තොරව' නිශ්චිත ක්‍රමවේදයකින් තොරව හිතූ හිතූ ලෙස ණය ගෙන ඇති බව හා ගත් ණය කොපමණදැයි ගණන් බැලීමට පවා නොහැකි වී තිබෙන බවය. ඒ පසුගිය කාලයේ මහ බැංකුවට අමතරව වෙනත් රාජ්‍ය බැංකු හා රාජ්‍ය ආයතන විසින්ද ණය රැගෙන තිබෙන නිසාය. ඒ අනුව ලංකාව සිරවී සිටින්නේ, 'ගණන් මිනුම් නැති' ණය උගුලකය. විනයකින් තොරව ණය ගැනීම ඊට හේතුවය.

විගණකාධිපතිවරයා දන්නා මහ බැංකු වාර්තාවලට අනුව පසුගිය 2017 වසරේ නොවැම්බර් 30 වනවිට ලංකාව ගෙවිය යුතු ණය ප්‍රමාණය රු. ට්‍රිලියන 10.3ක් වී ඇත. (ට්‍රිලියන 1ක් යනු බිලියන 1,000කි.) එනම් ලංකාවේ ණය ප්‍රමාණය රු. බිලියන 10,000 ඉක්මවා යාමකි. වත්මන් හවුල් පාලනය පිහිටුවීමෙන් පසු 2016දී අගමැතිවරයා පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරමින් කියා සිටියේද ලංකාවේ සමස්ත ණය ප්‍රමාණය රු. බිලියන 10,500 ඉක්මවා යන බවය. එය ගෙවා දැමීමට 'තිත්ත කසාය' බීමට සූදානම් වන ලෙස ජනතාවටද දැන්වූ අගමැතිවරයා බදු වැඩිකරමින් ජනතාවට 'තිත්ත කසාය' පෙවීය. එහෙත් ඉන් ණය අඩුවූයේ නැත. මන්ද මෛත්‍රී-රනිල් හවුල් පාලනයද දිගින් දිගටම ණය ගැනීම කළ නිසාය.

අනෙක් අතට මේ තරම් විශාල ණය බරක් දරන රටේ වත්කම් පිළිබඳවද විගණකාධිපතිවරයා කරුණු හෙළිකර තිබුණි. ඔහු පවසා තිබුණේ 2010.12.31 හඳුනාගෙන ගිණුම්ගත කර තිබෙන වත්කම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 1.1ක් හෙවත් රු. බිලියන 1100ක් බවය. ගත් ණයවලට සිදුවූයේ කුමක්ද යන පැනය මතුවන්නේ එහිදීය. එසේම මුදල් අමාත්‍යාංශයේ ලේඛනවලට ඇතුළත් නොවූ හඳුනාගත් ණය ප්‍රමාණය රු. බිලියන 826ක් බවද ඔහු ප්‍රකාශ කර තිබුණි. ඉන් අනියමින් කියවෙන්නේ, 'හඳුනා නොගත් ණය'ද පවතිය හැකි බවය. එය සත්‍ය වන්නේ, මහ බැංකුවට අමතරව ආණ්ඩුවේ විවිධ ආයතන හිතුණ විදිහට ණය ගෙන තිබෙන නිසාය. රටේ මූල්‍ය විනයක් නොතිබීම ඊට හේතුවය. ගත් ණය හොරකම් කර හෝ නාස්ති කර ඇති අතර දැන් මේ ණය කන්ද රටවැසියාගේ හිස මතට පාත්වී තිබේ.

මීළඟ බරපතළ ප්‍රශ්නය වන්නේ, මෙම ණයවලින් බොහොමයක් වැඩි පොලී කෙටිකාලීන ණය වීමය. සමහර ණය මේ වසරේ හා ඉදිරි වසරේ කල් පිරෙන බවද පවසෙයි. එනම් පොලිය හා වාරික ලෙස නොව ඉතිරි සමස්ත ණය මුදලම ගෙවා දැමීමට සිදුවන ණය රැසක් ඉදිරියේ තිබේ. එම ණය ගෙවන්නේ කෙසේද? ඒ සඳහා රට තුළ වත්කම් නැත. එවිට පිළිතුර වන්නේ යළි යළිත් ණය ගැනීමත් රාජ්‍ය ආයතන විකුණා දැමීමත් ජනතාව මත බර පැටවීමත්ය. එවිට ණය අර්බුදය විසඳෙනවා වෙනුවට එය උග්‍ර අර්බුදයක් වේ. ලංකාවේ විදේශ වත්කම් ණය වාරික හා පොලී ලෙස පිටට ඇදී යාම නිසාත් විදේශ වෙළඳාමේ පාඩුව නිසාත් ලංකාව විදේශ වත්කම් අර්බුදයකටද මුහුණ පා තිබේ. එහි ප්‍රතිඵලය වී ඇත්තේ රුපියල අවප්‍රමාණය වීමය. ගිය වසරේ අග ඇමරිකන් ඩොලර් 1කට සාපේක්ෂවව රුපියලේ වටිනාකම රු. 139-140 පැවති රුපියල මෙම වසරේ පෙබරවාරි අග වනවිට ඩොලරයකට රු. 157දක්වා කඩා වැටී තිබේ. එහි ඊළඟ ප්‍රතිඵලය වන්නේ ආනයනික භාණ්ඩවල මිල ඉහළ යාමය. එසේම ණය සඳහා ගෙවිය යුතු රුපියල් වටිනාකම වැඩිවීමය. මේ අනුව ලංකාවේ ආර්ථිකය තුළ ණය අර්බුදය යනු පිපිරීමට ලංව පැසෙමින් තිබෙන ගිනි කන්දක් වැනිය. එහෙත් ඛේදවාචකය වනුයේ එය නොදන්නා සේ පාලකයින් එම ගිනිකන්ද මත දේශපාලන නාඩගම් පෙන්වීමත් මෙරට බහුතර ජනයා ඒවා නරඹමින් 'රජවරුන්ට' 'කුමාරවරුන්ට' මෝහනය වී සිටීමත්ය.

# සමාජ සාධාරණත්වය වෙනුවෙන් කැපවන බලවේගයන්ට තෝරාගැනීමට ඉතිරිව ඇත්තේ ජ.වි.පෙ. පමණයි



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්
ටිල්වින් සිල්වා සහෝදරයා

***නියමුවා:- පළාත් පාලන ඡන්ද ප්‍රතිඵලය ගැන විවිධ විග්‍රහ පළවුණා. මේ ප්‍රතිඵලය පිළිබඳව ඔබ පක්ෂය සෑහීමකට පත් වෙනවාද?***

*ටිල්වින් සිල්වා සහෝදරයා:-* අපි පළාත් පාලන ඡන්ද ප්‍රතිඵලය හොඳින්ම අධ්‍යයනය කළොත්, එය මීට පෙර ඡන්ද ප්‍රතිඵල සමග සංසන්දනය කළොත් පැහැදිලිවම ජනතා විමුක්ති පෙරමුණට ජයග්‍රහණයක් තියෙනවා. අපේ ඡන්ද ප්‍රමාණය 2015 මහ මැතිවරණයේදී ලබාගත් ඡන්ද 5,43,944 සමග සසඳා බලනවිට එය මෙවර 7,12,428 දක්වා ඡන්ද 1,68,484ක වැඩිවීමක් පෙන්නුම් කරනවා. ඡන්ද ප්‍රතිශතය 2015 දී 4.87% සිට මේ ඡන්දයේදී 6.3% දක්වා වැඩිවී තිබෙනවා. අපේ මන්ත්‍රී සංඛ්‍යාව 2011 තිබුණේ 74යි. එය මෙවර 434 දක්වා වැඩිවෙලා. ඒ අනුව අපට ජයග්‍රහණයක් තියෙනවා. නමුත් මැතිවරණය පැවති දේශපාලන වටපිටාවේ පැවති තත්වයට අනුවත්, අපේ මැතිවරණ ව්‍යාපාරයේදී අප කළ මැදිහත්වීමට අනුවත් මීට වඩා වැඩි ප්‍රතිඵලයක් අපි බලාපොරොත්තු වුණා. අපි බලාපොරොත්තු වූ එම ප්‍රතිඵලය අපට ලැබුණේ නැහැ. ඒත් ලැබී ඇති සතුටුදායක ප්‍රතිඵලය තුළ ඉදිරියට යෑමට අපට හැකිව තිබෙනවා. එය අපේ ඉදිරි දේශපාලන කටයුතුවලට ශක්තියක්.

***නියමුවා:- මෙම ඡන්ද ප්‍රතිඵලය සමග රට තුළ දේශපාලන අර්බුදයක්ද නිර්මාණය වුණා. සමහර පක්ෂ දිනුවා. සමහරු පැරදුනා. මෙම ඡන්ද ප්‍රතිඵලය විසින් දෙන දේශපාලන පණිවුඩය කුමක්ද?***

*ටිල්වින් සිල්වා සහෝදරයා:-* මෙම ඡන්ද ප්‍රතිඵලය විසින් පරාජය කරනු ලැබ තිබෙන්නේ ආණ්ඩුව; විශේෂයෙන් එහි ලොකු පංගුව නියෝජනය කළ එ.ජා.ප.ය. 2015 මහ මැතිවරණයට සාපේක්ෂව එ.ජා.ප.යේ ඡන්ද 50,98,927 සිට 36,12,259 දක්වා දළ වශයෙන් ලක්ෂ 15කට ආසන්න ප්‍රමාණයකින් අඩුවෙලා තිබෙනවා. ඡන්ද ප්‍රතිශතය 45.66% සිට 32.63% දක්වා අඩුවෙලා. ඒ වගේම ජනාධිපතිවරණයේදී ලක්ෂ 62ක් ලබාගත් මෛත්‍රීපාල ජනාධිපතිවරයා නායකත්වය දුන් පක්ෂයට ලබාගත හැකිව තිබෙන්නේ ඡන්ද 14,81,656ක් තරම් ප්‍රමාණයක් විතරයි. ඒ අතර ජ.වි.පෙ.ට අමතරව මහින්ද කණ්ඩායම ඡන්ද ප්‍රමාණයක් වැඩිකරගෙන තිබෙනවා. ඔවුන් 2015 සන්ධානය ලෙස ඡන්ද 47,32,669ක් ලබා තිබූ අතර, මෙවර මහින්ද කණ්ඩායම ඡන්ද 49,41,952 ලබාගෙන තිබෙනවා. එහෙත් ඔවුන්ගේ ඡන්ද ප්‍රතිශතය තවම පවතින්නේ, 44.65% මට්ටමක. මහින්ද රාජපක්ෂ 2015 ජනාධිපතිවරණයේදී ලබාගත් ඡන්ද 57,68,000ක් වූ ප්‍රමාණයට ආසන්න වෙන්න බැරිවෙලා තිබෙනවා.

මේ ප්‍රතිඵල අනුව ඉතාම පැහැදිලි කාරණය වර්තමාන ආණ්ඩුව ජනතාව විසින් ප්‍රතික්ෂේප කර තිබීමයි. ජනතාව එ.ජා.ප.ය ප්‍රතික්ෂේප කර ඇති අතර ඒ සඳහා විකල්පය ලෙස කිසිවෙකු තවම තෝරාගෙන නැහැ. එ.ජා.පෙ. අඩුවූ ඡන්ද ලක්ෂ 15න් යම් ප්‍රමාණයක් මෛත්‍රීටත්, යම් ප්‍රමාණයක් අපිටත්, සුළු ප්‍රමාණයක් මහින්දටත් ලැබී ඇති බව පේනවා. ජනතාව එ.ජා.ප.ය ප්‍රමුඛ ආණ්ඩුව ප්‍රතික්ෂේප කිරීමේ හේතුව ඉතා පැහැදිලියි. ගෙවුණු වසර තුන තුළ ජනතා අපේක්ෂා ඉටුකිරීමට ආණ්ඩුව අසමත් වුණා. වංචා, දූෂණ නැවැත්වීම වෙනුවට බැඳුම්කර හොරකමට අහුවුණා. පසුගිය ආණ්ඩුවේ මහාපරිමාණ දූෂණ හා හොරකම්වලට දඬුවම් දුන්නේ නැහැ. ඒ වගේම ආර්ථිකය බිඳවැටුණා. ජනතාවගේ ජීවන බර වැඩි වුණා. පසුගිය වසර තුන පුරාම ආණ්ඩුව තුළ මෛත්‍රී හා රනිල් තම අනාගත බලය ගැන සිහින දකිමින් ඒ වෙනුවෙන්

> "යළි රාජපක්ෂවරුන්ගේ දූෂිත පවුල් පාලනයක් බිහිවීමට සමාජයේ බහුතරය කැමති නැහැ. එය වැළැක්වීමේ දේශපාලන වුවමනාව, මහින්ද විරෝධී හා ප්‍රගතිශීලී බලවේග තුළ තිබෙනවා. එහිදී ඔවුන්ට ඒ සඳහා විශ්වාසය තැබිය හැකි එකම බලවේගය ජනතා විමුක්ති පෙරමුණ පමණයි."

කටයුතු කළා මිස ජනතාවගේ වුවමනාවන් සඳහා කටයුතු කළේ නැහැ. එය තුළ කිසියම් අරාජික තත්වයක් නිර්මාණය වුණා. එහි ප්‍රතිඵලය වුණේ ජනතාව ආණ්ඩුවේ ඡන්ද අඩුකොට ආණ්ඩුවට පාඩමක් ඉගැන්වීමයි. දැන් ඉතා පැහැදිලියි ජනතාව ආණ්ඩුව ප්‍රතික්ෂේප කර තිබෙනවා.

***නියමුවා:- ඔව්, ඒත් ඉන් කියැවෙන්නේ නැවත විකල්පය බවට පත්වන්නේ මහින්ද රාජපක්ෂ කණ්ඩායම කියන එකද? මහින්දගේ ඡන්ද වැඩිවීම ගැන ඔබේ විග්‍රහය කුමක්ද?***

*ටිල්වින් සිල්වා සහෝදරයා:-* අපි හොඳින්ම විග්‍රහකරලා බැලුවම පෙනෙන එකක් තමයි, ආණ්ඩුවේ පරාජය විසින් මහින්ද කණ්ඩායම උඩට මතුව පෙනුණාට ඔවුන්ට අලුත් ජයග්‍රහණයක් ලැබී නැති බව. පසුගිය අවුරුදු තුන පුරා ආණ්ඩුව පෙන්වූ අසමත්කම තුළ රාජපක්ෂවරුන්ගේ 2015 ඡන්ද පදනම වෙනස් නොවී පැවතුණා. මේ ඡන්දයේදී එයට තව ඡන්ද සුළු ප්‍රමාණයක් එක්ව තිබෙනවා. නමුත් එය විශාල ජයග්‍රහණයක් නොවෙයි. මහින්ද පිල 2015 ජනාධිපතිවරණයේදී ලබාගත් ඡන්ද ප්‍රමාණය ලබා ගැනීමට හෝ ඒ අසලට ළඟාවීමටවත් බැරිවෙලා තිබෙනවා. ඒ නිසා මහින්ද පිලට අලුත් ජයග්‍රහණයක් ලැබිලා නැහැ. ආණ්ඩුවේ අසමත්කම, ආණ්ඩු විරෝධය නිසා ආණ්ඩුව දුර්වලවීම තුළ රාජපක්ෂ පිල ඉහළට එසවී පෙනෙන්න පටන් අරගන තිබෙනවා. ආණ්ඩු විරෝධය සමග ආණ්ඩුව අත්හල ජනතාව ඒ වෙනුවට තවම නියමිත විකල්පය තෝරාගෙන නැහැ. ඔවුන් සිදුකර තිබෙන්නේ, ආණ්ඩුව ප්‍රතික්ෂේප කිරීම පමණයි. ඡන්ද ප්‍රතිඵලය තුළ මහින්ද පිල මහා ජයක් ලද්දාසේ පෙනුණට ප්‍රායෝගිකව ඒක එහෙම වෙන්නෙ නැහැ. ඔවුන්ට තනිවම බලය පිහිටුවන්න බැරි පළාත් පාලන

**02 වැනි පිටුවට**






# තරුණයන් සාම්ප්‍රදායෙන් ඔබ්බට රැගෙන යමු

ගෙවීගිය සමයේ අප කාගේත් අවධානයට යොමුවූ කරුණ නම් පෙබරවාරි 10 වැනිදා පැවැති පළාත් පාලන මැතිවරණයයි. අප කවුරුත් දන්නා පරිදි සාතිශය බහුතර පළාත් පාලන ආයතන සංඛ්‍යාවක බලය ඒවායේ පෙර සිටි කණ්ඩායම් අතට ලැබී තිබේ. මෙහිදී දක්නට ලැබෙන විශේෂ කරුණක් නම් පළාත් පාලන ආයතන විෂය නොතකා හරිමින් ඡන්දදායකයා කටයුතු කර ඇති ආකාරයක් නිරීක්ෂණය වීමයි. හවුල් ආණ්ඩුවේ පැවති කුලල් කා ගැනීමත්, ජනතාවට වූ පොරොන්දුවලට පයින් ගසා තිබීමත්, ආර්ථික පීඩනයත් විසින් ජනතාව දැඩි ආණ්ඩු විරෝධී තත්වයකට තල්ලු කර දමා ඇති බව එක් අතකින් මැතිවරණ ප්‍රතිඵලය පෙන්නුම් කරයි. ඒ අතරම මැතිවරණ ව්‍යාපාරය තුළ පටු පසුගාමී, ආගම්වාදී, ජාතිවාදී මෙන්ම ව්‍යාජ දේශප්‍රේමීත්වයක් ප්‍රදර්ශනය කළ හිටපු ජනාධිපතිවරයා නියෝජනය කළ පාර්ශ්වය වෙත ජනතාව ඇදී යාමක්ද ඒ තුළ පෙන්නුම් කරයි. කෙසේ නමුත් 2015 පැවති මහමැතිවරණයට සාපේක්ෂව බලන කල මෙම රාජපක්ෂ පාර්ශ්වය ඡන්ද වැඩිකරගෙන ඇත්තේ ලක්ෂ දෙකක පමණ ප්‍රමාණයකි. 2015 ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතා ලබාගත් ඡන්ද අනුව බලන විට එය ඡන්ද ලක්ෂ 08ක පමණ අඩුවීමකි.

මැතිවරණ ව්‍යාපාරය තුළ සැබෑ අර්ථයෙන් වෙනසක් වෙනුවෙන් කටයුතු කළ ජනතා විමුක්ති පෙරමුණ වංචාවෙන්, දූෂණයෙන්, නාස්තියෙන් පිරුණු සාම්ප්‍රදායික ක්‍රමය වෙනස් කිරීම උදෙසා විකල්පය වෙමින්, විවිධ ක්ෂේත්‍රයන්ගේ නිපුණතාවයන්ගෙන් පිරි උගත් තරුණ පිරිසක් නියෝජනය කළේය. එපමණක් නොව විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, වෙනත් ක්ෂේත්‍රයන්ගේ විද්වතුන්, රටේ ප්‍රසිද්ධ කලාකරුවන්, ආදී රටට ආදරය කළ විවිධ ක්ෂේත්‍රයන්ගේ උගත් පිරිස් රටේ ජනයා ඉදිරියේ විකල්ප තරුණ දේශපාලන කණ්ඩායමක් නියෝජනය කළ ජ.වි.පෙ. දිනවන ලෙස රටේ ජනතාවගෙන් ප්‍රසිද්ධියේම ආයාචනා කර සිටියහ. මෙහිදී ඡන්ද 715,000 ට ආසන්න ඡන්ද ප්‍රමාණයක්ද, රට පුරා උතුර නැගෙනහිර පළාත් දෙකද ඇතුළුව මන්ත්‍රී ධූර 434ට ආසන්න ප්‍රමාණයක් ජනතා විමුක්ති පෙරමුණ වෙත ලබා ඇත. එය 2015 මහමැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ ලබාගත් ඡන්ද ප්‍රමාණයට වඩා 168,000ක පමණ වැඩිවීමකි. ජවිපෙට කලින් පැවති පළාත්පාලන මන්ත්‍රීධූර 74 මෙවර 434ක් දක්වා ඉහළ ගොස් තිබෙන බවද සැබෑය.

නමුදු සාම්ප්‍රදායිකත්වය වෙනස් කිරීමට තවමත් එම ඡන්ද ප්‍රමාණය ප්‍රමාණවත් නොවන බව මෙකී ප්‍රතිඵලයෙන් නැවතත් නිරීක්ෂණය වන්නේය.

රටේ විශේෂ ස්ථරයක් වන තරුණයින්ගේ හැසිරීම අප විශේෂයෙන් සැලකිය යුතු වූවකි. එහිදීද අපට දක්කට ලැබුනේ රටේ සාමාන්‍ය පුරවැසියන් මෙන් ඔවුන්ද සාම්ප්‍රදායිකවම කල්පනා කර ඇති බවයි. මෙවර මැතිවරණයේදී නවක තරුණ ඡන්ද ලක්ෂ හයකට අධික සංඛ්‍යාවක් පැවතුණද එකී තරුණ ජන්ද වැඩි ප්‍රමාණයක්ද සාම්ප්‍රදායික පවතින රැල්ලට හසුව ජාතිවාදීව හෝ පොරොන්දු දේශපාලනයට මෙන්ම මැතිවරණ අල්ලසට යටව ජන්දය භාවිතා කර ඇති ආකාරයයි.

විශේෂයෙන් රටේ තරුණ බලවේගය තුළ විකල්ප දේශපාලන ක්‍රියාකාරීත්වයක නියැලෙන ජනතා විමුක්ති පෙරමුණේ සමාජවාදී තරුණ සංගමය වන අප විශේෂයෙන් අවධාරණය කර ගත යුතු කරුණ නම් රටේ තරුණ ප්‍රජාව සමඟ කාලයක් තිස්සේ විවිධ ක්‍රියාකාරකම්වල නියැලෙමින් තරුණයන් තුළ විකල්ප දේශපාලන මතවාදයක් ගොඩනැගීමට අරගල කළද අප තවම ඒ සඳහා සමත්ව නැති බවයි. විශේෂයෙන් නවක තරුණ ප්‍රජාව නියෝජනය කළ අලුත් ජන්ද තුළ විශේෂ බහුතර සංඛ්‍යාවක් දිනාගැනීමට අප අසමත්වීම තුළ එය නිරීක්ෂණය කළ හැකිය. තරුණයන් යනු සාම්ප්‍රදායිකත්වයෙන් මිදීමට වැඩි විභවයක් සහිත ප්‍රජාවක් වන නිසාවෙන්ම සමජවාදී තරුණ සංගමය ලෙස වෙනස් ක්‍රියාකාරකම්වලට යොමුවෙමින් නවක තරුණයා දිනා ගැනීමටත්, ඒ හරහා තරුණ ප්‍රජාව ක්‍රම විරෝධී විකල්ප මතවාදයක් වෙතට ගෙන ඒමේ කාර්යයට ඉතා ඉක්මනින් මැදිහත්වීමත් කළ යුතුව ඇත.

# වසරකට දිනයක් සිහිවන කාන්තාව

1857 වසරේ ඇමෙරිකාවේ නිව්යෝක් නුවර ඇඟළුම් කම්හලක සේවිකාවන් පිරිසක් තම සේවක අයිතින් හා උරුමය ඉල්ලා කළ පෙළපාලිය ලොව පුරා කම්කරුවන්ගේ මෙන්ම ධනපති පන්තියේ වඩාත් අවධානයට ලක් විය. 1910 ඩෙන්මාර්කයේ කෝපන්හේගන් නුවර පැවති දෙවන සමාජවාදී කාන්තා සම්මේලනයේ වූ යෝජනාවකින් 1857 අරගලය සිහිකර එම දිනය ජාත්‍යන්තර කාන්තා දිනය ලෙස ඉතිහාසයට එක් කෙරිණි. 108 වැනි කාන්තා දින සමරුව මෙම මාර්තු 08 වැනි දිනට යෙදී තිබෙනවා. වසරේ සෑම දිනයක්ම කුමක් හෝ සුවිශේෂී දිනයක් වන නමුත් ඒ සෑම දිනයක්ම ව්‍යාපාරිකයින්ගේ දිනයක් වීම ධනවාදයේ නිසඟ ලක්ෂණයකි. ආදරවන්තයින්ගේ දිනයට චොක්ලට් හා රෝසමල් මෙන්ම කුලී කාමර විකිණීමට දත මැදගෙන බලා සිටින ව්‍යාපාරිකයින් පිළිබඳව නොදක්නා කෙනෙක් නැත. කාන්තා දිනයද එවැනිම වූ තවත් එක් දිනයක්. විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හා සමාජ ජාල ඔස්සේ කාන්තා අයිතීන් පිළිබඳ කටමැත දොඩවන මහත්වරු, නෝනාවරු මල් හැදීම, කේක් හැදීම, ඇඳුම් මැසීම හා ආහාර පිසීම ගැන වැඩමුළු හා රූපවාහිනී වැඩසටහන් පවත්වති. කාන්තාව පිළිබඳ කප්පරක් මාතෘකා පසෙක ලා ධනේශ්වර මාධ්‍ය හා වෙළෙඳපොළ සෑම දිනයක් වාගේම කාන්තා දිනයද වෙළෙඳ දිනයක් බවට පත්කොට ගනිති.

ලෝකයේ නිෂ්පාදනයෙන් 2/3 ක් නිපදවන කාන්තාව ආර්ථික ඵලයෙන් ගනු ලබන්නේ 1/10 ක් පමණයි. අප රටේ තත්වය මීටත් එහා. රටේ ආර්ථිකයේ බර උසුලන ප්‍රධානම කුළුණු තුනෙහි ප්‍රමුඛයා කාන්තාවයි. විදේශ රැකියා ක්ෂේත්‍රයේ වසරකට උපයන ඩොලර් බිලියන 4.5 න් කස පහර, ගල් පහර, හා කෲර වධහිංසාවලින් අනතුරුව 60% ක ධනයක් මෙරටට ගෙන එන්නේ කාන්තාවයි. වැවිලි ක්ෂේත්‍රයේ මෙන්ම ඇඟළුම් ක්ෂේත්‍රයේ සාතිශය බහුතර නියෝජනය කාන්තාවයි. කාන්තාවගේ ලාභ ශ්‍රමය ප්‍රාග්ධන ආයෝජකයින්ගේ ලාභ ගොඩගසන්නට කෙතරම් දුක් කන්දරාවක් විඳින්නේදැයි ඇයට ද නොතේරේ.

ඒ අතර සමාජ, ආර්ථික, සංස්කෘතික පරිසරය තුළ දෙවන ශ්‍රේණියේ පුරවැසියෙකු බවට පත්කොට ඇය වැඩි කාලයක් නිවස තුළ බිත්ති හතරටත් කුස්සි මුල්ලටත් සිරකොට දරුවන් බලාගැනීම පමණක් නොව පෝෂණය කිරීමටද බල කෙරී ඇත. එපමණක් නොව දරුවන්ට වන අපචාර වලට ද වගකිවයුත්තා කාන්තාව ලෙස නම්කර එම අපරාධ කරන පිරිමින් නිදොස් කොට නිදහස් කිරීම සාධාරණීකරණය කරන සමාජයක් කාන්තාවට උරුම කොට තිබේ.

it’s a girl නම් වාර්තා චිත්‍රපටයේ ඉන්දියානු කාන්තාව තම දැරියන් ගණනාවක්ම මරා දමා වැළලීම පිළිබඳව කිසිදු හැඟීමකින් තොරව වාර්තාකරුට පෙන්වන හැටි අරුම පුදුම නොවන්නේ කාන්තාවක් සමාජය තුළ විඳින පීඩාවේ ප්‍රමාණය ගණනය කළ නොහැකි වීම නිසාය. පිරිමින් විසින් ගැහැණු දෙවිවරුන්ට වන්දනාමාන කරන රාජ්‍යයක බහුතර කාන්තාවන්ගේ ජීවිත ඛේදජනකය. දරුවන් ගංගාවලට හා කුණු බක්කිවල දමා යන මව්වරුන් ගැන කුණු රසට මාධ්‍යවල පතුරු ගැසූවත් ජාත්‍යන්තර සම්මුතිවලදීත් මානව හිමිකම් ගිවිසුම්වලදීත් පම්පෝරි ගැසූ පාලකයින්ට පවුලක් කුසගින්නේ මියයෑමට හේතුවන වගකීම නොපෙනෙන්නේද?

කාන්තාවක් වීම නිසාම ඉඩම් හා දේපළ අයිතියෙන් වෙන්කර තැබීමත් පිරිමින්ගේ භාරකාරත්වයේ සිටීමට සිදුවීමත්, එකම සමාජයක ඉපිද තමා කැමති ජීවිතය ගත කිරීමට නොහැකි වීමත් කාන්තාව අභ්‍යවකාශය දිනූ යුගයේ බලාපොරොත්තු විය යුතු තත්වයක් නොවේ.

කාන්තාව සෑමවිටම පිරිමින්ගේ ගොදුරක් යැයි ආකල්ප දරන සමාජයක කාන්තාවගේ ඇඳුමෙන් හා හැසිරීමෙන් ඇයව ලිංගික දූෂණයට පත්කිරීමට හේතුවක් කරගැනීම පුදුමයක් නොවේ. දිවියේ හොඳම කාලය ඇයට ලිංගික හින්සනයන්ගෙන් ගෙවීමට සිදුව ඇත්තේ ඇය කළ කුමන වරදකටද? තම වෘත්තීය ජීවිතය මෙන්ම වැටුප් තලය ආරක්ෂා කරගැනීමට ආයතන ප්‍රධානීන් සමග යහන්ගතවීමට සිදුවීම රටේ තරම කියපායි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ වාර්තා වලට අනුව ලංකාවේ පොදු ප්‍රවාහනයේ දී කාන්තාවන්ගෙන් 90%ක් අතවරයට ලක්වන බවට වාර්තා පළවී තිබේ. සීඩෝ සම්මුතියට අනුව රැකියාවල නිරත ලාංකේය කාන්තාවන්ට සමාන වැටුප් නොලැබෙන බවත් කාන්තාවන්ට පමණක් බලපාන නීති පවතින බවත් කියවේ.

පසුගිය කාලයේ සෞදි අරාබියේ කාන්තාවන් 14,000ක් තමන්ට පිරිමින්ගේ භාරකාරත්වයෙන් නිදහස්ව ජීවත්වීමට අයිතිය ඉල්ලා පෙත්සමක් අත්සන් කර රජයට භාරදීම පිළිබඳවත්, රියදුරු බලපත්‍රය ලබාගැනීමේ අයිතිය දිනාගැනීම පිළිබඳවත් ආන්දෝලනයට තුඩුදුන්නා. මෙතරම් ඛේදනීය තත්වයක් උදා වී තිබියදීත් කාන්තා අයිතීන් වෙනුවෙන් කරන අරගලවලදී ලොව අනෙක් රටවල් හා සසඳන කල වඩාත් පසුපසින් සිටින්නේ ලාංකේය කාන්තාවයි. ඇයගේ යදම් ඇයට ආභරණයක් දැයි හැඟෙන තරම්ම ඇය නිහඬය.

රටේ ජනගහනයෙන් 53%ක් කාන්තාවන්ය. ඡන්ද දායකයින්ගෙන් 56%ක් ද, විශ්වවිද්‍යාල සිසුන්ගෙන් 60%ක්ද, රාජ්‍ය සේවයේ 40%-50% ක්ද, පළාත් සභා රැකියාවල 60% ක්ද, ගුරු වෘත්තියේ 72%ක්ද, නියෝජනය කරන කාන්තාව රටේ ඉහළ තීරණ ගන්නා තැන්වල නියෝජනය අඩුවූයේ ඇයි? කාන්තා නියෝජනය ප්‍රාදේශීය සභාවල 4%ක්, නගර සභාවල 2%ක් හා පාර්ලිමේන්තුවේ 5%කි. පාර්ලිමේන්තුවේ ජාතික ලැයිස්තුව ද පිරිමි ලැයිස්තුවක්. 1956 දී ලැබූ පළමු කාන්තා කැබිනට් අමාත්‍ය ධූරයේ සිට අද දක්වාම කාන්තාවන් හිමිව ඇත්තේ ඇයටම ආවේණික වූ සෞඛ්‍ය, වනිතා කටයුතු, බුද්ධ ශාසන, සමාජ සේවා වැනි ඒවාය.

1937 දී අරගල කොට කාන්තාව ලබාගත් ඡන්ද අයිතියෙන් වසර 86 ක් ගතවන විටත් ඇයගේ දේශපාලන වගකීම අවබෝධ කොට නොදුන් ජඩ මාධ්‍ය, කාන්තාවන්ට කේක් කැවීමට කාන්තා දිනය පැමිණෙන තුරු නොඉවසිල්ලෙන් සිටී. කෙතරම් අභාග්‍යයක්ද?. පසුගිය මැතිවරණ සමයේද ප්‍රචාරක කටයුතුවල දී ඇතැම් ආගමික නායකයින් පවා කාන්තාවන්ට ඡන්දය ලබා නොදෙන්නැයි ප්‍රකාශකර තිබුණා.

අප රටේ කාන්තාවන්ගෙන් 10%ක් පමණ කුමන හෝ ආකාරයකින් ග්‍රාමීය නායකත්වයක් දරයි. එහෙත් රටේ තීරණ ගන්නා තැන්වල නායකත්වය දීමට පාලකයා බියවන්නේ හෝ මැලිවන්නේ ඇයි? පිරිමින්ට විවිධ ක්ෂේත්‍රවල කළ හැකි සියලු දේ ගැහැනියටද කළ හැකිය. ඒ සඳහා ඇයට නීතියේ සමාන රැකවරණයත්, ගෞරවයත්, සමාජ ආරක්ෂාවත් තහවුරු කළ යුතුය.

කාන්තා පීඩනය ධනවාදයේ පිඩාවේ තවත් පැතිකඩක් පමණි. කාන්තාවට නිසි තැන, නිසි ගෞරවය හා වගකීම් ලබා දීමට නිවසටත් දරුවන් බලාගැනීමටත් කොටුකර ඇති බැමි ලිහා ඇය ආර්ථිකයටත් සමාජයටත් විවෘත ලෙස පිරිමියාට නොදෙවෙනි අභියෝග හා වගකීම් භාරදීමත්, නිෂ්පාදනය හා ආර්ථිකය මෙහෙයවන්නියක් බවට පත් කිරීමත්, ලෝකයට ලාංකේය අභිමානය ගෙන යාමට ඇයට ඇති සමාජ, ආර්ථික, දේශපාලන, සදාචාර බාධාවන් ඉවත්කර නීති රීති හා සම්ප්‍රදායයන් වෙනස් කොට, කටු අකුල් බිඳ හෙළා, මඟහසර එළිපෙහෙළි කොට සකසා දිය යුතුය. එහෙත් මේ ගරාවැටෙන ධනපති දේශපාලනයෙන් නම් අබ මල් රොනක තරම් හෝ දෙයක්වත් බලාපොරොත්තු වීම කාලය කා දැමීමකි.

## මේ අසීරු මඟ

වතුර ඇදලා කළේ බින්දා..  
තව සියවසක්  
මාරු කරපන් මචං  
ඔය කළේ මැටිම තමයි...  
තියන තියන අඩියට  
මසුරන් නොපෑගුණාට  
නොදනීද..  
ඒ පියවරෙන්  
ලබන පන්නරය.  
පසුපසට අඩියක් තිබුවත්  
තියනවා තව  
උඩට අඩි දෙකක්.  
විශ්වාසයි..  
කෙදිනක වුව  
හිනිපෙත්තටම යන වග  
කෙතරම් දුෂ්කර වුවත්  
මේ අසීරු මඟ....

“කෙසේ වුවද වෘත්තියක් තෝරා ගැනීමේදී අපට මඟ පෙන්විය යුතු ප්‍රධාන මූලධර්මය නම් මනුෂ්‍ය සංහතියේ සුබසිද්ධිය සහ අපගේම පරිසමාප්තියයි. මෙම උත්සුකතාවන් දෙක එකිනෙක සමග ගැටෙන බව හෝ එකක් විසින් අනික වනසා දැමිය යුතු යයි හෝ නොසිතිය යුතුය. ඊට ප්‍රතිපක්ෂව, තම සමාජයේ පරිසමාප්තිය සහ සුබසිද්ධිය උදෙසා කටයුතු කිරීම මගින් පමණක්ම තමන්ගේම පරිසමාප්තිය සාධනය කරගත හැකි වන පරිදි මිනිසාගේ ස්වභාවය සැකසී ඇත.”

කාල් මාක්ස්

# ආදරයට කුලමල නැති දෑවැදි නැති මිලක් නැති හෙටක්

මෙවර වැලන්ටයින් දිනය නිමිත්තෙන් “ආදරයේ සීමා බිඳින්න එන්න” මැයෙන් වැඩසටහනක් පසුගිය පෙබරවාරි 14 දා කොටුව දුම්රියපළ ඉදිරිපිට දී සමාජවාදී තරුණ සංගමය විසින් පවත්වනු ලැබීය.. එහි විශේෂ අවස්ථා පහත ඡායාරූපවලින් දැක්වේ.












# දේශපාලනයේ සැබෑ අර්බුදය සඟවන විගඩම්

පළාත් පාලන මැතිවරණය අවසන්ව එහි ප්‍රතිඵල නිකුත්වීමත් සමඟ ලාංකේය දේශපාලනයේ කරළිගත වූ විගඩම් තවමත් අවසන්ව නැති බව පෙනේ. එම දේශපාලන විගඩම් නැරඹීමට ආශා කරන 'දේශපාලන රසිකයෝ' රැසක්ද රට තුළ සිටිති. එහෙත් ගැටලුව වන්නේ මෙම දේශපාලන විගඩම් හා බොරු සංදර්ශන නිසා රටේ සැබෑ දේශපාලන අර්බුදය හා දේශපාලන අභියෝග වැසී යාමය. අනෙක් අතට මෙම දේශපාලන විගඩම් පෙන්වන අයගේ අරමුණද සැබෑ දේශපාලන යථාර්ථයන් ජනතාවගෙන් සඟවා තැබීමය. මේ වනවිට රට, ජනතාවගේ මූලික අවශ්‍යතා සපුරාලීමට පවා නොහැකි විශාල ආර්ථික අර්බුදයකට ලක්ව තිබේ. එසේම ස්ථාවර ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට නොහැකි දේශපාලන අර්බුදයකටද රට ගොදුරු වී තිබේ. අනෙක් අතට ලංකාවේ දේශපාලන සංස්කෘතිය පිරිහී තිබෙන අතර මෙරට බහුතර ජනයා දේශපාලනික සවිඥානිකත්වයක් නැති, අතාර්කික හා දේශපාලනික ප්‍රතිරූප වන්දනා මාන කරන 'දේශපාලන බැතිමතුන්ගේ' තත්වයට පත්ව තිබේ. රට ඉදිරියේ ඇති අභියෝගය මෙම තත්වයන් වෙනස්කරලීම වුවත් සිදුවෙමින් පවතින්නේ, දේශපාලන සංදර්ශන පෙන්වීම හා ජනතාව ඒවා නරඹමින් සිටීම පමණි.

පළාත් පාලන මැතිවරණ ප්‍රතිඵලය ප්‍රකාශ වන විට මතුපිටින් සියලු දෙනාම කථාකළේ ආණ්ඩුවේ බරපතළ පරාජය හා රාජපක්ෂ කණ්ඩායමේ 'විශිෂ්ට ජයග්‍රහණය' ගැනය. වහාම පාර්ලිමේන්තුව විසුරුවාහළ යුතු බවටද අගමැතිවරයා ඉල්ලා අස්වී මහින්දට අගමැතිකම දිය යුතු බවටද මත පළ වූයේ එම තත්වය තුළය. එහෙත් අවසානයේ හවුල් ආණ්ඩුව වෙනස් වූයේවත් රනිල්ට අගමැතිකම අහිමිවූයේවත් මහින්ද අගමැති වූයේවත් නැත. කලින් තිබූ ලෙසම පරණ මෛත්‍රී-රනිල් හවුල් පාලනය දිගටම පවතින අතර අගමැති රනිල් වේ. අගමැතිකම ඉල්ලූ මහින්ද පසුව විපක්ෂ නායකකම ඉල්ලා එයද නොලැබී දැන් සුපුරුදු ලෙස මහින්ද රාජපක්ෂ පා.ම. ලෙස සිටී. එපමණක් නොව අඩු ගණනේ ආණ්ඩුව තුළ ජනාධිපතිවරයා විසින් සිදුකරනවා යයි කියූ විශ්මය දනවන ඇමති මණ්ඩල සංශෝධනයද පුස්ස බින්දා වැනි එකක් වී තිබේ.

ඉන් කියවෙන්නේ කුමක්ද? පවතින දේශපාලන අර්බුදයත් ධනපති පක්ෂවල දුබලතාවයත් විසින් කිසිවෙකුට දැන් දේශපාලනයේ ප්‍රාතිහාර්ය පෙන්වීමට නොහැකි බවය. ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශ වීමත් සමඟ රනිල් අගමැතිකමින් ඉවත් කිරීමටත් තනි ශ්‍රී ලංකා ආණ්ඩුවක් හැදීමටත් කථාකළ මෛත්‍රීපාල ජනාධිපතිවරයාට සිදුවූයේ රනිල් අගමැති ලෙස තබාගෙනම පරණ හවුල් ආණ්ඩුවේ සිටීමටය. එපමණක් නොව මහ බැංකු බැඳුම්කර වංචාවට නම සඳහන් වී ඇති රනිල් වික්‍රමසිංහ මහතා නීතිය හා සාමය අමාත්‍යාංශය තමන් යටතට ගන්නා විට එම පත්වීම් ලිපිය අගමැතිවරයාට පිරිනමනවා හැර වෙන කිසිවක් කිරීමට මෛත්‍රීපාල මහතාට නොහැකි විය. ඉන් පැහැදිලි වන්නේ, මෛත්‍රීපාල මහතාට ආණ්ඩුව තුළ ඇති බලයේ ප්‍රමාණයයි. මේ මැතිවරණ ප්‍රතිඵලය විසින් ඔහුගේ ජනාධිපති ධුරයේ බලය වැඩිකරනවා වෙනුවට විශාල ලෙස අඩුකර ඇත. පොදුවේ ගත්විට මේ ඡන්දය ජනාධිපතිවරයාගේ දේශපාලන බලය දුර්වල කර තිබෙන අතර එය වර්ධනය කර නැත. තනි ශ්‍රී ලංකා ආණ්ඩුවක් හැදීමේ ඔහුගේ ප්‍රකාශ අවලංගු වී පවතින්නේ ඒ නිසාය. එසේම යළි මහින්ද ළඟට යාමට ශ්‍රීල.නි.ප. ඇතැම් ප්‍රබලයන් දක්වන විරෝධයද මෛත්‍රීට එ.ජා.ප. හවුල් ආණ්ඩුවේම සිටීමට බලකර ඇත. ශ්‍රීල.නි.ප.ය හවුල් ආණ්ඩුවෙන් යන්නේ නම් තමන් තනි යූ.ඇන්.පී. ආණ්ඩුවක් හදන බව කී රනිල්ටද එවැන්නක් හදාගැනීමට නොහැකි විය. දැනට ඇමතිකම් දරන ශ්‍රීලනිප ඇමතිවරු කිහිප දෙනෙක් එකතුකරගෙන ආණ්ඩුවක් හැදීමට එ.ජා.ප.ය කල්පනා කළද ශ්‍රීල.නි.ප.ය අතහැර ආණ්ඩුවට එක්වන අයට තම අතින් අමාත්‍ය ධුර නොදෙන බව ජනාධිපතිවරයා විසින් පවසනු ලැබීම නිසාත් එ.ජා.ප.යට පාර්ලිමේන්තුව තුළ තිබෙන දුර්වල බලයද මේ මැතිවරණ ප්‍රතිඵලය විසින් අභියෝගයට ලක්කර තිබීම නිසාත් තනි එ.ජා.ප. ආණ්ඩු හැදීම හීනයක් බවට පත්ව තිබේ. එ.ජා.ප.ය මේ ඡන්දයෙන් 2015 මහමැතිවරණයේ ලබාගත් ඡන්ද ලක්ෂ 51ට සාපේක්ෂව ඡන්ද ලක්ෂ 15කට ආසන්න ප්‍රමාණයක් අහිමිකරගෙන තිබෙන අතර දැන් සිටින්නේ ඉතාම දුර්වල තැනකය. එ.ජා.ප. අභ්‍යන්තර අර්බුදයන්ද යළි උග්‍රවී ඇත. ඇමති මණ්ඩලයේ 'ලොකු වෙනසක්' නොවීමේ හේතුවද එයය.

අනෙක් අතට වත්මන් ආණ්ඩුවෙන් ශ්‍රීල.නි.ප.ය ඉවත්කර තනි ශ්‍රීල.නි.ප. ආණ්ඩුවක් හදා එය දේශපාලන 'පරිවාසයකට' යටත්කර මෛත්‍රී හුදකලා කිරීමත්, තනිව පාලනය පිහිටුවීමට නොහැකි පළාත් පාලන ආයතන රැසක පාලනය පිහිටුවීමට මෛත්‍රී කණ්ඩායමේ සහාය ගැනීමත් අරමුණු කරගෙන මහින්ද පිල දියත් කළ උත්සාහයද අසාර්ථක විය. ඒ තවමත් මහින්ද කණ්ඩායමද දුර්වල නිසාය. ඡන්ද ප්‍රතිඵලයේදී 'පෙනුම' තුළ පෙන්වූ ඊනියා 'විශිෂ්ට ජයග්‍රහණය' මහින්ද රාජපක්ෂ කණ්ඩායමේ ප්‍රතිඵලයේ 'හරය' තුළ නොවීය. මහින්ද පිල 2015 මහමැතිවරණයට සාපේක්ෂව වැඩිකරගෙන තිබෙන්නේ ඡන්ද ලක්ෂ 2කි. දැනට මහින්ද පිල ලබාගෙන තිබෙන ලක්ෂ 49ක ඡන්ද ප්‍රමාණය මෙලෙසම තිබුණත් ඊළඟට මහ මැතිවරණයකදී මහින්දට ආසන 105ක්වත් ගත නොහැක. මන්ද 2015දී එජාපය ඡන්ද ලක්ෂ 51ක් ලබාගෙන සිටියදී පවා දිනාගත්තේ මන්ත්‍රී ධුර 106ක් පමණක් නිසාය. එබැවින් මහින්දගේ මැතිවරණ ජයග්‍රහණය පමණ ඉක්මවා පුම්බන ලද්දක් විය. මහින්දට පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ධුරය පවා නැතිව සිටීමට සිදුව ඇත්තේ ඒ නිසාය.

පොදුවේ ගත්විට මේ මැතිවරණයෙන් ආණ්ඩුව පරාජය වී තිබේ. එ.ජා.ප.ය ඡන්ද ලක්ෂ 15ක් අහිමිකරගත් අතර ජනාධිපතිවරයා ලබාගෙන තිබෙන්නේ ජනාධිපති බලය, ඇමතිවරුන්ගේ සහාය හා ශ්‍රීල.නි.ප.ය හා නිදහස් සන්ධාන නිල නායකත්වයද උපයෝගී කරගෙන ඡන්ද ලක්ෂ 14කි. එයද කිසිසේත්ම ප්‍රමාණවත් නැත. එබැවින් ආණ්ඩුව පරාජය වී ඇති අතර විපක්ෂය ඡන්ද වැඩිකරගෙන ඇත. එහිදී මහින්ද පිල ඡන්ද ලක්ෂ 2ක වැඩිකරගන්නා විට ජවිපෙ ඡන්ද 168,000ක් වැඩිකරගෙන තිබේ. සත්‍ය එයයි. ඡන්දයෙන් පසු කිසිවෙකුට අලුත් පෙරළියක් කිරීමට නොහැකි වීමේ රහස එය වේ.

කෙසේ වෙතත් දැන් අලුත් තත්වය තුළ මෛත්‍රී හා රනිල්ට ඊළඟ ඡන්දයෙන් ජනාධිපති වීමේ සිහිනය අත්හරින්නට සිදුව තිබේ. තවදුරටත් ඔවුන් දෙදෙනාගේ ජනාධිපති සිහිනය යථාර්ථයක් නොවේ. ඒ නිසා දැන් ආණ්ඩුව තුළ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ අමතර පහසුවක් ඇතිවී තිබේ. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට රනිල් හා මෛත්‍රී බාධාව බිඳවැටී තිබේ. එසේම මහින්දට ජනාධිපතිවරණයට තරග කළ නොහැකි නෛතික බාධාවක්ද තිබේ. මේ තත්වය මත විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ අලුත් ඉඩක් මතුව තිබෙන අතර ඒ ඉඩ තුළ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට ප්‍රජාතන්ත්‍රවාදය අගයන බලවේග විසින් ක්‍රියාකළ යුතුව තිබේ. මෙහිදී ජ.වි.පෙ.ට විශේෂ කාරයභාරයක් කළ හැකිය.

රට තුළ පවතින දේශපාලන අර්බුදයත් මෙම ඡන්ද ප්‍රතිඵලයත් විසින් නව දේශපාලන මාවතක් ජ.වි.පෙ.ට විවෘතවී තිබේ. ඒ කුමක්ද? මෙම ඡන්දයෙන් මහින්ද කණ්ඩායම හිස එසවීම නිසා 2015දී මහින්ද පරාජය කිරීමට පෙරමුණ ගත් සමාජ බලවේග කනස්සල්ලට පත්ව තිබේ. එසේම 2015 ජනාධිපතිවරණයේදී එම බලවේග යහපත් පාලනයක් වෙනුවෙන් කළ කාර්යභාරය ඔවුන්ගේ බලාපොරොත්තු මෛත්‍රී-රනිල් දෙපළ විසින් මුළුමනින්ම පාවාදී හා බිඳවට්ටවා තිබේ. දැන් තවදුරටත් මෛත්‍රී බලවේග යක් නොවන අතර විශ්වාස කළ යුතු කෙනෙක්ද නොවේ. මෙය ජ.වි.පෙ. 2015 ජනාධිපතිවරණයේදී පැවසූ දේ සනාථ වීමකි. එ.ජා.ප.ය දැන් දුර්වලව තිබේ. කිසිවකුට ඔවුන් ගැන විශ්වාස කළ නොහැක. ඒ අනුව මහින්ද රාජපක්ෂ දුෂ්ට කල්ලිය යළි බලයට ඒම වැළැක්වීමේදී මහින්ද විරෝධීන්ට විශ්වාසය තැබිය හැකි එකම බලවේගය වන්නේ ජ.වි.පෙ.

15 වැනි පිටුවට



> 2015 ජනාධිපතිවරණයේදී එම බලවේග යහපත් පාලනයක් වෙනුවෙන් කළ කාර්යභාරය ඔවුන්ගේ බලාපොරොත්තු මෛත්‍රී-රනිල් දෙපළ විසින් මුළුමනින්ම පාවාදී හා බිඳවට්ටවා තිබේ. දැන් තවදුරටත් මෛත්‍රී බලවේගයක් නොවන අතර විශ්වාස කළ යුතු කෙනෙක්ද නොවේ. මෙය ජ.වි.පෙ. 2015 ජනාධිපතිවරණයේදී පැවසූ දේ සනාථ වීමකි. එ.ජා.ප.ය දැන් දුර්වලව තිබේ. කිසිවකුට ඔවුන් ගැන විශ්වාස කළ නොහැක. ඒ අනුව මහින්ද රාජපක්ෂ දුෂ්ට කල්ලිය යළි බලයට ඒම වැළැක්වීමේදී මහින්ද විරෝධීන්ට විශ්වාසය තැබිය හැකි එකම බලවේගය වන්නේ ජ.වි.පෙ. පමණි.



"දේශපාලනයේදී ජනතාව, සැමදාමත් රැවටිල්ලට හා ආත්ම රැවටිල්ලට අඥාන ලෙස ගොදුරුවී ඇත. එමෙන්ම සියලුම සදාචාර, ආගමික, දේශපාලන හා සමාජ වදන්, ප්‍රකාශයන් හා පොරොන්දු පිටුපස තිබෙන කිසියම් හෝ අනෙක් පංතියක වුවමනාවන් සොයා, තෝරා ගැනීමට ඔවුන් උගෙන ගන්නා තෙක්ම ඔවුන් එසේ තවදුරටත් රැවටෙනු ඇත."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 01වෙළුම, 52 පිටුව**

# ‘මැතිවරණ ප්‍රතිඵල හා රටේ අනාගතය’ විදෙස් ජනහමු රැසක්



පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල සමගම රට තුළ මහත් අන්දෝලනාත්මක තත්වයක් ඇතිවූ කෙමෙන් එම උණුසුම මැකී යද්දී හුදු මුහුණු මාරුවක් පමණක් රටේ කිසිදු වෙනසක් නොවූ බව ජනතාවට අවබෝධ වෙමින් තිබේ. මෙවන් වටපිටාවක් තුළ මෙරට මෙන්ම විදේශයන්හි වෙසෙ ලාංකිකයන් වෙනුවෙන් ප්‍රතිඵලවලින් පසු දේශපාලන තත්වය පිළිබඳව දැනුවත් කිරීම සඳහා ජ.වි.පෙ. වැඩපිළිවෙළක් දියත් කරන ලදී.

එහි එක් පියවරක් ලෙස මැතිවරණ ප්‍රතිඵල හා රටේ අනාගතය යන මැයෙන් ජනතා විමුක්ති පෙරමුණ එක්සත් රාජධානි කමිටුව විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණයක් පසුගිය පෙබරවාරි 23 වැනිදා St Johns Community Center, Carwford Avenue, Wembley,Ha0 2hx හිදී පැවැත්වුණි. ජ.වි.පෙ. දේශපාලන මණ්ඩල සභිකයින් වන සුනිල් හඳුන්නෙත්ති සහ බිමල් රත්නායක යන සහෝදරවරු මේ සම්මන්ත්‍රණවල ප්‍රධාන ආරාධිතයෝ වූහ.

# ජ.වි.පෙ. ශක්තිමත් කිරීමට විද්වත් - කලාකරු සහය

ජ.වි.පෙ. පළාත් පාලන මැතිවරණයට අවතීර්ණ වූයේ "දූෂණය පරදන ජවය" යන තේමාව යටතේය. වර්තමාන යහපාලන ආණ්ඩුවේත් පැවති රාජපක්ෂ පාලනයේත් ප්‍රමුඛ කාර්යය වී තිබුණේ වංචාව හා දූෂණයයි. එනිසාම පළාත් පාලන ආයතන තුළට වංචනිකයින් පත් වීමත් රට තුළ දූෂණ විරෝධී මතය තහවුරු කර එයට එරෙහිව ජනතාව සංවිධානය කිරීමත් ජ.වි.පෙ. අරමුණ විය.

ජ.වි.පෙ මෙම සටන් පාඨය වටා එක් වූ රටේ විද්වතුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්, කලාකරුවන් සහ වෘත්තිකයන් විශාල පිරිසක් මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ ක්‍රියාකාරිව සිටීම විශේෂත්වයක් විය.

සාම්ප්‍රදායික ලෙස ප්‍රසිද්ධ වේදිකාවක නැග සහයෝගය දැක්වීමෙන් නොනැවතී කලාකරුවෝ, විශ්වවිද්‍යාල ආචාර්යවරු තමන්ගේ කාලය, ශ්‍රමය, ධනය කැපකරමින් ගමින් ගමට ගොස් ජ.වි.පෙ. නියෝජිතයින් පළාත් පාලන ආයතනවලට පත් කිරීමේ වැදගත්කම ජනතාවට අවධාරණය කරන්නට උරදුන්හ. මේ නිසාම ජ.වි.පෙට මෙන්ම මෙම මැතිවරණ ව්‍යාපාරයට සම්බන්ධ වූ ඇතැම් කලාකරුවන්ගේ පුද්ගලික චරිතවලටද සතුරු පාර්ශවයන්ගේ අවලාද එල්ල වී තිබිණි.



කෙසේ නමුත් මෙම මැතිවරණ ව්‍යාපාරය තුළ සමාජයට බලපෑම් කළ හැකි සමාජ ස්ථරයන් විශාල ප්‍රමාණයක් ජ.වි.පෙ.ට සහය දීමට ඉදිරිපත් වූ අතර මැතිවරණයෙන් පසු ගොඩනැගෙන ප්‍රගතිශීලී ජනතාවගේ පුළුල් පෙරමුණක් වෙනුවෙන් තමන්ගේ කැපවීම සහතික කිරීමටද මේ වන විට ඔවුහු ඉදිරිපත්ව සිටිති.

# Forward Bloc - ජ.වි.පෙ. හමුවක්



All India Forward Bloc සංවිධානයේ නියෝජිතයෙකු සහ ජ.වි.පෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා අතර සාකච්ඡාවක් පසුගිය පෙබරවාරි 06 දා බත්තරමුල්ල ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි.

පක්ෂ දෙක අතර සම්බන්ධතා තවදුරටත් තර කරගැනීම හා ජනතා විමුක්ති පෙරමුණ තම ප්‍රචාරක කටයුතු සඳහා සමාජ ජාලා වෙබ් අඩවි සහ ඩිජිටල් තාක්ෂණය භාවිතා කරන ආකාරය පිළිබඳව මෙහිදී වැඩිදුරටත් සාකච්ඡාවට බඳුන් විය.

මෙම සාකච්ඡාවට සහභාගි වූ රජත් කුමාර් දාස් All India Forward Bloc පක්ෂයේ ප්‍රචාරක කටයුතු සඳහා සමාජ ජාලා සහ ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම පිළිබඳව මූලිකවම වගකීම් දරන තැනැත්තා වේ. මැතිවරණය ව්‍යාපාරය තුළ ජ.වි.පෙ. ජනමාධ්‍ය භාවිතය, විශේෂයෙන් ඩිජිටල් මාධ්‍ය භාවිතය පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගනීම ඔහුගේ හමුවේ අරමුණ විය.

ඉන්දියානු නිදහස් අරගලයේ ප්‍රමුඛ ක්‍රියාධරයෙකු වූ සුභාෂ් චන්ද්‍රබොස්ගේ නායකත්වයෙන් බිහිවූ මෙම පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුණ අතර ඇත්තේ දිගු කාලීන මිත්‍රත්වයකි.

# ජනතා ප්‍රශ්න අත්නොහැර සටනේ

පළාත් පාලන මැතිවරණයෙන් පසු ඇතැම් පක්ෂ අගමැතිකම්වලට සිහින දකිද්දී සහ තවත් පක්ෂ අගමැතිකම් බේරාගැනීමට වලිකද්දී ජනතා විමුක්ති පෙරමුණ ජනතාවගේ පාර්ශ්වයේ සිටිමින් පීඩිත ජන කොටස්වල නොවිසඳුණු ගැටලු වෙනුවෙන් අඛණ්ඩව සටන් වදිමින් සිටී.

වී ගොවීන් සඳහා සාධාරණ මිලක් නොලැබීම සහ පාරිභෝගික ජනතාවට සහල් සඳහා අධික මිලක් ගෙවීමට සිදුවීම සම්බන්ධයෙන් කරුණු දැක්වීමට සමස්ත ලංකා ගොවි ජන සම්මේලනය මැදිහත් වූයේ මේ තත්වය තුළය. එහි ජාතික සංවිධායක නාමල් කරුණාරත්න සහෝදරයා පසුගිය 18වැනිදා මාධ්‍ය හමුවක් සංවිධානය කරමින් මෙම ගැටලුව රටේ අවධානය ලක්කිරීමට පියවර ගත්තේය. මෙම මාධ්‍ය හමුව බයව ගොවි සංවිධාන නියෝජතයින්ගේද මැදිහත්වීමෙන් වාරියපොළ බයව වෙල් යායේ සිටම පැවැත්වීම විශේෂත්වයක් විය.

වී අස්වැන්න නෙලීම ආරම්භ වනවාත් සමගම වී මිල රුපියල් 27 දක්වා අඩු වී ඇති බවත් හාල් මිල රුපියල් 80දක්වා ඉහළ ගොස් ඇති බවත්, මෛත්‍රී, රනිල්, මහින්ද බලය වෙනුවෙන් කුළල් කාගනිමින් සිටින නමුත් ගොවි ජනතා ප්‍රශ්න සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන්නේයැයි නාමල් කරුණාරත්න සහෝදරයා චෝදනා කළේය.

සමස්ත ලංකා ගොවි ජන සම්මේලනයේ ජාතික කමිටු සාමාජික සංජීව කරුණාසාගර සහෝදරයා ඇතුළු ගොවි නායකයෝ විශාල පිරිසක් මෙම අවස්ථාවට එක්වී සිටියහ.



# අයිතිකරුවෙකු නැති ආර්ථිකයේ අහිංසක ජනතා අපේක්ෂා


ප්‍රළාත් පාලන මැතිවරණය අවසන් විය. ගම හදන ආණ්ඩු හදා අවසන්ය. ජනතාව ගමේ ආණ්ඩුවල වැඩි බලයක් බහුතර තැන්වල මහින්දට දී ඇත. ගමේ ආණ්ඩු හදනු වෙනුවට ජනතාව හදා ඇත්තේ, "මහින්ද ආණ්ඩුය. මහින්ද අගමැති කරනු පිණිස ජනතාව කතිර ගසා ඇත. බන්දුල ගුණවර්ධනට අනුව තම මහින්ද අගමැති කිරීමට ජනතාව පොල්ලෙලිවලට කතිර ගසා ඇත. පොල්ලෙලි පත්කළේ මහින්ද අගමැති කරනු පිණිසය. ඒ ආණ්ඩුවට විරෝධය පළ කිරීමට ජනතාව තෝරාගත් වැරදි මාවතයි. ජනතාව පොහොර කප්පාදුවට එරෙහිව මහින්දගේ ගමේ පොල්ලෙලිවලට ඡන්දය දී ඇත. සයිටම් විරෝධයටද ඡන්දය දී ඇත්තේ පොල්ලෙලිවලටය. බඩු මිල, තෙල් මිල වැඩිවීමටද විරෝධය පා ඇත්තේ "පොල්ලෙලි" තෝරාපත් කරගෙනමය.

දැන් ජනතාව මහින්ද සිහිනයෙන් ඇස් හැර බලන විට දුටුවේ කුමක්ද? ගමේ පාලන ආයතන පිහිටුවීම නොව ආණ්ඩු පෙරළීම ගැන සංවාදයකි. අගමැති වෙන්නේ රනිල්ද? නිමල් සිරිපාලද? කරුද? යන්න පළාත් පාලන ඡන්දයෙන් පසු දේශපාලනයේ මතුවූ ප්‍රධාන ප්‍රශ්නයයි. නමුත්, රනිල්, කරු, සිරිපාල කවුරු ආණ්ඩු පිහිට වූවත්, කවුරු අගමැති වුවත් පොහොර සහනාධාරයට කුමක් සිදුවනු ඇත්ද? බඩුමිල අඩුවෙන්නේ කොහොමද? අධ්‍යාපනයේ කප්පාදු නතර වන්නේ කොහොමදැයි ප්‍රශ්න කරන ඔවුන්ගෙන් කිසිවෙක් දැකිය නොහැකි විය.

දේශපාලන අර්බුදය තුළ ආණ්ඩුවල පැවැත්ම හා අගමැතිවරුන්ගේ මාරුවීම පත්වීම ගැන වික්ෂිප්තව බලා සිටින සමාජය, හරියට කපිතාන්වරයෙකු නැති නෞකාවක් මෙන් ඉබාගාතේ යන, අරමුණක් ඉලක්කයක් නොමැතිව ගමන් කරන ආර්ථිකය පිළිබඳව කිසිදු අවධානයක් නොමැතිව අත්පොළසන් දෙනු පෙනේ. මාධ්‍ය මිනිස් ඔළු හරවා ඇත්තේ අගමැති නාඩගම දෙසටය. ඒ තුළ ජනතාවට තම ඡන්දයෙන් විරෝධය පළ කළ ආර්ථිකයේ පීඩනය අමතක කරවමින් තිබේ. ජනමාධ්‍ය විසින් සරල-විකිණෙන මාතෘකාව, තෝරාගෙන ඇත. සිරිපාලටත් රනිල්ටත් කරුටත් කාටවුවත් අසීරු ප්‍රශ්නය ආර්ථිකය බව දැන් ඒ මාතෘකාව අමතක කර ඇත.

## ඡන්ද ප්‍රතිඵලය හා ආර්ථිකය

මැතිවරණ ප්‍රතිඵලය නිකුත් වී හුස්ම ගන්නටත් පෙරම ආර්ථිකයේ ප්‍රතිඵලද නිකුත් විය. ඩොලරයට හුවමාරු වෙන රුපියලේ අනුපාතය 152 සිට 156 දක්වා ඉහළ ගියේය. රුපියල කඩා වැටීම ආරම්භ විය. 2015-2016 මහ බැංකු වාර්තා අනුව රුපියල කඩා වැටීම නිසා පමණක් ජාතික ණය බරට එකතු වූ ණය වැඩිවීමේ ප්‍රමාණය රුපියල් බිලියන 478ක් විය. පොලී අනුපාත ඉහළ යාමට, බැඳුම්කර වංචාව සෘජුව බලපෑ බව දැන් කවුරුත් දන්නා සත්‍යයකි. පැවැති 9.3% ක පොලී අනුපාතයන් අද වන විට 16% ඉක්මවා ගොස් ඇත්තේ බැඳුම්කර පොලී අනුපාත කෘත්‍රිමව ඉහළ ගිය නිසාය. ආර්ථිකයේ ණය බර ඉහළ දැමූ ණයකාරයින්ටම කතිර ගැසූ ජනතාව මේ අර්බුදයට වගකිවයුත්තේ රට ණය කළ වුන්ම බව නොදැන හෝ දැන දැනම හෝ කතිර ගසා බලය දී ඇත. බලය දී ඇත්තේ ණය ගොදුරට රට බිලි දුන් අයටම වීම කෙතරම් සරදමක්ද?



## ණයට වගකියන කතිර

රටේ ඇති ප්‍රධානම අර්බුදය අගමැතිවරයෙකු තෝරා පත්කිරීම නොව ණය උගුලෙන් ආර්ථික පීඩනයෙන් රට ගලවා ගත හැකි දිගුකාලීන සැලසුමක් ඇති ආර්ථික ප්‍රතිපත්තියක් ජයග්‍රහණය කරවීම, එවැනි ප්‍රතිපත්තියක් බලයට පත් කිරීම බව ජනතාව විසින් පිළිගන්නා තුරුම රටත් පරාදය. ජනතාවත් පරාදය. ඒ බව තේරුම් ගැනීමට රට ගිලී ඇති ණය අර්බුදයේ තරම තේරුම් ගැනීම පමණක් වුව ප්‍රමාණවත්ය.

> රටේ ඇති ප්‍රධානම අර්බුදය අගමැතිවරයෙකු තෝරා පත්කිරීම නොව ණය උගුලෙන් ආර්ථික පීඩනයෙන් රට ගලවා ගත හැකි දිගුකාලීන සැලසුමක් ඇති ආර්ථික ප්‍රතිපත්තියක් ජයග්‍රහණය කරවීම, එවැනි ප්‍රතිපත්තියක් බලයට පත් කිරීම බව ජනතාව විසින් පිළිගන්නා තුරුම රටත් පරාදය. ජනතාවත් පරාදය.

2009-2014 කාලය තුළ රටේ සමස්ත ණය බර කලින් පැවැති තත්ත්වයට වඩා තුන් ගුණයකින් ඉහළ ගිය අතර, විදේශ ණය පංගුව 2005 සිට 2009 දක්වා පැවැති ප්‍රමාණය මෙන් දෙගුණයකට ඉහළ යන ලදී. ඒ ණය ගැනීම කොතරම් නාස්තිකාරදැයි තේරුම් ගැනීමට සරලම උදාහරණය හම්බන්තොට වරායේ ගලක් ඉවත් කිරීමට පමණක් ඩොලර් මිලියන 42ක් වියදම් කිරීමය. දැන් හම්බන්තොට වරායද ණයට හිලව්වට චීනයට පවරාදී අවසන්ය. 2015 දී දේශීය ණය 12% කින්ද, විදේශ ණය 25% කින්ද, ඉහළ යන ලදී. 2018 වසරට පමණක් ගෙවිය යුතු විදේශ ණය ප්‍රමාණය ඩොලර් බිලියන 8.5කි. රුපියල් බිලියන ආසන්න ලෙස 1326කි. (රු.කෝටි 1,32,600)කි.

## යහපාලන ණය පාලනය

යහපාලන බෝඩ් ලෑල්ල හිමි වික්‍රමසිංහ+මෛත්‍රීපාල හවුල් ආණ්ඩුව කාලය තුළ (වසර 03කදී) පමණක් ලබාගෙන ඇති විදේශ ණය ප්‍රමාණය පමණක් ආසන්න ලෙස ඩොලර් බිලියන 14.5කි. (රුːකෝටි 2,26,200 ක්)

2015 ජනවාරි සංවර්ධන විදේශ බැඳුම්කර නිකුතුවෙන් ඩොලර් බිලියන 07.2ක්, 2015 දීම මහ බැංකු බැඳුම්කර නිකුතුවෙන් ඩොලර් බිලියන 03.6ක්, ජාත්‍යන්තර විදේශ ආයතනවලින් 2017දී ඩොලර් බිලියන 02ක්, ජාත්‍යන්තර බැංකුවලින් 2015-2017 කාලය තුළ විදේශ ණය ඩොලර් මිලියන 115ක්, 2015-2017 කාලය තුළ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල නිදහස් කළ ණය ඩොලර් බිලියන 01.5ක් ආදී වශයෙන් මෙම යහපාලන කාලය තුළ ණය ලබාගෙන ඇත. ඒ විදේශ ණය පමණි. ඊට අමතරව 2015 සිට මේ දක්වා ට්‍රිලියන 5.7ක ප්‍රමාණයට වරින් වර භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවක් සිදුකර දේශීය වෙළඳ පොළෙන් ණය ලබාගෙන ඇත. ඒ සියලු ණය කරෝලිස් ආතලා වැනි "පොල්ලෙලිවලට" කතිරය ගසන ජනතාව විසින් ආපසු ගෙවිය යුතුය.

## "පොල්ලෙලිවලින් ණය ගෙවීම"

යහපාලන රනිල්+මෛත්‍රී හවුල් ආණ්ඩුව ලබාගෙන ඇති වසර 3ක ණය ප්‍රමාණය තවත් හම්බන්තොට වැනි වරායවල් 05ක් හදන තරමේ ණය වේ.

දකුණු අධිවේගී මාර්ගය වැනි පාරවල් කිහිපයක් හැදිය හැකි ණය වේ. ජනතාව මහින්දගේ පොල්ලෙලි අපේක්ෂකයින්ට ඡන්දය දුන් එක් හේතුවක් වූයේ මේ ආණ්ඩුව මොකුත් කරලා නැතිය කියන හේතුවද එකතු කරගනිමිනි.

රනිල්-මෛත්‍රී මොකුත් නොකර සිටියේ නැත. මහින්ද රාජපක්ෂලා ණය කළ ණය ගොඩටම තවත් ණය එකතුකර රටේ ජනතාවම ණය කන්දකට යටකරන ලදී. ඒ නිසා මහින්ද හොඳයැයි තෝරන ජනතාවට ආර්ථිකයේදී රනිල්ගෙන් මහින්ද වෙන් කළ නොහැකි බව තේරුම් ගැනීමට නොහැකිවීම 'කරුමයක්'දැයි විටෙක සිතීම වැළැක්විය නොහැකිය. රනිල්ගේ ආර්ථික ප්‍රතිපත්ති මහින්දගේ ආර්ථික ගමනින් දශමයකින් හෝ වෙනස් නොවේ. ඒ ගමනේම දිගු පියවරකි. අලුත් ගමනක් නොවේ. රනිල් මොකුත් නොකරන්නේ නම් මහින්දටද අලුතින් "මොකුත් කළ හැකි" නොවේ. රනිල් මහින්දගේ ණය ගොඩට අලුතින් ණය එකතු කළේය. ණය ගොඩ වැඩි කළේය. දැන් ප්‍රතිඵලය රජයේ මුළු ආදායමින් 95.5%ක් ණය නැවත ගෙවීමට යෙදවිය යුතුය. චීනයට පමණක් ගෙවිය යුතු ණය ඩොලර් බිලියන 08කි. ණය දළ දේශීය නිෂ්පාදනයෙන් 75%ක් ඉක්මවයි. මහින්දට හෝ මහින්දගේ පොල්ලෙලිවලට මේ අර්බුදයට උත්තර තිබේදැයි ජනතාවම සිතිය යුතුමය.

## රටේ අනාගතය හා ණය අනාගතය


රටේ ජනතාව අතාර්කික ලෙස තම පීඩනය මැතිවරණ ප්‍රතිඵල මගින් ප්‍රකාශයට පත් කර ඇත. එය ප්‍රතිපත්ති, සැලසුම්, රටේ ආර්ථිකය වැනි සංකීර්ණ කරුණු සලකා නොබැලූ සරල තීරණයකි. ආර්ථිකය ගැන දන්නා බන්දුල ගුණවර්ධන සරලව කිවුවේ එයයි. මහින්දගේ නමින් පොල්ලෙල්ලක් වුව ජනතාව දිනවන්නේ එලෙසින් නමුත්, සරල ප්‍රකාශනයේ ගැඹුරු විරෝධයක් තිබුණි. ජනතාවගේ සහන කැපීමට විරෝධයයි. බඩු මිලට එරෙහි විරෝධයයි. බදු බරට එරෙහිවයි. රාජ්‍ය සම්පත් විකිණීමට විරෝධයයි. හොරුන්ට දඬුවම් නොකිරීමට විරෝධයයි (නැවත හොරුන්ටම ඡන්දය දුන්නත්)

**අනාගත ණය ගෙවීමේ කැලැන්ඩරය**

| වසර | ගෙවිය යුතු ණය ඇමරිකානු ඩොලර් මිලියන |
|---|---|
| 2015 | 1828 |
| 2016 | 1604 |
| 2017 | 2132 |
| 2018 | 2891 |
| 2019 | 4217 |
| 2020 | 3699 |

නමුත්, ජනතාවගේ ඒ අහිංසක අපේක්ෂාවන් එලදැරිය හැකි අනාගතයක් රටට නැති බව මනාව තේරුම් ගත හැකි සරලම උදාහරණය පහත ණය ගෙවීමේ අනාගත කැලැන්ඩරයයි.

2019 දී කවුරු අගමැති ජනාධිපති වුවත් ඉතිහාසයේ වසරකදී ගෙවිය යුතු වැඩිම විදේශ ණය ප්‍රමාණය ගෙවීමට මුදල් උපයා ගත යුතුය. එක්කෝ ණය ගෙවීමට ණය ගත යුතුය. (ඒ සඳහා කවුරුත් හෝ ණය දිය යුතුය.) නැතහොත් ණයට හිලව්වට රටේ සම්පත් විකිණිය යුතුය. ඒ ණය උගුලට උත්තර සෙවීමත් ජනතාවගේ අහිංසක අපේක්ෂා ඉටුකිරීමටත් ධනපති දුබල ආණ්ඩුවට කිසිසේත්ම හැකියාවක් නැත.



"හැම දවසක්ම සුභ දවසක් නොවනු ඇත.
එසේ වුවත් ජීවත් වන්න.
ඔබ ආදරය කරන හැම දෙනාම පෙරළා ඔබට ආදරය නොකරනු ඇත.
එසේ වුවත් ආදරය කරන්න.
හැම දෙනාම ඔබට සත්‍ය නොපවසනු ඇත.
එසේ වුවත් අවංක වන්න.
සියලු ගනුදෙනු සාධාරණ නොවිය හැක.
එසේ වුවත් සාධාරණව කටයුතු කරන්න..

**අබ්දුල් කලාම්**

# මාලදිවයිනः දේශපාලන අර්බුදයක ගිලීයමින්



මේ වන විට මාලදිවයින තුළ බරපතළ දේශපාලන අර්බුදයක් වර්ධනය වෙමින් තිබේ. මෙය බැලූ බැල්මට අභ්‍යන්තරික දේශපාලන අර්බුදයක් ලෙස පෙනුණද එය ඉන් ඔබ්බටද පැතිරුණ කලාපීය බලවතුන් අතර බල අරගලයේ ප්‍රතිඵලයක් ලෙසද පෙනෙන්නට තිබේ. මෙම දේශපාලන අර්බුදය මතුවීමට පටන් ගැනුණේ පසුගිය පෙබරවාරි 01වැනිදා මාලදිවයිනේ ශ්‍රේෂ්ඨාධිකරණය එරට වත්මන් ජනාධිපතිවරයා විසින් හිටපු ජනාධිපති මොහොමඩ් නෂීඩ් ඇතුළු පිරිසට පනවා තිබූ මර්දනීය ක්‍රියාමාර්ග තවදුරටත් වලංගු නොවන බව ප්‍රකාශයට පත් කිරීමත් සමඟය.

ඊට ප්‍රතිචාර වශයෙන් ජනාධිපති අබ්දුල්ලා යමීන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවරයෙක්ද, නෂීඩ් හිතවාදියකුද අත්අඩංගුවට ගෙන ශ්‍රේෂ්ඨාධිකරණය අක්‍රිය කළේය. ඒ සමඟම මාලදිවයින තුළ ආණ්ඩු විරෝධී විරෝධතා පැන නැගුණි. මේ තත්වය තුළ ජනාධිපති යමීන් විසින් සති දෙකක හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කරනු ලැබීය. පසුව එය තවත් මසකින් දීර්ඝ කරනු ලැබිණි.

මාලදිවයින් ජනාධිපතිවරණය යෙදී ඇත්තේ, මෙම වසරේ ඔක්තෝබර් මාසයටයි. එම ජනාධිපතිවරණයෙන් වැඩි වාසි ඇත්තේ 2008-2012 දක්වා මාලදිවයිනේ ජනාධිපතිවරයා වූ මොහොමඩ් නෂීඩ්ට යැයි කියවේ. ඔහු ඉන්දියානු හිතවාදියෙකු ලෙසද ප්‍රසිද්ධය.

මාලදිවයින තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ඉන්දියාව නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ තමන් වර්ධනය වන තත්වය නිරීක්ෂණය කරන බවත් අත්අඩංගුවට ගැනීම් සහ හදිසි තත්ත්වය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ඉන්දීය පාලනය අපහසුතාවයට පත් වූ බවත් ය.මේ අතර ඒ හා සමඟම නිකුත් වූ වාර්ථා පැවසූයේ ඉන්දීය විශේෂ බලකායේ 1500ක හට පිරිසක් හදිසි මැදිහත් වීමක් සඳහා සූදානම් කර තැබූ බවයි.

මේ අතර චීනය පැවසුවේ එය මාලදිවයිනේ අභ්‍යන්තර ප්‍රශ්නයක් බවත්, ජාත්‍යන්තර ප්‍රජාව ඊට ජනතාත්මකව ප්‍රතිචාර දැක්විය යුතු බවත් ය. පසුගිය පෙබරවාරි 09 වනදා ඉන්දියානු ජනාධිපති නරේන්ද්‍ර මෝදි එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් සමඟ මාලදිවයින තුළ වර්ධනය වන තත්වය පිළිබඳව දුරකථනයෙන් සාකච්ඡා කළ බවටද වාර්තා පළවිය.

1965 වසරේදී බ්‍රිතාන්‍ය පාලනයෙන් නාමික නිදහස ලැබූ මාලදිවයින 400,000ක ජනගහනයකින් යුක්ත දූපත් දහසකින් පමණ සැදුණු, ඉන්දියන් සාගර නාවුක ගමනාගමන මාර්ගයේ පිහිටි රටකි. 2013 සැප්තැම්බර් මාසයේ සිට එරට ජනාධිපතිවරයා ලෙස කටයුතු කරන්නේ, අබ්දුල්ලා යමීන්ය. ඔහු චීන හිතවාදියෙකු ලෙසද සැලකෙන අතර ඉන්දියාව සමඟද යහපත් සබඳතාවක් පවත්වාගෙන යන්නෙකි.

# එක්සත් ජනපදයः ෆෙඩරල් ආණ්ඩුව වසා දැමීමට ලක්වී




පසුගිය ජනවාරි 19වැනිදා මධ්‍යම රාත්‍රියේ සිට දින තුනක් එක්සත් ජනපද ෆෙඩරල් ආණ්ඩුව වසා දැමුණි. 2018 පෙබරවාරි 16 දින දක්වා වියදම් අනුමත කිරීමට සෙනෙට් සභාව අපොහොසත් වූ බැවින් එසේ කිරීමට සිදුවී තිබුණි. සෙනෙට් සභාව තුළ එකී වියදම් සම්මත කර ගැනීම සඳහා ඡන්ද 60ක් අවශ්‍යව තිබුණද එය ලබා ගැනීමට රිපබ්ලිකන් පක්ෂය අසමත් විය.

මේ ආකාරයෙන් ෆෙඩරල් ආණ්ඩුව වසා දැමීමකදී අත්‍යවශ්‍ය නොවන සේවාවන් නවතා දැමේ. එක්සත් ජනපද ජනාධිපතිවරයාට එවැන්නක් කිරීමට සිදු වන්නේ කොංග්‍රසයට අරමුදල් අනුමත කිරීමට නොහැකි වූ විටදීය. සාමාන්‍ය අයවැය ක්‍රියාවලියේදී කොංග්‍රසය සැප්තැම්බර් 30 වනදා වන විට ඉදිරි වර්ෂය සඳහා අරමුදල් අනුමත කරනු ලබයි. එවිට කොංග්‍රසය අඛණ්ඩ මූල්‍ය ප්‍රතිපාදන සැපයීම අනුමත කළ යුතුය. එසේ කිරීමට එය අපොහොසත් වූ විට ෆෙඩරල් ආණ්ඩුව වසා දැමීමට සිදු කෙරේ. එසේ වූවිට එය අයවැය ක්‍රියාවලියේ සම්පූර්ණ කඩා වැටීමකි.

ෆෙඩරල් ආණ්ඩුව වසා දැමුණද අත්‍යවශ්‍ය සේවාවන් නවතා දැමෙන්නේ නැත. එනම් ආරක්ෂාව, ජාතික ආරක්ෂාව වැනි ක්ෂේත්‍ර එලෙස වසා දැමෙන්නේ නැත. මීට අමතරව දේශ සීමා ආරක්ෂක, ආගමන විගමන, ගුවන් ගමන් පාලනය, ගමනා ගමනය, ආරක්ෂක පරිපාලනය, අධිකරණ දෙපාර්තමේන්තුව, තැපැල් සේවාවන් එලෙස වසා නොදැමේ.

ෆෙඩරල් ආණ්ඩුව වසා දැමීම සති 02 කට වඩා දීර්ඝ වුවහොත් එය රටේ ආර්ථික වර්ධනයටද බලපෑම් කරනු ඇත. එසේ වන්නේ රජයේ වියදම් දළ ජාතික නිෂ්පාදිතයේද කොටසක් වන බැවිනි. එක්සත් ජනපදයේ රජයේ වියදම දළ ජාතික නිෂ්පාදිතයෙන් 18%ක් පමණ වේ.

එක්සත් ජනපද ෆෙඩරල් ආණ්ඩුව මේ ආකාරයෙන් 2017/2013/2011 වසරවලදීද හදිසි වසා දැමීම්වලට ලක් විය.

## වෙනිසියුලාවः මදුරෝට වාසිදායක ජනාධිපතිවරණයක්



වෙනිසියුලාව මීළඟ ජනාධිපතිවරණය අප්‍රේල් 22 පැවැත්වීමට සූදානම් වේ. මෙම මැතිවරණයෙන් 2019-2025 දක්වා කාලය සඳහා නව ජනාධිපතිවරයෙකු තෝරා පත් කරගැනීමට නියමිතය.

මෙම ජනාධිපතිවරණයට හියුගෝ චාවේස්ගේ පක්ෂය වූ සමාජවාදී පක්ෂය නියෝජනය කරමින් තරග වැදීමට සූදානම් වන්නේ වත්මන් ජනාධිපති නිකොලස් මදුරෝය. වෙනිසියුලාවේ ප්‍රගතිශීලී පාලනය බිඳ දැමීම සඳහා එක්සත් ජනපද ආධාර මත යැපෙමින් කටයුතු කරන විපක්ෂය මේ වන විට බෙදී වෙන් වී සිටී. දක්ෂිණාංශික විපක්ෂයේ ඇතැම් නායකයින් සිරගතව සිටින අතර සමහරෙක් රටින් පිට ජීවත් වෙති. තවකෙකුට මැතිවරණයට ඉදිරිපත් වීම තහනම් කරනු ලැබ ඇත. මේ තත්වය තුළ මේ ජනාධිපතිවරණයේ වැඩි වාසි නිකොලස් මදුරෝට හිමිවේ යැයි මේ වන විටත් අනාවැකි පළකර තිබේ.

## ස්පාඤ්ඤයः විශ්‍රාමිකයෝ කබලෙන් ලිපට



පෙබරවාරි 22 දින ස්පාඤ්ඤයේ විශ්‍රාමිකයන් ප්‍රමාණවත් විශ්‍රාම වැටුපක් ඉල්ලා වීදි බටහ. ඔවුන්ගේ සටන් පාඨය වූයේ මහජන විශ්‍රාම වැටුප් ක්‍රමය, කම්කරු හා සමාජ අයිතීන් සුරකිමු ! යන්නයි.

ස්පාඤ්ඤයේ සමාජ ආරක්ෂණ අරමුදල් ක්ෂය වීමත් සමඟ එරට රජය වැඩිවන ජීවන වියදම සඳහා කරන එකතුව කප්පාදු කරනු ලැබිණි. මේ හේතුවෙන් මේ වන විට ස්පාඤ්ඤ විශ්‍රාමිකයන්ගේ මිලදී ගැනීමේ හැකියාව බරපතළ ලෙස පහත වැටී තිබේ.

## නේපාලයः එක්සත් වමට අගමැතිකම



නේපාලයේ 41 වන අගමැතිවරයා ලෙස නේපාලයේ එක්සත් මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයේ සභාපති K.P. ශර්මා ඕලි පත්විය.

පසුගියදා පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී නේපාලයේ එක්සත් මාක්ස් ලෙනින්වාදී කොමියුනිස්ට් පක්ෂයත්, මාවෝවාදී කොමියුනිස්ට් පක්ෂයත් (Mao Centre) එක්ව සන්ධානයකින් තරග වැදුණි. එහිදී ඔවුන් පාර්ලිමේන්තුවේ 2/3ක බලයක් දිනා ගැනීමට සමත් විය.

## වෙනිසියුලාවः අන්තර්ජාල මුදලකට මාරු වී




පසුගිය පෙබරවාරි 20 වනදා සිට වෙනිසියුලාව අන්තර්ජාල මුදල් ඒකකයක් මගින් ගනුදෙනු කිරීම ආරම්භ කළේය. ඒ සඳහා වෙනම භාණ්ඩාගාරයක් (Crypto Active Treasury) මේ අනුව ආරම්භ කෙරෙනු ඇති අතර එය වෙනම පද්ධතියක් යටතේ පාලනය වනු ඇත.

## එක්සත් ජනපදයः සියොන්වාදයට ප්‍රසිද්ධියේ ඉනිමං බඳිමින්



එක්සත් ජනපදයේ ඊශ්‍රායල තානාපති කාර්යාලය 2018 වසරේ මැයි මාසයේදී ජෙරුසෙලමට ගෙන ඒ යැයි RT පුවත් සේවය වාර්තා කර තිබිණි. එය ඊශ්‍රායලය පිහිටුවීමේ 70වැනි සංවත්සරය සමඟ එක විට සිදුකිරීමට එරට බලාපොරොත්තු වේ. මෙය මෙතෙක් එක්සත් ජනපදයේ විදෙස් ප්‍රතිපත්තියේ බරපතළ වෙනස්කමකි.

# ජූලියස් ෆුචික්
# නොසැලුණු පන්හිඳ

දින ගණන් නියම වී ඇති සිය මරණය අබිමුව සිටිමින් තම අධිෂ්ඨානය අත්නොහළ මාධ්‍යවේදියෙකුගේ පරමාදර්ශය වනුයේ චෙකෝස්ලෝවැකියානු මාධ්‍යවේදී ජූලියස් ෆුචික්ය. මරා දැමීමට නියමිතව සිටියදී ඔහු ලියූ ලේඛනයක සටහන් කර තිබුණේ " ජනතාවනි මම ඔබට ප්‍රේම කරමි" යන්නය.  ඒ ඔහුගේ කොමියුනිස්ට්වාදී චින්තනයේ හරය විය. ඒ අභීත මාධ්‍යකරණයේ ආදර්ශය පිළිබඳ ලිපියක් මෙවර නියමුවා පාඨක ඔබ වෙත ගෙන එන්නේ පෙබරවාරි 23වැනි දිනට යෙදුණු ඔහුගේ උපන්දිනය වෙනුවෙනි.





"ස්ථානීය පරිමාණයෙන් ඉතා හදිසි කාර්ය ඉටු කළ විට යමෙකුගේ විප්ලවීය උද්යෝගය මොට වේ නම් සහ නිර්ධනපංති ජාත්‍යන්තරවාදය යමෙකුට අමතක වේ නම්, යමෙකු නායකත්වය සපයන විප්ලවය චාලක බලයක්ව පැවැත්ම නතරව සුවපහසු නිදිමතකට කිඳ බසී. භූමිය දිනා ගැනීම සඳහා අපේ සමාදානයෙන් තොර සතුරා වන අධිරාජ්‍යවාදය විසින් එම තත්වය උපයෝගී කර ගනු ඇත. නිර්ධන පංති ජාත්‍යන්තරවාදය යුතුකමක් පමණක් නොව විප්ලවීය අනිවාර්යතාවයක්ද වේ. අපේ ජනතාවට අප උගන්වන්නේ එසේය."


**චේ ගුවේරා**
**සමාජවාදය සහ මිනිසා සහ වෙනත් රචනා, 29 පිටුව**

පැසිස්ට්වාදයේ ප්‍රහාරයන් හා වධ හිංසන ඔහුගේ සිරුර මත මුද්‍රා හැරුණි. එහෙත් අනෙකා වෙනුවෙන් හැඬවෙන හදවතක් දැරූ ඔහුගේ දෙතොල් විවර කිරීම පහසු නොවුණි. චෙකොස්ලෝවැකියාවේ ෆැසිස්ට් විරෝධී සහෝදරවරුන්ගේ තොරතුරු ලබා ගැනීමට කෙතරම් උත්සාහ දැරුවද ඔහු ගෙස්ටාපෝ රහස් පොලිසියට එකදු වචනයක් හෝ නොපැවසීය.

පැන්ක්‍රැක් (PANKRAC) බන්ධනාගාරයේ 267 වන සිර මැදිරිය, ජූලියස් ෆුචික් නැමැති වානේ වන් ජනමාධ්‍යවේදියා සිය මරණ සහතිකය අපේක්ෂාවෙන් සිටි අවසන් දින කිහිපය දුටුවේය. නමුත් චෙකොස්ලෝවැකියානු කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම පුවත්පතේ ප්‍රධාන කර්තෘවරයා මුරණ්ඩු මිනිසෙක් විය. ඇතැම් විට නාසිවාදීන්ගේ පීඩාවට පත් මිනිසුන් විසින් ලබාදුන් දැවැන්ත ශක්තියක් ඔහු තුළ තිබෙන්නට ඇත. බන්ධනාගාර වෛද්‍යවරයාට අනුව ඔහුට තිබුණේ අශ්වයෙකුගේ ශක්තිමත්භාවයකි.

ඔහුව අත්අඩංගුවට ගැනුණේ 1942 අප්‍රේල්වලදීය. 1943 සැප්තැම්බර් 08වැනි දින ඔහු බර්ලින් නුවරදී ඝාතනය කෙරිණි. ඔහුගේ කාර්යභාරයට ගරුකිරීමක් වශයෙන් හා අවසන් හුස්මපොද තෙක් පාවා නොදුන් ගෞරවණීය මිනිසුන් නියෝජනය වෙනුවෙන් එදින 'ජාත්‍යන්තර ජනමාධ්‍ය දිනය' ලෙස නම් කරනු ලැබිණි. ෆැසිස්ට්වාදය ෆුචික්ට ජීවත්වීමට ඉඩදුන්නේ අවුරුදු 40ක් පමණි. ඔහු උපත ලැබුවේ 20 වන සියවස උදාවේදී එනම් 1903 පෙබරවාරි 23 වන දින ප්‍රාග් නුවරදීය. ඔහු ඉපිදී තිබුණේ ප්‍රේමවන්තයින්ගේ මාසයේදීය.

ෆුචික්, පැන්ක්‍රැක්හි සිරගතව සිටියදී ලියනු ලැබූ ලිපි ඔහුගේ අවසන් කෘතිය ලෙස 'පෝරකයේ සටහන්' නමින් එළිදැක්විණි. ඔහු නිවැරැදි ලෙසින්ම බලාපොරොත්තු වුවද තවමත් ඔහු තමන්ගේ අවසන් දිනය නිශ්චිතව නොදැන සිටියේය. එම දිනය ඔහු සිරගෙයට පැමිණි දා සිට වැඩි ඈතක නොවන බව පමණක් ඔහු දැන සිටියේය.





ඔහුගේ මරණයට යන්තම් මාස තුනක් පමණක් ඉතිරිව තිබියදී සිය බිරිඳට ඇති සෙනෙහස එසේ තිබියදීම ඈ වෙනුවෙන් 267 වැනි සිරමැදිරිය තුළ ගීත ලියවෙන අතරම, ඔහු ඔවුන්ට කොළ කැබැල්ලකින් ඇමතීය.

**"ගස්ට්නා, ඔවුන්ට අපගේ ජීවිත උදුරා ගත හැකිය. නමුත් අපගේ ආදරය හා අභිමානය කිසිදා උදුරාගත නොහැකි වනු ඇත. අපට අවශ්‍ය දේ. මේ තරම් වීර්යයකින් හා ජීවිත පරිත්‍යාග කිරීමේ සූදානම්කින් අප කරන ලද දේ ඔවුන්ට උදුරාගත නොහැකි වනු ඇත. මන්ද අප මරා දැමනු ලැබුවද ඔබගේ ප්‍රීතිමත්භාවයේ කුඩාතම කොතැනක හෝ අප ජීවත් වනු ඇත. අප අපගේ ජීවිත කැප කළේ එකී ප්‍රීතිය වෙනුවෙනි. සමුගැනීම කෙතරම් ශෝකජනක වුවද එය අපට ප්‍රීතිය ගෙන දෙන්නේය."**

එය සැබෑ විය. ඔවුහු නැවත කිසිදා එකිනෙකා නොදුටුහ. ඇය එක් වධ කඳවුරක දී අතිමහත් වධ බන්ධනයන්ට ලක්ව ජීවිතය බේරා ගැනීමට සමත් වූවාය. ඔහු සිරගතව සිටියදී ලියන ලද ලිපි ප්‍රකාශයට පත් කිරීමට ඇයට හැකි විය.

ෆුචික් කිසිදිනෙක සිය හිස පහත් කළේ නැත. නිදහසට ආශාවෙන් ඔහු තමන්ගේ ජීවිතය ගිනිතබා විනාශ කළ ෆැසිස්ට් නරුමයින් ඉදිරියේ දණින් වැටුණේ නැත. තමන්ගේ ජීවිතය සටනකදී අවසන් නොවුවත් තමන්ට වැඩිමනත් දෙයක් ලිවීමට අවස්ථාව නොලැබෙන බව ඔහු හොඳින් දැන සිටියේය. මිනිසාගේ කාර්යභාරය සහ අරගලය අනාගතයේදී මිනිසා වීරෝදාර හදවතක් සහිත පරිපූර්ණ මිනිසෙකු බවට පත්වන තුරුම අවසන් නොවන්නේ යයි ඔහු ලියුවේ ඒ අනුවය.

මෙම චෙක් ජාතික ජනමාධ්‍යවේදියා සිය මාතෘභූමියේ සැබෑ නිදහස වෙනුවෙන් අවසන් මොහොත දක්වාම වචනයෙන් හා රහසිගත ක්‍රියාකාරීත්වයෙන් සටන් වැදුණි. ධෛර්යය ඔහුගේ නාමය හා බැඳී පවතී.

"දැන් කතාන්දරයට මාස ගණනකි. නුදුරේදීම එය දින ගණනක් දක්වා හැකිළෙනු ඇත. නිසැකවම ඔවුන් කෲරතම මිනිසුන්ය. සටනේ අවසන් තත්පරයේ, අවසන් උණ්ඩයෙන් හද පසාරු කරමින් වැටෙන අවසන් සෙබළා වන්නේ නම් එය කෙතරම් ශෝක ජනකදැයි මම නිතර සිහි කළෙමි. නමුත් කවරෙකු හෝ අවසන් පුද්ගලයා විය යුතුය. මට එය දැනගත හැකි නම් මේ මොහොතේ වුව ඒ සඳහා යාමට මා සූදානම්ය."


නාසි වධ බන්ධන හමුවේ බොහෝ පිරිස් විශ්වාසය අත්හරිද්දී ඔහු සිය සිහිනය අත්නොහැරියේය. මිනිසාගේ ශ්‍රේෂ්ඨත්වය හා ගෞරවනීයභාවය දිනා ගත හැකි බව අන් අයට පවා ඒත්තු ගැන්වූ ජනමාධ්‍යවේදියෙකු ලෙස ජූලියස් ෆුචික්ගේ නාමය අදටත් ඉතිරිව ඇත. ඔහු දැන සිටි එක් දෙයක් ඔහු විසින් ලියා තබා තිබුණි.

'කාර්යය කරන්නා මියෙන සුළුය. එහෙත් කාර්යභාරය සදාතනිකය'.

ෆුචික් විනාශ කළ නොහැකි ජනමාධ්‍යවේදියාණෙනි, සත්‍යය එයය.

(කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම පුවත්පත වන 'ග්‍රැන්මා' පුවත්පතින් උපුටා ගන්නා ලද්දකි.)

"ගස්ට්නා, ඔවුන්ට අපගේ ජීවිත උදුරා ගත හැකිය. නමුත් අපගේ ආදරය හා අභිමානය කිසිදා උදුරාගත නොහැකි වනු ඇත. අපට අවශ්‍ය දේ. මේ තරම් වීර්යයකින් හා ජීවිත පරිත්‍යාග කිරීමේ සූදානම්කින් අප කරන ලද දේ ඔවුන්ට උදුරාගත නොහැකි වනු ඇත. මන්ද අප මරා දැමනු ලැබුවද ඔබගේ ප්‍රීතිමත්භාවයේ කුඩාතම කොතැනක හෝ අප ජීවත් වනු ඇත. අප අපගේ ජීවිත කැප කළේ එකී ප්‍රීතිය වෙනුවෙනි. සමුගැනීම කෙතරම් ශෝකජනක වුවද එය අපට ප්‍රීතිය ගෙන දෙන්නේය."



# කාන්තා දිනය හමුවේ අභියෝග

2018 ජාත්‍යන්තර කාන්තා දිනය එළඹෙන්නේ පළාත් පාලන මැතිවරණයක් පසු කරමිනි. මෙවර මැතිවරණයේදී කාන්තා නියෝජනය වැඩි කිරීමට පියවර ගැනීම විශේෂයකි. එය ඉතා හොඳ ප්‍රවේශයකි. එහෙත් කාන්තා දේශපාලනයේ ඉතිහාසය දෙස බැලූ විට ජනාධිපති, අගමැති, කැබිනට් ඇමති, මන්ත්‍රී ධුර දරූ කාන්තා චරිත රට තුළ වරින් වර බිහි වුවද කාන්තාවන්ගේ ප්‍රශ්න පිළිබඳව විශේෂ අවධානය යොමු කළ හෝ ඒ සම්බන්ධයෙන් විශේෂ වැඩසටහන් දියත් කිරීමට උත්සාහ කළ දේශපාලනඥවරියන් මේ යැයි කීමට තරමේ කෙනෙක් නොමැති වීම කණගාටුවට කරුණකි.

මෙවර මැතිවරණයෙන් තේරී පත් වූ කාන්තා නියෝජිතවරියන් පිළිබඳව ඊට වෙනස් වූ බලාපොරොත්තුවක් තබා ගත නොහැක්කේ 25% සම්පූර්ණ කිරීමට කාන්තාවන් ඇතුළත් කළා විනා පක්ෂ දේශපාලනය තුළ නිරත වූ සංවිධාන නායකත්වයකින් හෙබි කාන්තාවන් ඒ අතරින් ඇත්තේ ඉතා ස්වල්ප දෙනෙක් පමණක් වන හෙයිනි. ප්‍රදේශයේ කාන්තාවන්ගේ ගැටලු සම්බන්ධයෙන් එවන් නියෝජිතවරියන් මැදිහත් වී කටයුතු කරාවි යැයි සිතීමට ඇත්තේ ඉතාමත් අඩු ඉඩකි.

රටේ ඡන්දදායකයින්ගෙන් 56%ක් කාන්තාවන් බව පැවසේ. එහෙත් මැතිවරණයේදී ඡන්දය පාවිච්චි කළ බහුතරයක් කාන්තාවන් නැවතත් සුපුරුදු පරිදි ජනප්‍රිය දේශපාලනය තුළ, පොරොන්දු දේශපාලනය තුළ මංමුලාවේ වැටී ඇති බව පෙනේ. මෙම ආයතන තුළ වංචා දූෂණ චෝදනාවන්ට ලක් වූ දේශපාලන පක්ෂ, නායකයන් ඔසවා තැබීම තුළ පිළිඹිබු වන්නේ වසර 70ක දේශපාලන ඉතිහාසය තුළ සිදු වූ දෙයම නැවත නැවතත් දැන හෝ නොදැන අනුමත කරමින් සිටින බව නොවේද?

ප්‍රාදේශීයව හා ජාතික මට්ටමින් රට පිළිබඳ තීන්දු තීරණ ගන්නා ආයතනවලට පත් කර යවන දේශපාලන පක්ෂ නියෝජිතයින් හා තමන් එදිනෙදා මුහුණ දෙන ගැටලු අතර අන්තර් සම්බන්ධකමක් පවතින බව මැතිවරණ සමයේදී, ඡන්දය පාවිච්චි කිරීමේදී රටේ බහුතරයක් කාන්තාවන්ට සිහියට එන්නේ නැත. එනිසා සිදුව ඇත්තේ නැවත ඊළඟ මැතිවරණය එනතෙක් තමන් මුහුණ දෙන ගැටලුවලදී හූල්ලමින්, බැන අඩගසමින් කාලය ගත කිරීමටය.

> **ප්‍රතිරූප වන්දනාමාන කරන තත්වයේ සිට ප්‍රතිපත්ති මත දේශපාලනය කරන පිරිසක් බවට කාන්තාවන්ගේ සිතීම වෙනස් කිරීමේ අභියෝගය අප හමුවේ ඇත.**

එදිනෙදා මුහුණ දෙන ආර්ථික ගැටලුවලට, තම දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් මතුවන ගැටලුවලට, සෞඛ්‍යමය ගැටලුවලට, තම වගාවන් ආශ්‍රිතව මතුවන කෘෂිකාර්මික ගැටලුවලට, තම රැකියා ස්ථානයේ මතුවන ගැටලුවලට හේතු පාදක වන්නේ තමන් විසින්ම පත් කර ගත් ආණ්ඩුවල, දේශපාලනාධිකාරියේ ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග බව තේරුම් නොගැනීම බරපතළ කාරණාවකි.

ජනප්‍රිය රැල්ල තුළ, පුද්ගලික ප්‍රතිලාභ තුළ, පොරොන්දු දේශපාලනය තුළ මංමුලාවේ වැටීමේ ප්‍රතිවිපාක තමන්ට පමණක් නොව අනාගත දරු පරම්පරාවටත් උරුම වීම තවත් බරපතළය. ඉතිහාසය පුරා දිගින් දිගටම සිදුවෙමින් එන මෙම සිද්ධි දාමය කොතැනින් හෝ නතර කළ යුතු නොවේද?

සමාජය සංවර්ධනය වනවිට සමාජයේ මිනිසුන්ගේ සිතුම් පැතුම් දියුණු විය යුතු වුවත් ලංකාවේ සිදුව තිබෙන්නේ එහි අනිත් පැත්තය. වර්තමානයේ අපේ රටේ සිටින්නේ ප්‍රතිපත්ති ගැන සිතන, ඒ මත තීරණ ගන්නා අය නොව පුද්ගල ප්‍රතිරූපවලට ආදරය කරන, ව්‍යාජ ප්‍රතිරූප වන්දනාමාන කරන, ප්‍රබන්ධ ලෙස ගොඩ නැගූ පුද්ගල ප්‍රතිරූප උන්මාදයෙන් මෙන් වැළඳ ගන්නා පිරිසකි. මෙහිදී කාන්තාවන්ගේ තත්වය වඩාත් බරපතළය. එබැවින් ප්‍රතිරූප වන්දනාමාන කරන තත්වයේ සිට ප්‍රතිපත්ති මත දේශපාලනය කරන පිරිසක් බවට කාන්තාවන්ගේ සිතීම වෙනස් කිරීමේ අභියෝගය අප හමුවේ ඇත.

ඒ සඳහා කාන්තාවන් ලෙස අප නිවැරදි අවබෝධයක්, දැක්මක් ගොඩනගා ගත යුතුය. අප මුහුණ දෙන ගැටලු පිළිබඳව, ඒ ගැටලු පැන නැගීමට හේතු වූ කාරණා පිළිබඳව, ඊට සාර්ථක විසඳුම් ළඟා කර ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව කාන්තාවන් ලෙස අප දැනුවත් විය යුතුය. එසේ නිවැරදි අවබෝධයක් තුළ කරනු ලබන අරගලයන් තුළ පමණක් තම ගැටලු විසඳා ගත හැකි බව වටහා ගත යුතුය.

සෑම වසරකම සමරනු ලබන ජාත්‍යන්තර කාන්තා දිනය නම් කරනු ලැබුයේද ඉතිහාසයේ තම අයිතීන් වෙනුවෙන් අරගල කළ කාන්තාවන් නිසාවෙනි. කාන්තාවන් දිනාගත් යමක් ඇත්නම් ඒවා පාලකයින් විසින් බන්දේසි මත තබා ලබා දුන් ඒවා නොව අරගල කිරීම් තුළින් ලබාගත් ඒවාය. මාර්තු 08 දිනට යෙදෙන කාන්තා දිනයේදී කාන්තාවන් ලෙස අප අවබෝධ කර ගත යුත්තේද එයයි.



**"ප්‍රතිසංස්කරණ, කම්කරු පංතියේ තත්වය වැඩි දියුණු කළද ධනවාදය විසින් කම්කරුවා බැඳ දමන දම්වැල්වල්වල බර සැහැල්ලු කළද ඒවා ධනවාදය පොඩිපට්ටම් කර දැමීමට සහ කෲර පාලනයෙන් කම්කරුවන් මුදාලීමට ප්‍රමාණවත් නොවේ."**

**ක්ලාරා සෙට්කින්**

(1910 සමාජවාදී කාන්තාවන්ගේ දෙවන ජාත්‍යන්තර සමුළුවට ජාත්‍යන්තර කාන්තා දින යෝජනාව ගෙන ආ ඇය සමාජවාදී නායිකාවකි.)

## එළිය දක්නා ළඳ...

**රජවරු එති - යති**
**කති බොති සැනසෙති**
**සුර සැප විඳ නිති**
**යහතින් වැජඹෙති...**

**රජවරු වෙන්නට**
**දර දිය අදිනට**
**වෙහෙසුන කතුනට**
**හිමි වුණ සැප මොන?**

**තුන් යම නිදි නැති**
**කඳුළු රසට බොති**
**සුසුම් එකතු කර**
**ලිප ගිනි මොළවති...**

**රූප තිරය මත**
**දෑස විවර කර**
**සිහිනෙක පියඹන**
**තටු නැති ළඳ නුඹ...**


**සිහිනෙන් අවදිව**
**දෑස් විවර කර**
**බලන්, කතුන් ලොව**
**ජයගත් අරුමය...**

**ඔල්වර නගලා**
**රජුන් තනන නුඹ**
**අඳුර පරදවා**
**එළිය දකින ළඳ...**



දැනුම, සමාජය හා චින්තනය 25

# මිනිසුන්ගේ චින්තනය වෙනස් කළ නොහැකිද?



මෙම ලිපි මාලාව තුළදී පසුගිය ලිපි ගණනාවක් මගින් අපි එක් ප්‍රධාන කරුණක් සාකච්ඡා කළෙමු. ඒ සමාජයක සමාජ විඥානය හැසිරෙන ආකාරය පිළිබඳවය. මේ දිනවල ලංකාවේද මිනිසුන් හැසිරෙන ආකාරය පිළිබඳවද ඇතැමුන් තුළ විමතියක් මතුව තිබේ. සමාජයක් තුළ පැහැදිලිව පෙනෙන සත්‍යයන් පවතිද්දී මිනිසා උමතුවකින් මෙන් අසත්‍යය හා වැරැද්ද වැළඳගෙන කටයුතු කිරීම ගැන සමාජයේ බොහෝදෙනා කම්පාවී සිටිති. මේ මිනිසුන් කිසිවිටක වෙනස් කළ නොහැකිද යන පැනය පවා මතුව තිබේ. එහෙත් එය එසේ නොවේ.

නිශ්චිත සමාජයක සමාජ විඥානය හා පුද්ගල විඥානය හසුරුවන, පාලනය කරන හා පවත්වාගෙන යන ප්‍රධාන සාධක කීපයක් මීට පෙරද අපි සාකච්ඡා කළෙමු. යළිත් සඳහන් කරන්නේ නම් ඒවා වනුයේ අදාළ සමාජයේ දේශපාලන ආධිපත්‍යය උසුලන දේශපාලන බලවේග, එම සමාජයේ ආර්ථික ආධිපත්‍යය උසුලන පංති බලවේග, විශේෂයෙන් ධනවාදය තුළ වෙළඳපොළ බලවේග, එසේම ඊට අනුව හැසිරෙන ආගමික හා සදාචාරමය සංස්ථාවන් හා මේ සියල්ලගේ මත ජනතාව වෙත රැගෙන යන ජනමාධ්‍ය හා ඊට අදාළ බලවේගද වේ.



"ද්‍රව්‍යමය ජීවනයේ නිෂ්පාදන ක්‍රමය විසින් සමාජමය දේශපාලනමය හා චෛතසික ජීවනයේ ක්‍රියාදාමයන් පොදු වශයෙන් හැඩගස්වනු ලැබේ. මිනිසුන්ගේ සත්තාව නිර්ණය කෙරෙන්නේ ඔවුන්ගේ විඥානය විසින් නොවේ. ඊට ප්‍රතිකූල වශයෙන් ඔවුන්ගේ විඥානය නිර්ණය කෙරෙන්නේ ඔවුන්ගේ සමාජ සත්තාව විසිනි."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 01වෙළුම, 20-21 පිටු**

## සමාජයක් තුළ සිත ප්‍රමුඛද?

කිසියම් සමාජයක් තුළ යම් සමාජ ක්‍රමයක් පවතිද්දී ඊට එරෙහි මතවාදයක් ප්‍රධාන මතවාදය ලෙස දිගටම පවත්වාගෙන යා නොහැක. දිගටම ප්‍රධාන මතය ලෙස සමාජ විඥානය තුළ පවතින්නේ පාලක කණ්ඩායම්වල ආධිපත්‍ය දරන පංති බලවේගවල මතයන්ය. ජාතිවාදය, ආගමික අන්තවාදය නිතර පෙරට එන්නේ, එකී පංති මතවාදයන් ගේ වුවමනාව සඳහාය. දේපළ හිමි පාලක පංති ඒවා නඩත්තු කරන්නේ, මිනිසුන් මිත්‍යාව තුළ ගිල්වා තබමිනි. එය එසේ නම් මෙම මිනිස් චින්තනය, සමාජ විඥානය වෙනස් කළ නොහැකි යයි ඉන් නිගමනය වේද? නැත. සමාජ විඥානය වෙනස් වන වෙනස් කළ හැකි දෙයකි.

එක්තරා සමාජ ආර්ථික ක්‍රමයක් වෙනස් වී ඒ වෙනුවට නව සමාජ ආර්ථික ක්‍රමයක් ආදේශ වූ විට එම නව සමාජ ක්‍රමය සමාජයේ ආධිපත්‍යය දරන තත්වය තුළදී ඊට ගැලපෙන ලෙස සමාජ චින්තනය වෙනස් වේ. එය මානව ඉතිහාසය සනාථ කර තිබේ. ලංකාව උදාහරණයකට ගත් විට ලංකාවේ පූර්ව ධනවාදී සමාජය තුළ ජීවත්වූ මිනිසාගේ චින්තනය හැඩ ගැස්වූ මතවාද, ආචාරධර්ම, සිරිත් විරිත්, ආගමික ඉගැන්වීම් ආදී සියල්ල ධනවාදය තහවුරුවීම සමග වෙනස් විය. ධනවාදය තුළදීද මුල්කාලීන ධනවාදයට වඩා විවෘත ආර්ථිකය නිර්මාණය කිරීමෙන් පසු ගෙවුණ වසර 40ක කාලය තුළ සමාජ විඥානය හා පුද්ගල විඥානය විශාල වශයෙන් වෙනස් විය. එහිදී නව ආකල්ප, සිරිත් විරිත්, සදාචාරයන්, ආචාරධර්ම සමග පැරණි දේ ගැටුණද ක්‍රමානුකූලව පැරණි සිරිත් විරිත්, ආකල්ප අභිබවා නව දේ තහවුරු විය. ආගම් පවා අලුත් තත්වයට අනුව හැඩ ගැසී ඇති බව අපට පෙනේ. ඉන් තහවුරු වන්නේ කිසියම් සමාජ ආර්ථික ක්‍රමයක් තහවුරු වන විට ඊට අනුරූපීව සමාජ විඥානයද වෙනස් වන බවය. තනි වාක්‍යයකින් කිවහොත් කිසියම් නිශ්චිත සමාජයක ආධිපත්‍යය දරන හා රජයන අදහස් හා මතවාද වූ කලී එම යුගයේ ද්‍රව්‍යමය බලවේගය නියෝජනය කරන දේපළ හිමි පාලක පංතියේ අදහස් හා මතවාද වන්නේය.

## සමාජ චින්තනය වෙනස් වන හැටි

කෙසේ වුවත් මින් අදහස් වන්නේ, නිශ්චිත සමාජයක පවතින මතවාද හෙවත් සමාජ විඥානය එම සමාජය පවතිද්දී කිසි විටෙක වෙනස් නොවන බව නොවේ. පංති ප්‍රතිවිරෝධතා සහිත සමාජයක සමාජ විඥානය තුළ ආධිපත්‍ය දරන පංතියේ මතයට අමතරව අනාගත සමාජය නියෝජනය කරන බලවේගයන්ගේ මතයන්ද පවතී. එහෙත් ඒවා පොදුවේ පවතින්නේ ප්‍රධාන මතවාදයන් ලෙස නොවේ. උදාහරණයක් ලෙස ධනවාදී සමාජය තුළ අවිද්‍යාත්මක මිත්‍යා මත බහුල වශයෙන් පවතින අතරම ඊට එරෙහි විද්‍යාත්මක භෞතිකවාදී මතයන්ද පවතී. එහෙත් ඒවා හැම විටම ප්‍රධාන හා ආධිපත්‍යය දරන මතය වන්නේ

> සමාජ විඥානය සමාජ ව්‍යාපාර විසින් සිදුකරනු ලබන මතවාදී හා අධ්‍යාපනික අරගලයක් මගින්ම පමණක් වෙනස් නොවන අතර අනෙක් අතට ජීවන අත්දැකීම් කොතරම් කටුක වුවත් එවැනි අරගලයකින් තොරව හුදකලාව ඉබේ වෙනස් වීමක්ද සිදු නොවේ. ඉන් පැහැදිලි වන්නේ, ජන විඥානය වෙනස් කිරීමට සමාජ ව්‍යාපාරයන්ගේ අඛණ්ඩ මතවාදී මැදිහත් වීමත්, ජනතාව ලබන පීඩාකාරී අත්දැකීම්වල එකතුවත් සමපාතවීම අවශ්‍ය වන බවය.

නැත. එසේම මේ ප්‍රතිවිරෝධී මතවාදයන් අතර ගැටුමක්ද දිගටම පවතී. එසේ වුවත් කිසියම් අවස්ථාවක පවතින සමාජය බරපතළ අර්බුදයකට ගොස් ඒ තුළ තවදුරටත් මිනිසාට තම පැවැත්ම රඳවා ගැනීම නොහැකි වියවුල්කාරී තත්වයකදී එක් වරම අධිපති පංති මතවාදය දුර්වලවී ඊට එරෙහිව පැවති නව මතවාදය සමාජ විඥානය තුළ මොහොතකට ප්‍රධාන මතය වන අවස්ථා මතුවේ. සමාජයක් වෙනස් කිරීමට මිනිසුන් එක් වන්නේ එවන් අවස්ථාවලය. එම තත්වය උපයෝගී වී සමාජය වෙනස්ව අලුත් සමාජයක් බිහි වන තත්වයකදී එලෙස ප්‍රබල වූ නව මතවාදය දිගටම පවතින අතර එය එතැන් සිට ආධිපත්‍ය දරන මතය බවට පත්වේ. එසේ නොවී පැවති පැරණි සමාජයම යළි තාවකාලිකව හෝ තහවුරු වුවහොත් නව මතවාදය බිඳවැටී මිනිසා පැරණි මතවාදය තුළම ගිලීයාම සිදුවේ. සමාජ සංවර්ධනය සිදු වන්නේ එසේය.

## සමාජ විඥානයේ දයලෙක්තිකය

සමාජ විඥානය තුළ හා පුද්ගල විඥානය තුළ පවතින පැරණි, යල්පැනගිය, ප්‍රතිගාමී, අවිද්‍යාත්මක මතවාද, අදහස් හා චාරිත්‍ර වාරිත්‍රයන් වෙනස් වීමට බලපාන සාධක රැසක් පවතින අතර ප්‍රධාන සාධක දෙකක් පවතී. එනම් සමාජ විඥානය වෙනස්වීමේ දයලෙක්තිකයක් තිබේ. එක් අතකින් සමාජය තුළ පවතින ප්‍රගතිශීලී නව බලවේග විසින් නිරන්තරයෙන් හා අත්නොහැර කරනු ලබන මතවාදී අරගලය හෙවත් මතවාදී මැදිහත්වීමත්, ජනතාව තම ජීවිත අත්දැකීම් තුළින් ලබන පාඩම් ප්‍රමාණාත්මකව වර්ධනය වී එක් මොහොතක ගුණාත්මක තත්වයකට පත්වීමත්, එනම් ජනතාව ජීවන අරගලය තුළ ලබා ගන්නා අත්දැකීම සමග ප්‍රගතිශීලී බලවේග යන්ගේ මතවාදයන් සමපාත වීමත් සමග ජනතාව තුළ පවතින සමාජ විඥානය, ක්ෂණික පරිවර්තනයකට ලක්වේ. එබැවින් සමාජ විඥානය සමාජ ව්‍යාපාර විසින් සිදුකරනු ලබන මතවාදී හා අධ්‍යාපනික අරගලයක් මගින්ම පමණක් වෙනස් නොවන අතර අනෙක් අතට ජීවන අත්දැකීම් කොතරම් කටුක වුවත් එවැනි අරගලයකින් තොරව හුදකලාව ඉබේ වෙනස් වීමක්ද සිදු නොවේ. ඉන් පැහැදිලි වන්නේ, ජන විඥානය වෙනස් කිරීමට සමාජ ව්‍යාපාරයන්ගේ අඛණ්ඩ මතවාදී මැදිහත් වීමත්, ජනතාව ලබන පීඩාකාරී අත්දැකීම්වල එකතුවත් සමපාතවීම අවශ්‍ය වන බවය.


ලොව කිසිදු සමාජයක්, රටක්, ජනතාවක් එකම මතයක් තුළ එකම ආකාරයෙන් සදාකාලිකව පවතින්නේ නැත. එසේම ඒවා වෙනස් කිරීමට ප්‍රගතිශීලී හා විප්ලවකාරී බලවේග යන්ට කොතරම් හදිසි වුවමනාවක් තිබුණත් එම හදිසිය විසින් පමණක්, එම මැදිහත්වීම මගින් පමණක් වෙනස් කළ හැකි වන්නේද නැත. ඒ සඳහා ජනතාව තම ජීවිතයෙන් ඉගෙන ගැනීම හා තවදුරටත් පැරණි ලෙසම පැවතීමට නොහැකි තත්වයක් උදාවීමද අවශ්‍ය වේ.

## මාක්ස්වාදයට අනුව...

විෂය මූලිකව ජනතාව තම ජීවිතයෙන් ඉගෙන ගන්නා බවත් තවදුරටත් පැරණි මගේ යාමට නොහැකි තත්වයන් මතුවන බව හා එහිදී ජනතාවගේ චින්තනය වෙනස් කළ හැකි බවත් තේරුම් ගනිමින් සමාජය වෙනස් කිරීමට මැදිහත් වන බලවේග කළ යුත්තේ තම අරගලය දුර්වල නොකර නව උපක්‍රම හා නව විධික්‍රම මගින් එය අඛණ්ඩව පවත්වාගෙන යාමය. මෙයට අවුරුදු 160කට පෙර කොමියුනිස්ට් ප්‍රකාශනය ලියමින් ධනවාදය ගැන මාක්ස් හා එංගල්ස් සඳහන් කළ බොහෝ දේ දැන් සමාජය තුළ අප අත්විඳින නිසා එහි සත්‍යතාවය හොඳින්ම ඔප්පු වී තිබේ. ඒ අනුව මාක්ස් එංගල්ස් කොමියුනිස්ට් ප්‍රකාශනයේ එක් තැනක සඳහන් කළ මෙම විග්‍රහයෙන් මෙම ලිපිය අවසන් කරමු.

**"සිය පෞරාණිකවූත්, පූජනීයවූත්, ප්‍රාග් විනිශ්චයන් සහ මත සහිත පාෂාණීභූත යකඩ මල බැඳුණු සියලු සබඳතාවයන් විනාශවී යන අතර අලුතින් ඇතිවන සියලු සබඳතාවයන් අස්ථිකරණයට භාජනය වීමටත් පෙර ඒවා යල්පැන යයි. ඝන වූ හැම දෙයක්ම උණුවී වාතය බවට පෙරළෙයි. ශුද්ධ වූ හැම දෙයක්ම කෙළෙසෙන්නේය. අවසානයේදී මිනිසාට, තම ජීවන තත්වයන් සහ තම වර්ගයා සමග ඇති අන්‍යෝන්‍ය සබඳතාවයන් දෙස සන්සුන් සිතින් බැලීමට අවශ්‍යතාවයක් ඇතිවේ."**

# රාජ්‍ය බැංකුවලට වැටෙන පෞද්ගලීකරණ බැල්ම



රාජ්‍ය බැංකු පෞද්ගලීකරණ ක්‍රියාවලියට වසර 30ක ඉතිහාසයක් ඇත. 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් පසු එය කරළියට එන්නේ 1990න් පසුවය. 1987 සිට 1990 දක්වා රට තුළ තිබූ අර්බුදකාරී තත්වය සමනය වන්නේ 1990 මැද භාගයේදීය. 1991 වසරේ ආණ්ඩුවේ අයවැය ලේඛනය ඉදිරිපත් කරමින් රාජ්‍ය බැංකු වාණිජකරණය නමින් පෞද්ගලීකරණය සඳහා යෝජනාව ඉදිරිපත් කර ඇත. එවකට මුදල් ඇමති ඩී. බී. විජේතුංග මහතා අයවැය යෝජනාවලියට එම යෝජනාව ඇතුළත් කරමින් අයවැය විවාදයේදී රාජ්‍ය බැංකු බංකොලොත්වී ඇති බවත් රාජ්‍ය බැංකුවලට ප්‍රාග්ධනය පිටතින් සැපයිය යුතු බවත් ප්‍රකාශ කිරීම තුළ රාජ්‍ය බැංක විශාල අර්බුදයකට මුහුණ දෙන ලදී. ගනුදෙනුකරුවන් රාජ්‍ය බැංකුවලින් තැන්පත් මුදල් ඉවත් කර ගන්නා තැනට අර්බුදය උත්සන්න විය. රාජ්‍ය බැංකු සේවකයෝ මෙම අර්බුදකාරී තත්වය තුළ මහජනතාව දැනුවත් කිරීම සඳහා රට පුරා රැස්වීම් පවත්වමින් රාජ්‍ය බැංකු රැක ගැනීමේ අරගලයට මැදිහත් වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍ය බැංකුවල ප්‍රාග්ධන ඌනතාවය රජය මැදිහත්වී පිරවීමටත් වාණිජකරණය නමින් ගෙන ආ පෞද්ගලීකරණ ක්‍රියාවලිය තාවකාලිකව පරාජයට පත් කිරීමටත් හැකි විය. මෙහිදී මතක් කර ගත යුතු කරුණක් වන්නේ, 1991 වර්ෂයේ පැවති අයවැය විවාදයේදී වර්තමාන අගමැති ගරු රනිල් වික්‍රමසිංහ මහතා රාජ්‍ය බැංකු පෞද්ගලීකරණ ක්‍රියාවලියට පක්ෂපාතීව දීර්ඝ කථාවක් කර තිබීමය.

ඊට පසුව 1994 සිට 2000 දක්වා ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ කාලයේදී රාජ්‍ය බැංකු ප්‍රතිව්‍යුහගත ක්‍රියාවලිය නමින් පෞද්ගලීකරණ ක්‍රියාවලිය ආරම්භ විය. ඒ අනුව 1996 සිට රාජ්‍ය බැංකුවලට බඳවා ගන්නා සේවකයින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම අහිමි කරන ලද අතර පෞද්ගලීකරණ ක්‍රියාවලිය පහසු කිරීමට බැංකුවල ඉහළ තනතුරු සඳහා උපදේශකයින් විශාල ප්‍රමාණයක් බඳවා ගන්නා ලදී. ඔවුන්ගේ ප්‍රධාන කාර්ය භාරය වූයේ රාජ්‍ය බැංකු පෞද්ගලීකරණ ක්‍රියාවලියට අවශ්‍ය ක්‍රියා මාර්ග පවත්වාගෙන යාම හා වර්ධනය කිරීමය. ඉන් පසුව 2001 - 2004 බලයට පැමිණි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව බැංකු ඒකාබද්ධකරණය නමින් නැවත පෞද්ගලීකරණ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. එම රජයේ අගමැතිතුමා ලෙස කටයුතු කළේ වර්තමාන අගමැති රනිල් වික්‍රමසිංහ මහතාය. එම බැංකු ඒකාබද්ධකරණ ක්‍රියාවලියට විරුද්ධව රාජ්‍ය බැංකු සේවකයෝ විශාල අරගලයක් කළහ. 2004 මුල් භාගයේදී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව වෙනස් වීම නිසා බැංකු ඒකාබද්ධ ක්‍රියාවලියද අතරමඟ නැවතිණි. නැවතත් 2005-2014 කාලයේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ පාලනය යටතේ බිඳ වැටුණු මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ මුවාවෙන් පෞද්ගලීකරණ ක්‍රියාවලිය ආරම්භ කළද එය සාර්ථක කර ගැනීමට නොහැකි විය. එමෙන්ම මහජන බැංකුව පිහිටුවීමේදී එහි අයිතිය සම්බන්ධයෙන් පැවති පනතේ වගන්ති වෙනස් කිරීමට නීති කෙටුම්පත් සකස් කළත් එම කාල පරිච්ඡේදයේදී එය සාර්ථක කර ගැනීමට නොහැකි වීම නිසා එම ආණ්ඩුවේ ක්‍රියාවලිය පසුබෑමකට ලක් විය. මහින්ද රාජපක්ෂ පාලනයේ අවසාන සමයේදී රාජ්‍ය බැංකු විදෙස් බැංකුවලට උකසට තබමින් වැඩි පොලියට වාණිජ ණය ගැනීම නිසා රාජ්‍ය බැංකු අනතුරුදායක තත්වයට පත් විය.

> "පැවති සහ පවතින ආණ්ඩුවල ප්‍රබලයින්ගේ මැදිහත් වීමෙනුත්, ඉහළ සිටින දූෂිත නිලධාරීන්ගේ මැදිහත් වීමෙනුත් නොගෙවන ණය ප්‍රමාණය වැඩි වීමෙන් ප්‍රාග්ධන ඌනතා අර්බුදය තවදුරටත් උග්‍රවී ඇත. ඒ අනුව රාජ්‍ය බැංකුවලට මෙම කල දසාව උදා වී ඇත්තේ මේ රටේ පාලකයින් සහ බැංකුවල ඉහළ නිලධාරීන් ගන්නා ලද අනුවණ සහ දූෂිත ක්‍රියා මාර්ග නිසාය.

### ප්‍රාග්ධන වත්කම් අවුල

2015 රනිල්, මෛත්‍රී යහපාලන ආණ්ඩුව යටතේ නැවතත් රාජ්‍ය බැංකු පෞද්ගලීකරණ ක්‍රියාවලිය කරළියට පැමිණ ඇත. වත්මන් ආණ්ඩුව සහ රාජ්‍ය බැංකු පාලකයින් ප්‍රකාශ කර සිටින්නේ, රාජ්‍ය බැංකුවල ප්‍රාග්ධන වත්කම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව පහළින් තිබෙන නිසා එම ප්‍රාග්ධන වත්කම් ප්‍රතිපූර්ණය කිරීමට රාජ්‍ය බැංකු 10% කොටස් නිකුතුවකට යා යුතු බවයි. ජාත්‍යන්තර වාණිජ බැංකුවල ප්‍රමිතීන් සහ බැංකුවල ආරක්ෂාව සලකා බැලෙන්නේ බාසල් (Bazal) සම්මුතිය පදනම් කර ගෙනය. වර්තමානයේ බාසල් iii සම්මුතිය අනුව මෙරට රාජ්‍ය බැංකුවල ප්‍රාග්ධන වත්කම් ව්‍යුහය වෙනස් කළ යුතුව ඇත. මේ මොහොත වන විට එම සම්මුතීන්ට අනුව රාජ්‍ය බැංකු ප්‍රාග්ධන ඌනතාවයකින් පෙළීම සත්‍යයකි. ප්‍රශ්නය වන්නේ, රාජ්‍ය බැංකු ප්‍රාග්ධන ඌනතා තත්වයකට පත්කළේ කවුද යන්නය. අද දක්වාම රාජ්‍ය බැංකු සියල්ලම ලාභ ලබන ආයතන වේ. පසුගිය වසර තුනම ප්‍රධාන රාජ්‍ය බැංකු තුනෙන්ම වාර්ෂිකව බිලියන සියයකට ආසන්න මුදලක් ලාභ ලෙස රජයේ ඒකබද්ධ අරමුදලට ලබා ගෙන ඇත. එම නිසා රාජ්‍ය බැංකු උපයන ලාභයෙන් කොටසක් එම බැංකුවල ප්‍රාග්ධන ඌනතා පිරවීමට ඉඩ නොදෙන ලදී. ඉතිරි වූ කුඩා ලාභ කොටසෙන් රාජ්‍ය බැංකුවල ප්‍රාග්ධන ඌනතා සැපිරීම ප්‍රමාණවත් නොවීය.

රාජ්‍ය බැංකුවල ප්‍රාග්ධන වත්කම් අඩු වීමට බලපෑ අනෙක් ප්‍රධාන කාරණය ආණ්ඩුවල බලවන්තයින්ගේ මැදිහත්වීම තුළ රාජ්‍ය බැංකුවල අරමුදල් ණය මුදල් ලෙස අවභාවිත කිරීමය. මේ වන විට ප්‍රධාන රාජ්‍ය බැංකුවල අනිතකර ණය සංචිත වර්ධනය වැඩිවී ඇත. පැවති සහ පවතින ආණ්ඩුවල ප්‍රබලයින්ගේ මැදිහත් වීමෙනුත්, ඉහළ සිටින දූෂිත නිලධාරීන්ගේ මැදිහත් වීමෙනුත් නොගෙවන ණය ප්‍රමාණය වැඩි වීමෙන් ප්‍රාග්ධන ඌනතා අර්බුදය තවදුරටත් උග්‍රවී ඇත. ඒ අනුව රාජ්‍ය බැංකුවලට මෙම කල දසාව උදා වී ඇත්තේ මේ රටේ පාලකයින් සහ බැංකුවල ඉහළ නිලධාරීන් ගන්නා ලද අනුවණ සහ දූෂිත ක්‍රියා මාර්ග නිසාය. එසේ තිබියදීත් ඔවුන් යෝජනා කර සිටින්නේ එම ප්‍රාග්ධන ඌනතාවයෙන් මිදීමට පළමු වටයේ 10% ක කොටස් නිකුතුවක් රාජ්‍ය බැංකු විසින් අනිවාර්යයෙන්ම සිදු කළ යුතු බවය. ඉන් පසුව ක්‍රමානුකූලව කොටස් නිකුත් හරහා රාජ්‍ය බැංකුවල රජයේ අයිතිය පෞද්ගලික මූල්‍ය ජාවාරම්කරුවන් අතට පත් කිරීම වත්මන් ආණ්ඩුවේ උපාය මාර්ගය වී ඇත.

### පාඩුව කාටද?

මෙම පෞද්ගලීකරණ ක්‍රියාවලියෙන් පහර වදින්නේ ප්‍රධාන වශයෙන් මෙම රාජ්‍ය බැංකු සමඟ ගනුදෙනු කරනු ලබන සාමාන්‍ය ජනතාවට සහ එහි සේවක ප්‍රජාවටය. මේ රටේ පොදුජනතාවට රාජ්‍ය බැංකු සේවාවන් තුළින් පහළ පොලී අනුපාත යටතේ ණය ලබා ගැනීම, වෙනත් සේවාවන් සඳහා මුදල් අය නොකිරීම, කොමිස් අනුපාතය කුඩා එකක් වීම සහ තැන්පත්කරුවන්ගේ මුදල්වලට රජයේ රැකවරණය ලැබීම වැනි කාරණා සාමාන්‍ය පොදු ජනතාවට රාජ්‍ය බැංකුවලින් ලැබෙන සහනයන් වේ. රාජ්‍ය බැංකුවල අයිතිය ක්‍රමානුකූලව මූල්‍ය ජාවාරම්කරුවන් අතට පත් කිරීම තුළ ඉහත කී සහන අහිමි වීම අනිවාර්ය වේ. එමෙන්ම රාජ්‍ය බැංකුවල සේවකයින්ගේ අයිතිවාසිකම්ද පෞද්ගලීකරණ ක්‍රියාවලිය තුළ කප්පාදු වෙමින් තිබේ. මේ වන විට කප්පාදු කළ විශ්‍රාම වැටුපක් ක්‍රියාත්මක වීමත් වාර්ෂිකව ලබා දෙන පාරිතෝෂික දීමනා කප්පාදු කිරීමත් බැංකු සේවකයින්ට විශාල වැඩ කන්දරාවක් පටවා තිබීමත් යන කාරණා රාජ්‍ය බැංකු සේවකයෝ අත්විඳිමින් සිටිති. පෞද්ගලීකරණ ක්‍රියාවලිය සම්පූර්ණ වුවහොත් රාජ්‍ය බැංකු සේවකයින් සතු අයිතිවාසිකම් අහිමි වීම අනිවාර්ය වේ. එනිසා රාජ්‍ය බැංකු රැක ගැනීම රාජ්‍ය බැංකු සේවක ප්‍රජාවගේ මෙන්ම මේ රටේ පොදු ජනතාවගේ අද දවසේ වගකීම හා යුතුකම වන්නේය.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2018 පෙබරවාරි 06

# කොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන් මාතෘ භූමිය මුදා ගැනීම දක්වා අරගලය ඉදිරියට දියත් කරමු

(දූෂණ හා වංචා පිළිබඳ පාර්ලිමේන්තු විවාදයට සහභාගි වෙමින්)

පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක සහෝදරයා

අපේ රටේ මහජනයාගේ ධනය සොරකම් කිරීම, නාස්ති කිරීම, අවභාවිතාව පිළිබඳව විශාල සංවාදයක් දැන් රටේ මතු වී තිබෙනවා. හැබැයි, එවැනි වංචා, දූෂණවලට එරෙහි සංවාදයක් තිබුණාට කිසි සේත්ම එහි තිබෙන බරපතළකම, එයින් අපේ රටේ සමාජයට ඇති කර තිබෙන බලපෑම, අපේ රටේ ඈත ගම්වල ජීවත්වන දූවා දරුවන්ගේ අධ්‍යාපනයට, රැකියාවට, කෘෂිකර්මාන්තයට, ජන ජීවිතයට ඇති කොට තිබෙන බලපෑම ඒ හා බරින් යුක්තව සාකච්ඡාවට බඳුන් වන්නේ නැහැ.

## වංචාවේ හා දූෂණයේ පංගුව

ඒ නිසා බැඳුම්කර කොමිෂන් සභා වාර්තා සහ අනෙකුත් වාර්තා පිළිබඳ අවධානය යොමු කරන්නට පෙර, මෙය මොන තරම් අපේ රටේ ආර්ථිකය සහ සමාජ දේහයේ පිළිලයක්ද යන්න කෙරෙහි මා අවධානය යොමු කරන්නට කැමැතියි.

2008 වසරේ පැවැති පාලනය විසින් ශ්‍රීලංකන් එයාර් ලයින්ස් ආයතනය පවරා ගත් බව අපි දන්නවා. ඒ හැම එකක්ම කළේ ආර්ථික ප්‍රතිපත්තියක් මත නොවෙයි. පෞද්ගලික හේතූන් මත පවරා ගෙන, 2018 දක්වා මේ ශ්‍රීලංකන් එයාර් ලයින්ස් ආයතනය පාලනය කරනවා. මේ අවුරුදු දහය තුළ ශ්‍රීලංකන් එයාර් ලයින්ස් ආයතනයේ පාඩුව රුපියල් කෝටි 12,500යි. ඒ විතරක් නොවෙයි. එයාර් ලංකා ආයතනය VVIP කාමර සහිත ගුවන් යානා හතරක් ප්‍රංශයෙන් මිලදී ගැනීම සඳහා ගිවිසුමක් අත්සන් කොට තිබුණා. ඒ ගුවන් යානා අපට යෝග්‍යද, නැද්ද යන්න වෙනම කථාවක්. ඒ ගිවිසුම් හතර cancel කිරීම සඳහා පසුගියදා එයාර් ලංකා ආයතනය රුපියල් කෝටි 1,800ක් - ඩොලර් මිලියන 115ක් - ගෙවා තිබෙනවා.

ලෝකයේ ආර්ථිකය පිළිබඳව යම් හෝ අවබෝධයක් තිබෙන කෙනෙක් ඒ මොහොතේ ගිහිල්ලා ග්‍රීසියේ බැඳුම්කර මිලදී ගන්නේ නැහැ. හැබැයි, අපේ මහ බැංකුවේ හිටපු අධිපතිවරයකු වන කබ්රාල්, ග්‍රීසියෙන් ඩොලර් මිලියන 52ක බැඳුම්කර මිලදී ගෙන තිබෙනවා. නමුත්, අද සතයකට වෙච්ච දෙයක් නැහැ. එහි පාඩුව මේ වන විට රුපියල් කෝටි 806යි. ඒ වාගේමයි, ඇවන්ට්ගාඩ් ගනුදෙනුව. විශේෂයෙන්ම රාජ්‍ය වෙත ලැබී තිබුණු ධනය පෞද්ගලික ආයතනයන්ට පැවරීම හේතුකොටගෙන ඇවන්ට්ගාඩ් ගනුදෙනුවෙන් සිදුවූ පාඩුව වන රුපියල් කෝටි 1,140ක් සම්බන්ධයෙන් දැන් මහාධිකරණයේ නඩු ගොනු කර තිබෙනවා.

ඊළඟට, තෙල් මිලදී ගැනීම. විශේෂයෙන්ම, පසුගිය අගෝස්තු මාසයේ තෙල් මිලදී ගැනීම පිළිබඳ නියමිත පරිදි ටෙන්ඩරය කැඳවා තිබෙනවා. එම ටෙන්ඩරය නියමිත පරිදි කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් නොකොට, ක්ෂණික තෙල් මිලදී ගැනීම් නිසා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ පාඩුව එම ටෙන්ඩරයට අනුව සහ ක්ෂණිකව මිලදී ගත් ඒවා අතර වෙනස රුපියල් කෝටි 1,400යි. ඒ වාගේම, හෙජින් ගිවිසුම හරහා සිදුවී ඇති පාඩුව රුපියල් කෝටි 1,020යි. ඒ වාගේම, දැන් මේ සාකච්ඡාවට බඳුන් වන බැඳුම්කර ගනුදෙනුව නිසා සිදුවී ඇති පාඩුව රුපියල් කෝටි 1,100යි. ඒ කියන්නේ මොකක්ද? මේ රට පාලනය කරන ලද මේ පාලක කණ්ඩායම මහජනයාගේ ධනය තමන්ට සිතු සිතු පරිදි, රිසි සේ අවභාවිත කරපු; හොරකම් කරපු; නාස්ති කරපු ඉතිහාසයක් තිබෙනවා.

**2015 ජනවාරි මාසයේ 08වැනිදා එම මැතිවරණ වේදිකාවේ විශාල ලෙස සාකච්ඡාවට බඳුන් වුණේ, එවකට පැවති පාලනයේ වංචා සහ දූෂණයන් පිළිබඳව; එහි අකාර්යක්ෂමතාව පිළිබඳව; එහි මුදල් අවභාවිතාව පිළිබඳවයි. ඕනෑවටත් වඩා සංඛ්‍යා දත්ත, තොරතුරු, සාක්ෂි සහිතව ඒවා සමාජයේ සාකච්ඡාවට බඳුන් වෙමින් තිබුණා. ඒ නිසාම ජනවාරි මාසයේ 8වැනිදා මේ පාලනයට ලැබුණු ජන වරමේ පිටුපස තිබුණු හරය අන් කවරක්වත් නොවෙයි. මේ වංචනිකයන්ට දඬුවම් දීම, වංචා කරන ලද දේපොළ අත් පත් කර ගැනීම සහ වංචාවෙන් වැළැක්වීමයි. හැබැයි, ආණ්ඩුව ගොඩනගා කෙටි කාලයක් ඇතුළත වංචනිකයන්ට දඬුවම් දෙනවා වෙනුවට, වංචනිකයන් ආරක්ෂා කිරීමේ පිළිවෙතකට අවතීර්ණ වුණා. වංචා කරපු දේපොළ පවරා ගන්නවා වෙනුවට, ඒ දේපොළවලින් යම් පංගුවක් තමන්ටත් අත් පත් කර ගත හැකිද කියන සාකච්ඡාවට අවතීර්ණ වුණා.** ඒ නිසා සමහර අමාත්‍යවරු ඉතාමත් ඍජු ලෙස මැදිහත් වෙමින්, එම වංචා කරන ලද ධනයෙන් කොටසක් තමන් වෙත අත් පත් කර ගැනීම සඳහා, අදාළ පරීක්ෂණ යට ගැසීම්, පරීක්ෂණ ඉදිරියට ගෙන යාමට බාධා කිරීම් සිදුවූ බව මේ පාර්ලිමේන්තුවේ ඕනෑවටත් වඩා වැඩියෙන් හෙළිදරවු වී තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ඇති වුණු විවාදයක් හේතුකොටගෙන, එම වංචනිකයන් පිළිබඳව ඉදිරිපත් කරන ලද කරුණු මත හිටපු නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාට තම අමාත්‍ය ධුරයෙන් පවා ඉල්ලා අස්වෙන්න සිදුවී තිබුණා. ඒ නිසා, වංචාවට අඬුවම් දෙන්න එන අය වංචනිකයන්ගේ දේපොළ පවරා ගන්නවා වෙනුවට වංචනිකයන් ආරක්ෂා කර, වංචා කරන ලද දේපොළ බෙදා ගැනීම සඳහා වූ සාකච්ඡාවකට අවතීර්ණ වුණා.



2015 ජනවාරි මාසයේ 08වැනිදා එම මැතිවරණ වේදිකාවේ විශාල ලෙස සාකච්ඡාවට බඳුන් වුණේ, එවකට පැවති පාලනයේ වංචා සහ දූෂණයන් පිළිබඳව; එහි අකාර්යක්ෂමතාව පිළිබඳව; එහි මුදල් අවභාවිතාව පිළිබඳවයි. ඕනෑවටත් වඩා සංඛ්‍යා දත්ත, තොරතුරු, සාක්ෂි සහිතව ඒවා සමාජයේ සාකච්ඡාවට බඳුන් වෙමින් තිබුණා. ඒ නිසාම ජනවාරි මාසයේ 8වැනිදා මේ පාලනයට ලැබුණු ජන වරමේ පිටුපස තිබුණු හරය අන් කවරක්වත් නොවෙයි. මේ වංචනිකයන්ට දඬුවම් දීම, වංචා කරන ලද දේපොළ අත් පත් කර ගැනීම සහ වංචාවෙන් වැළැක්වීමයි. හැබැයි, ආණ්ඩුව ගොඩනගා කෙටි කාලයක් ඇතුළත වංචනිකයන්ට දඬුවම් දෙනවා වෙනුවට, වංචනිකයන් ආරක්ෂා කිරීමේ පිළිවෙතකට අවතීර්ණ වුණා. වංචා කරපු දේපොළ පවරා ගන්නවා වෙනුවට, ඒ දේපොළවලින් යම් පංගුවක් තමන්ටත් අත් පත් කර ගත හැකිද කියන සාකච්ඡාවට අවතීර්ණ වුණා.

## ගජ මිතුරු බැඳුම්කරය

ඊටත් වඩා භයානකම තත්වය තමයි, මහා පරිමාණ වංචා, දූෂණවලට හවුල් වෙන්න පටන් ගැනීම. ඒකේ සංකේතාත්මක ගනුදෙනුව තමයි, පෙබරවාරි මාසයේ 27 වැනිදා සිදුවූ මේ බැඳුම්කර ගනුදෙනුව. බැඳුම්කර ගනුදෙනුව කිසිසේත්ම මේ අවුරුදු තුනක වංචා, දූෂණ ධුරාවලිය නොවෙයි. 2015 පෙබරවාරි මාසයේ 27වැනිදා සිදුවුණු බැඳුම්කර ගනුදෙනුව මෙම වංචා, දූෂණවල සංකේතයයි. නමුත්, මුළු ධුරාවලියම නොවෙයි. ඒ ධුරාවලිය පිළිබඳව වෙනත් දවසක සවිස්තරාත්මකව මෙම පාර්ලිමේන්තුවේ විවාද කරන්න අප ලෑස්තියි. හැබැයි මේ එහි සංකේතයයි. 2015 පෙබරවාරි මාසයේ 27වැනි දා මේ ගනුදෙනුව සිද්ධ වුණාට පසුව 2015 මාර්තු මාසයේ 9වැනිදා මාධ්‍ය සාකච්ඡා පවත්වා අපි මේ කරුණු හෙළිදරවු කළා.

2015 මාර්තු මාසයේ 17වැනි දා මේ පාර්ලිමේන්තුවේදී මවිසින් 23(2) යටතේ ප්‍රකාශයක් කරලා මේ බැඳුම්කර ගනුදෙනුව පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉල්ලා සිටීමත්, ගනුදෙනුවේ ස්වභාවයත් හෙළිදරවු කිරීමත් කළා. ඒ පිළිබඳව 2015 මාර්තු මාසයේ 17වැනි දින හැන්සාඩ් වාර්තාවේ සඳහන්ව තිබෙනවා. එදින 23(2) යටතේ අවසානයේදී මා අසා සිටි ප්‍රශ්න කිහිපය මේ හැන්සාඩ් වාර්තාවේ තිබෙනවා. බැඳුම්කර ගනුදෙනුව සිද්ධ වෙලා දින 20කට පසුවයි මා මේ පිළිබඳව හෙළිදරවු කරන්නේ. මේ ගනුදෙනුව සිද්ධ වෙලා අවුරුදු තුනක් වෙන්න තව පොඩි කාලයයි අඩු. හැබැයි, මෙහි අවාසනාවන්ත තත්වය මෙයයි. 2015 මාර්තු මාසයේ 17වැනි දා මේ අසා තිබෙන ප්‍රශ්නවලට 2018 ජනවාරි මාසයේ පළමුවැනි දා බැඳුම්කර කොමිෂන් සභා වාර්තාව නිසි පරිදි ඉදිරිපත් වන තෙක් නියමිත පරිදි පිළිතුරු මේ රටට ලැබුණේ නැහැ. එහි සැලකිය යුතු පංගුවක් "කෝප්" සභාව හරහා ඉදිරිපත් කරලා තිබුණත්, පෞද්ගලික සමාගමක් වන පර්පෙචුවල් ට්‍රෙෂරිස් සමාග මේ මේ මැදිහත්වීම පිළිබඳව මේවාට පිළිතුරු ලබා දුන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුව තිබෙන්නේ කුමකටද? සිදුවීම සිදු වන මොහොතේදීම ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරන කොට විශේෂයෙන්ම මහ බැංකුව බාර අමාත්‍යවරයා හැටියට කටයුතු කරපු අග්‍රාමාත්‍යවරයා නිසි බරින් සහ නිසි වගකීමෙන් යුතුව මේ ප්‍රශ්න පිළිබඳව සොයා බැලිය යුතුව තිබුණා. මම නොවෙයි, බැඳුම්කර කොමිෂන් සභා වාර්තාවම සඳහන් කොට තිබෙනවා, අග්‍රාමාත්‍යවරයා පිළිතුරු ලබාදීමේදී ඒ අවශ්‍ය බර සහ සැලකිල්ල තබා නොගත් බව. ඒකයි පෙන්නුම් කරන්නේ. ඒ නිසා මේ විනාශය දික් ඇදෙන්න පෙර, මහජනයාගේ මහා ධනස්කන්ධයක් නාස්ති වෙන්න පෙර වළක්වා ගත හැකිව තිබුණු, අපරාධකරුවන් සොයා ගත යුතුව තිබුණු, අපරාධකරුවන්ට දඬුවම් ලබා දිය යුතුව තිබුණු අවස්ථාවක්.

ඒ අවස්ථාව අවුරුදු තුනක් පස්සට ඇදගෙන ගියේ ඇයි? තමුන්නාන්සේලාගේ යහපාලනය පිළිබඳ සුන්දර වැකි අද වැඩක් නැහැ. අද තමුන්නාන්සේලාගේ සියලු ක්‍රියාමාර්ග අන්තිමට බිත්තියට හේත්තු වුවාට පසුව ගනු ලබන ක්‍රියාමාර්ග. මේ වාගේ ක්‍රියාමාර්ග අපි ඕනෑතරම් දැක තිබෙනවා. මේවා අවසානයේදී බිත්තියට හේත්තුවුවාට පසුව, කර කියාගත නොහැකි තත්වයක් ඇති වුණාට පසුව ගනු ලබන ක්‍රියාමාර්ග. එසේ නැත්නම්, අපේ ගම්වල කියනවා වාගේ කරවටක් ගිලුණු පසු බේරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග. එම නිසා අග්‍රමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ප්‍රකාශ කිසිසේත්ම අවංකභාවයෙන් කරන ලද ප්‍රකාශ නොව, වංක භාවය - බිත්තියට හේත්තු වූවාට පසුව ආරක්ෂා වීම සඳහා කරනු ලබන ප්‍රකාශ. එතැන් සිට ඇතිවෙච්ච දියත්වීම් සියල්ල; මාරපන කමිටුව, රවි කරුණානායක උප නායකයා පිළිබඳ තීරණ මේ සියල්ල බිත්තියට හේත්තුවූවාට පසුව ඉන් මිදීම සඳහා දරන ලද ඉතාමත් අසාර්ථක, අසරණ තීරණ.

හැබැයි අද බැඳුම්කර කොමිෂන් වාර්තාව මොකක්ද කියන්නේ? ඒ වාර්තාවේ කියනවා, මහේන්ද්‍රන් මහතා රුපියල් මිලියන දහ දහස් පණස් අටක වටිනාකමක් ඇති බැඳුම්කර නිකුත් කරන ලෙසට නියෝග කර ඇති අතර, එමගින් සාවද්‍ය ලෙස පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාග මට වෙන්දේසියේදී වැඩි අගයක් ලබා ගැනීමට හැකි වී ඇත. පෙබරවාරි 27 වෙනි දින වෙන්දේසියෙන් ලාභ ලැබීම සඳහා මහේන්ද්‍රන් මහතා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට අභ්‍යන්තර තොරතුරු ලබා දී ඇත.

අද මොකක්ද කියන්නේ? එදා මේ පාර්ලිමේන්තුවේදී මහේන්ද්‍රන් ආරක්ෂා කිරීමේ ප්‍රමුඛතම කාර්යභාරය අග්‍රාමාත්‍යවරයා හැටියට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මා කියන්නේ මේක විශ්වාසය නොවෙයි. ගජමිතුරුකමක් කියායි මම විශ්වාස කරන්නේ. ගජමිතුරුකමක්.

## කොමිසමට ගිය වංචාව

ඊළඟට බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය සහ අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව මා අවධානය යොමු කරන්න කැමැතියි.

විශේෂයෙන්ම මෙම වාර්තාව ලබාදුන් දින වකවානු සහ ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ දින වකවානුත් එක්ක සන්සන්දනය කර බලන විට එම වාර්තා 15වැනි පිටුවට

කවුළුව හැර තබමි

# හොරු නැතිවම බැරුවා වගෙයි





පුරා වසර 70ක්ම මේ රට හොරුන්ටම බාරදුන් ඡන්දදායකයා මෙවර පළාත් පාලන මැතිවරණයේදීද එයම කළේය. රටේ ජනයා තමන් ගැලවෙන මාවත වෙනුවට තම පංති හතුරා ගලවන මාවතම නැවතත් තෝරාගෙන තිබේ.

"සර්වජන ඡන්දය යනු පීඩිතයින්ගේ පැසුණු ස්වභාවය දක්වන මිම්ම වන්නේය. වර්තමාන රාජ්‍යය තුළ එයට ඊට වැඩි කිසිවක් ලැබිය නොහැකිය. නොලබනු ඇත". යැයි ලෙනින් වරක් සඳහන් කළේය.

එහෙත් එම අවම පැසුණු ස්වභාවයවත් විදහා දැක්වීමට මෙවර මැතිවරණයේදීවත් ලාංකේය පුරවැසියාට නොහැකි වීම නම් අතිශය කණගාටුදායක කරුණ වන්නේය.

මෙවර ඡන්දයේදී ජ.වි.පෙ. බලාපොරොත්තු වූ ප්‍රතිඵලය නොලද බව සැබෑය. ඒ ගැන වඩාත්ම සතුටට පත්ව ඇත්තේ, මෙරට මෙතෙක් පාලනය කළ චෞර කල්ලි දෙක තුනය. කොපමණ කරුණු කිවුවද ජනතාව තමන් දෙපා තබාගෙන තිබෙන පටු නරා මාවත්වලින් දෙපා ඉවතට ගැනීමට සූදානම් නැතිනම් ඔවුන්ගේ සහ රටේ ඉරණමද ඉතාම පැහැදිලිය.

තමන් අපේක්ෂා කළ ප්‍රතිඵලය නොලැබුණද හැම අතින්ම යම් හෝ ජයග්‍රහණයක් මේ මැතිවරණයේදී ලබා ඇත්නම් එය ජවිපෙම පමණි. තම පංති සතුරාගේ ජයග්‍රහණය වෙනුවෙන් කිරිබත් කන ජනයාට වැඩිකල් නොගොස්ම තමන් කරගත් බරපතළ වරද ගැන නැවත සිතීමට එම ප්‍රතිඵලය බලකරනු නියතය.

තමන්ට පංතියක් ලෙස ගැලවීමට තිබෙන යා යුතු මාවත වෙනුවට සතුරා ජයකෙහෙළි නංවන මාවතම තෝරා ගැනීමේ ප්‍රතිවිපාක ජනයා තව නොබෝ දිනකින්ම අත්විඳිනු ඇත. මේ චෞර පාලකයන් පුරාවස්තු තබන කෞතුකාගාරයේ සෙසු පුරාවස්තු සමග එක පෙළට තබන තුරුම මේ නරාවළෙන් රටේ ජනයාට නම් ගැලවීමක් නැත.

# 'දෙව්ලොව කැළඹූ' කොමියුනාඩ්වරුන්ගේ වීරත්වය...




1871 මාර්තු 18 පැරිස් නිර්ධන පංතිය පැරිසියේ බලය අල්ලා ගත් විට ඉහත සඳහන් ශීර්ෂය ඔවුනට ගෞරව පිණිස මාක්ස් විසින් යොදන ලදී.

ජර්මනියේ බිස්මාක්ට ප්‍රංශය යටත්වීමට එරෙහිව ප්‍රංශය තුළ මතුවූ ජනතා උද්ඝෝෂණ බිස්මාක්ගේ උපදෙස් පිට එවකට ප්‍රංශයේ අගමැති ලුවී තියර් විසින් මර්දනය කිරීමට පටන් ගත්තේය. ඊට එරෙහිව නැගී සිටි ප්‍රංශ සන්නද්ධ කම්කරුවෝ තියර්ගේ හමුදා පළවා හැර පැරිස් නගරයේ බලය සියතට ගත්හ. 1871 මැයි 28 දින ලොව පළමු නිර්ධන පංති රාජ්‍යය වූ පැරිස් කොමියුනය දින 72කට පසුව මුළුමනින්ම පරාජය කරන ලදී. නිර්ධන පංතියේ රාජ්‍ය බලය සඳහා දැරූ ප්‍රථම ප්‍රයත්නය පරාජයෙන් කෙළවර වුවද, එහිදී දසදහස් ගණනක් දිවි පිදූවද මාක්ස් විසින් මෙම ඓතිහාසික ප්‍රයත්නය මහත් අභිරුචියෙන් අගයමින් ප්‍රංශයේ සිවිල් යුද්ධය නැමැති අගනා කෘතියද කළේය.

ලෝක නිර්ධන පංති ව්‍යාපාරයේ ඒකාන්ත ඉදිරි ගමනක් ලෙස එය හැඳින්වූ මාක්ස් වැඩපිළිවෙලවල් සහ තර්ක සිය ගණනකට වඩා එය වැදගත් ප්‍රායෝගික පියවරක් ලෙස අගය කළේය.

කොමියුනිස්ට් ප්‍රකාශයට කළ එකම නිවැරදි කිරීම මාක්ස් විසින් කළේද පැරිස් කොමියුනය අත්දැකීම් පදනම් කරගෙනය.

එය නම් "සාදා නිමකර තිබෙන රාජ්‍ය යන්ත්‍රය එසේම අත්පත් කරගෙන කම්කරු පංතියට එය තමන්ගේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක කළ නොහැක." යන්නය ඒ.

**කොමියුනිස්ට් ප්‍රකාශනය 1872 ජූනි 24 - අලුත් ජර්මන් සංස්කරණය**

# කාන්තා දිනයට පෙරවදනක්




ජාත්‍යන්තර කාන්තා දිනය මාර්තු 08 දිනට යෙදී ඇත. සුපුරුදු පරිදි මෙවරද සංදර්ශන, සම්මන්ත්‍රණ, තොරොම්බල් කතාවලින් එදින සරසනු ඇත. කාන්තා දිනය සමරන බහුතරයක් එහි සැබෑ අරුත කුමක්ද යන වග නොදන්නා බව නම් අපට නිසැකය. මෙහිදී ඒ ගැන කතා කිරීම අපේ කාරණය නොවේ.

කාන්තා විමුක්තියේ පළමු කොන්දේසිය කාන්තාව ගෘහ වහල්භාවයෙන් මුදවා ගැනීම බව වරක් එංගල්ස් ප්‍රකාශ කළේය.

බොහෝ රටවල පවුල්වල දශලක්ෂ ගණන් කාන්තාවෝ බලාපොරොත්තු සුන්වූ දෛනික පරිශ්‍රමයන්ගේ සහ තමන්ගේම ශ්‍රමය හැර අනෙක් සෑම දෙයකින්ම ඉතිරි කරන දෙයින් සිය පවුලේ අයට යම්තම් සොච්චමකින් ආහාර හා වස්ත්‍ර සැපයීමට ප්‍රයත්න දරමින් "ගෘහස්ථ වහලුන් සේ ජීවත් වෙති" යනුවෙන් ලෙනින් කීවේ මීට වසර 105 කට පෙරය.

ලෝකයේ සියලුම රටවල ධනපතියන් (පුරාණ වහල් හිමියන් හා මධ්‍යතන රදළ අධිපතියන් මෙන්ම) තමන් සඳහා ඉතාමත් 'සාධාරණ' මිලකට ඕනෑතරම් අනියම් බිරියන් තෝරාපත්කර ගන්නේ මේ කාන්තාවන් අතරිනි. එසේම ගණිකා වෘත්තිය ගැන කොයිතරම් 'සදාචාර කෝපයක්' තිබුණද මේ ස්ත්‍රී මාංශ වෙළඳාමට එරෙහිව කිසිවක් කළ නොහැක. වැටුප් වහල් ක්‍රමය පවත්නා තාක්ම ගණිකා වෘත්තියද නිරායාසයෙන්ම පවතිනු ඇත. මනුෂ්‍ය සමාජවල ඉතිහාසය මුළුල්ලේම සියලුම පීඩිත හා සූරාකනු ලැබූ පංතිවලට ප්‍රථමයෙන්ම මිලක් නොගෙවන ලද සිය ශ්‍රමයද දෙවනුව හාම්පුතුන්ගේ අනියම් බිරියන් වශයෙන් සිය ස්ත්‍රීන්ද, ඔවුන්ගේ පීඩකයන්ට දෙන ලෙස නිරන්තරවම බලකරනු ලැබ තිබේ. (ඔවුන්ගේ සූරාකෑමද සංයුක්ත වන්නේ මෙය තුළමය). - ලෙනින් එදා කී දේ මේ මාර්තු 08ටත් වලංගු නොවේද?

වත්මන් ඕස්ට්‍රේලියානු අගමැතිවරයා තමන්ගේ කැබිනට් ඇමතිවරුන්ට කාර්යමණ්ඩලයේ සාමාජිකාවන් සමග ලිංගික සබඳතා තහනම් කිරීමේ නියෝගයක් නිකුත් කළද එහි වැඩි වෙනසක් නොවනු ඇත!

# පොලිටිකල් පංතිය

පොලිටික්ක පංතියට ඇතුල් වුණේ මහ සේනාවක් එක්ක ඉන්දියාවට කඩාවැදුණු මහා ඇලෙක්සැන්ඩර් වගේ. අඩුවකට තිබුණෙ සේනාව විතරයි.

"ගුඩ්... ගුඩ්... මෝනිං... මෝනිං... සර්... සර්... " වසන්තියයි අනුරුද්ධියයි ඉස්සර වෙන්න පොරකෑවා.

"ගුඩ් මෝනිං විතරක් නෙමෙයි ළමයිනේ රටටම ආයෙත් සුභ අනාගතයක්..." පොලිටික්ක කියන දේට බර තියන්න වගේ හම් මල්ල පරිස්සමට මේසෙ උඩින් තිබ්බ.

"අනාගතේ සුභ වෙන්නද සර් යන්නෙ?" කනිය නිදිමතේ ඩෙස් එකෙන් ඔළුව උස්සල එක හීනෙකින් තව හීනෙකට මාරු වෙන්න බැලුව.

"නැත්නම් නැත්නම්... දැක්ක නේද මහින්ද මහත්තයට ලැබුණු ඡන්ද ගොඩ." පොලිටික්ක කිවුවෙ අත් දෙකෙන් කන්දක් අඳින ගමන්.

"ඒ ඡන්ද ගොඩ මීතොටමුල්ලෙ කුණු කන්දට වැඩිය ලොකුද දන්නෙ නෑ..." මංජුව කිවුවෙ හිමිහිට වුණාට පොලිටික්කගෙ කනට වැදුණ.

"මොකද්ද ළමයො ඒකෙ සමානකම. මං කිවුවෙ මහින්ද මහත්තයගෙ ඡන්ද ගාණ. මීතොටමුල්ලෙ කන්දෙ තිබුණෙ එකතු වෙච්ච කුණු." පොලිටික්කට මළ පැන්නට පෙන්නුවෙ නෑ.

"නෑ සර්, මං කියන්න හැදුවෙත් විසාලකම ගැන තමයි... අනික වෙනසක් නෑ, දෙකම කුණු කන්දල්නෙ." මංජුව අන්තිම ටික කිවුවෙ පොලිටික්කට නෑහෙන ගාණට.

"දැක්කනෙ මං නම් දැනගෙන හිටියා, මිනිස්සු මහින්ද මහත්තයගෙ කට්ටිය අතහරින්නෙ නෑ කියල." පොලික්ක දේශපාලන විග්‍රහයක් පටන් ගත්ත.

"ඔව් ඔව්. ආණ්ඩුව මහින්ද මහත්තයගෙ කට්ටිය 'අල්ලන්නෙ' නැතුව අතාරිනකොට අපි දැනගත්ත. මිනිස්සු ආපහු එයාලව අල්ල ගනී කියලා" සමන දෙපැත්තම කැපිල යන්න කිනිස්සක් බැස්සුව.

"නැහැ සමන්... මිනිස්සුන්ට ආණ්ඩුව ඇල්ලුවෙ නෑ." පොලිටික්ක බබා පාට් එකෙන් ආවා. "ආණ්ඩුව හොරකම් කළා. මිනිස්සුන්ගෙ සහන කැපුව."

"සහතික ඇත්ත සර්." සමන කියනකොට පොලිටික්කගෙ කට කනේ. "අනෙක ආණ්ඩුව කියපු දේ නෙමෙයිනෙ කළේ. හොරු අල්ලනව කිවුව. හොරකම් කරපුව ගන්නව කිවුව. මිනීමරුවන්ට දඬුවම් දෙනව කිවුව. අවුරුදු තුනක් ගියා මොකුත් නැති හින්ද මිනිස්සු හිතුව ඔක්කොම බොරු කියල. කවුද ඡන්දෙ ඉල්ලන්නෙ කියල බැලුවෙත් නෑ, පිස්සුවෙන් වගේ ඡන්දෙ ගහගෙන ගියා. නැත්තං බඩල්ගම මිනිස්සුන්ව මහරගමින් පත්කරගනීවියැ. වැඩක් කර ගන්න කෙනෙක් පත්කරගන්න හිතුවනං ගම නගරෙ හදන්න වැඩපිළිවෙළක් තිබුණු, දූෂණයට විරුද්ධ අය දිනවන්න තිබුණානෙ..."

"එතකොට ඔය ළමය කියන්නෙ අපි මෝඩයි කියලද?" පොලිටික්ක කතාව ඇදෙනව බලන් ඉන්න බැරිම තැන ඇහුවත් පස්සෙ හිතුවා අපරාදෙ ඒක අහුවෙ කියල.

"නෑ මම මෝඩයි කියනව නෙමෙයි, බෙල්ල උඩ තියෙන ඔළුව හිතන්නත් පාවිච්චි කරන්න තිබ්බ." සමන ඩෑෂ් එහෙකින් කතාව පටන් ගත්ත. "මොකද අවුරුදු හැත්තෑවක් තිස්සෙ වළවල්වල වැටිල මං හිතුවෙ මොළේට පාඩමක් වෙලා ඇති කියල. ඒත් එහෙම නෑනෙ..." පොලිටික්ක වෙලාව නතරවෙච්චි බිත්ති ඔරලෝසුව දිහා බලාගත්තෙ බෙල් එක ගහන්න කියල ප්‍රාර්ථනාවක් කරගෙන.

05 පිටුවෙන්

## දේශපාලනයේ සැබෑ අර්බුදය...



පමණි. එසේම 2015දී සාධාරණ සමාජයක් වෙනුවෙන්, යහපාලනය වෙනුවෙන් අවංකව ක්‍රියාත්මක වූවන්ගේ අරමුණු රනිල්-මෛත්‍රී හවුල පාවාදී ඇති නිසා එම දේශපාලන වුවමනාව තවමත් නියෝජනය කරන සමාජ බලවේගයන්ට ඒ සඳහා දේශපාලන නායකත්වයක් අවශ්‍ය වේ. එය දැන් සැපිරිය හැක්කේද ජ.වි.පෙ.ට පමණි. මේ තත්වය මත එක් අතකින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ ක්‍රියාමාර්ග යක් සඳහා අවස්ථාව ජ.වි.පෙ. වෙත උදාවී තිබෙන අතර ලංකාවේ සමාජ සාධාරණත්වය ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ගොඩනගන නව දේශපාලන බලවේගයක, දේශපාලන මධ්‍යස්ථානයකට නායකත්වය සැපිරීමේ අවස්ථාවද ජ.වි.පෙ. වෙත පැවරී තිබේ. වත්මන් දේශපාලන අර්බුදය තුළ, දේශපාලන විගඩම්වලට යටින් නිර්මාණය වී ඇති නව දේශපාලන අවස්ථාවන් නිවැරදිව යොදා ගැනීම දැන් ජ.වි.පෙ. ඉදිරියේ ඇති අභියෝගය හා කාර්යය වී ඇති අතර ජ.වි.පෙ.ත් මෙරට ප්‍රගතිශීලී බලවේගත් එම අවස්ථාව, එම දේශපාලන වුවමනාව සැපිරීම වෙනුවෙන් වහා ක්‍රියාත්මක විය යුතුව තිබේ.

මුල් පිටුවෙන්

## බල වුවමනාවන්...

අවධාරණය කළේය.

එසේම රටේ ඇතැම් තැනක ජාතිවාදී බලවේග ක්‍රියාත්මක වෙමින් ඇතැයි හෙළි කළ අනුර දිසානායක සහෝදරයා ආණ්ඩුව කළ යුතුව තිබෙන්නේ, එම ජාතිවාදී හිසඑසවීම් මැඩ පවත්වා රටේ සියලුම ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීම නමුදු ආණ්ඩුව ඒවා ගැටලු ලෙස හඳුනාගෙන නොමැති බවත් ඒ වෙනුවට තමන්ගේ බල පොරය ගැන පමණක් අවධානය යොමුකර කටයුතු කරමින් සිටින බවත් පැවසීය.

"මැතිවරණයෙන් පසුව ආණ්ඩුව කිවුවා, තමන්ට ලැබුණු ප්‍රතිඵලයට අනුව ප්‍රබල කැබිනට් සංශෝධනයක් රටට ලබාදෙනවා කියලා. නමුත් අවසානයේ කැබිනට් සංශෝධනය කිසිදු වැදගැම්මකට නැති නාටකයක් පමණක් බවට පත්වුණා. එම නාටකය තවමත් අවසන් වෙලා නැහැ. මේ සියලු දේවල්වලින් කියවෙන්නේ, ආණ්ඩුව රටට අවශ්‍ය ප්‍රතිසංස්කරණවලට කිසිසේත්ම සූදානම් නැති බවයි.

මේ තත්වය තුළ විවිධ පීඩාවන්ට මුහුණදී තිබෙන ජනතාවගේ ගැටලු, අයිතීන් පදනම් කර ගනිමින් ඒවා දිනා ගැනීම සඳහා පාරේ සටනක් ආරම්භ කිරීමට ජනතා විමුක්ති පෙරමුණ සූදානම්. ආණ්ඩුවේ මේ විගඩම් නාටකයට තවදුරටත් ඉඩදිය යුතු නැහැ. අපේ රටේ ජනතාව ආණ්ඩුවේ විගඩම් නාටකයේ ඇතිවන ව්‍යසනයට ගොදුරු වීමෙන් බේරාගත යුතුව තිබෙනවා. අගමැතිවරයාගේ, ජනාධිපතිවරයාගේ, ආණ්ඩුවේ අර්බුද අරලියගහ මන්දිරයේ හෝ ජනාධිපති මන්දිරයේ තබා ගන්නා ලෙසත් එහිදී විසඳා ගන්නා ලෙසත් අපි ආණ්ඩුවට කියනවා. ජනතාවගේ වුවමනාවන් වෙනුවෙන් ජනතාව සමඟ ආණ්ඩුවට එරෙහිව සටන් කරන්නට ජනතා විමුක්ති පෙරමුණ සූදානම් බව අපි අවධාරණය කරනවා." අනුර දිසානායක සහෝදරයා වැඩිදුරටත් කියා සිටියේය.

## කොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන්...

13 පිටුවෙන්

ටිකක් නිද්‍රාශීලියි; ඒ වාර්තාව එළියට එන්න කලින්ම හමස් පෙට්ටියට ගියාදෝ කියන සැකය අපට ඇති වෙනවා. මෙතෙක් කාලයක් එම වාර්තාවට සිදුවුණු සිදුවීම් දිහා බැලුවාම අපට එහෙම තමයි හිතා ගන්න වෙන්නේ.

මෙම වාර්තාව අනුව ආයතන 34ක් පරීක්ෂා කර තිබෙනවා. මේ පරීක්ෂණ 34 තමයි, ඒ වකවානුව පිළිබඳව කරන ලද මහා වංචා, දූෂණ 34 කියලා මා කිසිසේත්ම කියන්නේ නැහැ. දැනට අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සාකච්ඡාවට බඳුන් වන්නට විශාල කරුණු ප්‍රමාණයක් තිබෙනවා. ඒ වාගේම බරපතළ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයේ පරීක්ෂණයට භාජනය වී ගොනු කර තිබෙන නඩු ගණනාවක් තිබෙනවා. එසේම විගණකාධිපති දෙපාර්තමේන්තුවේත් එවැනි පරීක්ෂණ ගණනාවක් තිබෙනවා. ඒ වාගේම විනිමය පාලන පනතට අනුව කොටස් වෙළඳපොළේ ඇති කරන ලද "ගේම්" පිළිබඳව පරීක්ෂණයක් සිදු වේ යැයි අපි විශාල බලාපොරොත්තුවකින් ඉන්නවා.

විශේෂයෙන්ම තිලක් කරුණාරත්න මහතා කොටස් වෙළෙඳපොළේ ප්‍රධාන නිලයට පත් වුණාට පසුව එතුමා කාර්යක්ෂමව එම ක්ෂේත්‍රයේ ඇති වී තිබුණු වංචා, දූෂණ සහ "ගේම්" පිළිබඳව පරීක්ෂණ වඩාත් ඉදිරියට ගෙන යයි කියලා අපේ විශාල බලාපොරොත්තුවක් තිබුණා. නමුත් දැන් මා තුළ තිබෙන අවබෝධය අනුව එවැනි කිසිදු පරීක්ෂණයක් සිදු නොවන බව තමයි වාර්තා වී තිබෙන්නේ. එවැනි පරීක්ෂණ සුදු කරන්න බැරි හේතු අපට ඉතා පැහැදිලියි, "කලකදි වහ කලකදි රහ වෙනවාලු." ඒ නිසා 2015ට කලින් වහ වෙලා හිටපු බොහෝ අය 2015 ජනවාරි මාසයේ 08 වැනිදායින් පස්සේ රහ වීමේ ප්‍රතිඵලය නිසා තමයි අද විනිමය පාලන පනත අනුව ඒ දේවල් ඉස්සරහට යන්නේ නැත්තේ.

මෙම බරපතළ වංචා, දූෂණ, රාජ්‍ය සම්පත්, වරප්‍රසාද, බලය හා අධිකාරිය අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ආයතන 34ක් පරීක්ෂණයට භාජනකොට රුපියල් මිලියන 3,172ක් අවභාවිතා වී ඇති බව දැනට වාර්තාකොට තිබෙනවා. මහජනයාගේ ධනය රුපියල් කෝටි 317ක්. දැන් ආන්දෝලනයට තුඩු දී තිබෙන ස්වාධීන රූපවාහිනියේ ගනුදෙනුව පිළිබඳව අවධානය යොමු කරවන්න මා සූදානම් වෙනවා. විශේෂයෙන්ම ස්වාධීන රූපවාහිනී ආයතනය මැතිවරණය සඳහා උපයෝගී කර ගැනීම ආදී කරුණු හේතු කොටගෙන ඇති වී තිබෙන පාඩුව රුපියල් මිලියන 235ක්. ITN නාලිකාවේ මුදල් කෝටි 23ක් අවභාවිතා වූ බව සඳහන් වී තිබෙනවා. ඉතින්, නාලිකාවක් ඉතිරි වෙයි කියලා මම හිතන්නේ නැහැ.

මේ පරීක්ෂණ වාර්තාවේ සඳහන් ආකාරයට මේ ආන්දෝලනයට තුඩු දුන් කාරණාව සම්බන්ධයෙන් හය වැනි වගඋත්තරකරුවා ලෙස හිටපු ජනාධිපතිතුමා නම්කර තිබෙනවා. නම් කිරීමට අමතරව මෙසේ සඳහන් කර තිබෙනවා."දැන්වීම්ලත් පාර්ශ්වය වන මහින්ද රාජපක්ෂ යන අය අල්ලස් පනතේ 70 වන වගන්තියෙහි විස්තර කර ඇති "දූෂණය" වරද, දූෂණයට කුමන්ත්‍රණය කිරීමේ වරද, දූෂණයට අනුබල දීමේ වරද යන මෙම වැරදි එකක් හෝ ඊට වැඩි ගණනක් සිදුකර ඇති බව මෙම කොමිෂන් සභාවේ තීරණයයි."

### බලය enjoy කිරීම

අපේ රටේ බලය ගන්න අය ඒ බලය හසුරුවන්නේ බලයෙන් විඳින්න; බලයෙන් ජොලි කරන්න. රට පිළිබඳව, මහජනයා පිළිබඳව, මහජනයා විසින් තමන්ගේ දෙවුර මත පටවන ලද වගකීමක් ලෙස නොවෙයි බලය පිළිබඳව ඔවුන් සලකන්නේ. මහ ජනතාව පාර්ලිමේන්තුවට වේවා, ජනාධිපතිවරයෙකුට වේවා මහා බලයක් අත්පත් කර දෙන්නේ කුමක් වෙනුවෙන්ද? එම බලය අත්පත් කර දෙන්නේ මහජනයා පිළිබඳවත්, රට පිළිබඳවත් මහත් වගකීමකින් යුතුවයි. හැබැයි , මෑත ඉතිහාසය පුරාම මේ පාලකයන් හැසිරී තිබෙන්නේ ජනතාවගේ බර, රටේ වගකීම තමන්ගේ දෙවුර මත පටවා ගන්නා ලද පාලකයන් ලෙස නොවෙයි. ඔවුන් හැසිරී තිබෙන්නේ තමනට සිතු සිතූ පරිදි මහජනයාගේ ධනය නාස්ති කරමින්, හොරකම් කරමින්, දූ කෙළියේ යෙදෙන්න පුළුවන්, enjoy කරන්න පුළුවන් බලයක් ඇති කණ්ඩායමක් ලෙසයි.

බැසිල් රාජපක්ෂ හිටපු අමාත්‍යවරයා පිළිබඳව



මෙම වාර්තාවේ සඳහන් වෙනවා. ඔහුගේ අභ්‍යන්තර ගුවන් ගමන් වෙනුවෙන් අමාත්‍යාංශයෙන් ගෙවා තිබෙනවා රුපියල් මිලියන 155ක්. ඊට පසුව 'ගම නැගුම' ව්‍යාපෘතියෙන් ගුවන් ගමන් සඳහා යොදවා තිබෙනවා, රුපියල් මිලියන 161ක්. ඔහුට නියමිත වාහනවලට වඩා ඔහුගේ අතිරේක වාහන පාවිච්චිය වෙනුවෙන් රුපියල් මිලියන 612යි; ඔහුට නියමිත ආරක්ෂාවට වඩා අතිරේක ආරක්ෂාව වෙනුවෙන් රුපියල් මිලියන 264යි. ඒ නිසා ඔහු සිදු කොට තිබෙන පාඩුව රුපියල් මිලියන 1,200ක් බව මෙම වාර්තාවේ සඳහන් වී තිබෙනවා. මොකක්ද, මේ පෙන්නුම් කරන්නේ? මෙයින් පෙන්නුම් කරන්නේ අන් කවරක්වත්ද? ඒ නිසා මහජනයාගේ ධනය රුපියල් මිලියන 1,200ක් තමන්ගේ පෞද්ගලික සුඛවිහරණ වෙනුවෙන්, ජොලි කිරීම වෙනුවෙන්, enjoy කිරීම වෙනුවෙන් වැය කරන පාලන තන්ත්‍රයක් වෙනස් විය යුතු නැද්ද?

මේ වාර්තා පළ වෙන වේලාවේ කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කරන ලද සාක්ෂි මා දැක්කා. එම සාක්ෂිවලින් ඉතා මැනවින් පෙන්නුම් කරමින් තිබුණේ මොකක්ද? සමහර නාවික හමුදා සෙබළියන් තබා ගෙන හිටියේ නෝනාගේ හැට්ටේ ආය කටුව ගහන්න; එහෙම නැත්නම් සපත්තු දෙක පොලිෂ් කරන්න, සාරිය අන්දවන්න, පොට හරිද කියලා බලන්න. මේ මොකක්ද, වෙලා තිබෙන්නේ? මේ රටේ මහ ජනයාගේ ධනය තමන්ට සිතු-සිතූ පරිදි විනාශ කිරීම සඳහා අවශ්‍ය වන 'ජොලි කිරීමේ' බලයක් තමයි තමුන්නාන්සේලාගේ පාලනය. ඒ වාගේම නියමිත එක්රුස් කොට තිබෙන, වියදම් කිරීම සඳහා අනුබලය දී තිබෙන ධනය, චක්‍රාකාරයෙන් තමන්ගේ හිතවතුන් වෙත අදින්නේ කොහොමද, හිතවතුන් වෙත මහ ජනයාගේ ධනය ඇදලා දෙන්නේ කොහොමද කියන එක මෙම වාර්තාවේ ඉතා පැහැදිලිව සඳහන් කොට තිබෙනවා. ඒක තමයි හම්බන්තොට වරාය විවෘත කිරීමේ උත්සවය.

එක මොහොතකදී තමන්ගේ දේශපාලන කඳවුර මහත් උත්කර්ෂයට නංවන්න. ඒ වෙනුවෙන් පොත-පත ලියන්න, ඒ වෙනුවෙන් චිත්‍රපට හදන්න, ඒ වෙනුවෙන් මහා ප්‍රාඥ වගන්ති කියන්න, ස්තෝත්‍ර ප්‍රසශ්ති ගායනා කරන්න කණ්ඩායම් හදනවා. එම කණ්ඩායම්වල නඩත්තුව මේ ආයතන හරහාම විවිධ ව්‍යාපෘතිවලින් ලබා දෙන බව පැහැදිලියි. එම සිද්ධාන්තයත් මෙම කොමිෂන් සභා වාර්තාවේ පෙන්නුම් කරලා තිබෙනවා.

වරාය අධිකාරිය, හම්බන්තොට වාරායේ උත්සව වියදම් - 2010 වර්ෂයේ 08 වැනි මාසයේ 15, 'කරදියවර මංගල්‍යය' සැරසිලි වියදම රුපියල් මිලියන 49යි; නැතහොත් රුපියල් හාරකෝටි අනුදෙලක්ෂයයි. එම උත්සවයේ සංවිධාන වියදම රුපියල් තුන්කෝටි තිස්හතරලක්ෂයයි. 2010.11.18 වැනි දින එම වරාය විවෘත කිරීමේ උත්සවයේ වියදම රුපියල් හයකෝටි හතළිස්ලක්ෂයයි. එම උත්සවයට යෙදවූ වරාය අධිකාරියේ සේවක වැටුප් බිල රුපියල් දෙකෝටි හතළිස්හත්ලක්ෂයයි. ඒ කියන්නේ වරාය අධිකාරියේ හම්බන්තොට වරාය උත්සවාකාරයෙන් විවෘත කිරීමේ වියදම දාහත්කෝටි දාහතරලක්ෂයයි. මේ මහජනයාගේ ධනය තමන්ගේ හිතවතුන් වෙත අයථා පාරවලින් අදින්නේ කොහොමද කියන සංඥාව මේකෙන් ලබා දීලා තිබෙනවා.

### දූෂිතයින් රකින්නේ කවුද?

ඒ විතරක් නොවෙයි. විශේෂයෙන්ම මෙම වංචා, දූෂණවලට ලක් වූ අය කවරාකාරයෙන්ද දේශපාලන බලය සමග යැපෙන්නේ, ආරක්ෂා වෙන්නේ කියන පණිවුඩයත් මෙම බරපතළ මූල්‍ය අපරාධ පිළිබඳ කොමිෂන් සභා වාර්තාවෙන් ඉදිරිපත් වී තිබෙනවා.

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව පිළිබඳ වාර්තාව භාර දී තිබෙන්නේ 2015 ඔක්තෝබර් මාසයේ 16වන දායි. මහියංගන ප්‍රාදේශීය සභාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව භාර දී තිබෙන්නේ 2016 අප්‍රේල් මාසයේයි. ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය සම්බන්ධ වාර්තාව ගැන මා කලින් කිවුවා. එය භාර දුන්නේ 2016 අප්‍රේල් 28වන දායි. මේ අප්‍රේල්වලට අවුරුදු 2යි. ඊට පසුව සීමාසහිත රක්නා ලංකා ආරක්ෂක සමාගම පිළිබඳ වාර්තාව භාර දී තිබෙනවා, 2016 සැප්තැම්බර් මාසයේ. දැනට අවුරුදු එකහමාරකට කිට්ටුයි. උතුරු මැද පළාතේ හිටපු මහ ඇමති එස්.එම්.රංජිත් සම්බන්ධ වාර්තාව භාර දී තිබෙන්නේ, 2016 ඔක්තෝබර් 27වන දායි. අවුරුදු එකහමාරකට කිට්ටුයි. එහෙම නම් ඒ සමහර වාර්තා බාර දීලා අවුරුදු එකහමාරකට, දෙකකට වඩා වැඩි කාලයක් ගත වී තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේදී ස්ථාවර නියෝග 23(2) යටතේ අවස්ථා කීපයකදී මා ඉල්ලා සිටියා, මෙම වාර්තා මේ පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියා. හැබැයි මේ වාර්තා මේ පාර්ලිමේන්තුවේ සභාගත කෙරුණේ නැහැ.

එතකොට අපට සාධාරණ සැකයක් පැන නගිනවා. මේ වංචා දූෂණයන්ට එරෙහිව තිබෙන විරෝධය යම් දේශපාලන රංගනයක පැතිකඩක් ද පෙන්නුම් කරන්නේ කියලා. ඒකත් අපි නිරාකරණය කර ගත යුතුව තිබෙනවා. මොකද, ඒ වාර්තාව තමන්ගේ අතේ තියාගෙන ඒ දූෂිතයන් එක්ක ආණ්ඩු හදන්න කථා කරනවා නේ. අපි අහන්නේ, ඒක කොහොමද වෙන්නේ කියලායි.

අපේ රටේ මහජනයාගේ ධනය කෝටි-ප්‍රකෝටි ගණනක් හොරකම් කරන නාස්ති කරන, අවභාවිතා කරන දූෂිත වළල්ලක් තිබෙනවා. අපි මේ දූෂිත වළල්ල පරාජයට පත් කරන්න ඕනෑ. මේ දූෂිත වළල්ල පරාජයට පත් කිරීම හුදු පුද්ගලයෙකුගේ "ගනු කඩුව-එනු සටනට" කියනවා වාගේ සටනක් නොවෙයි. මේ දූෂිත වළල්ල එහෙම පරාජයට පත් කරන්න බැහැ. ඒක ව්‍යාජයක්. මේ දූෂිත වළල්ල පරාජය කළ හැකි වන්නේ, ඒ දූෂිත වළල්ලට එරෙහිව ප්‍රබල මහජන ව්‍යාපාරයක් ගොඩනැගීමෙන් පමණයි. එසේ නැතිව මේ දූෂිත වළල්ල පරාජයට පත් කරන්න බැහැ. හැමදාම සිද්ධවෙන දේ තමයි, මේ දූෂිත වළල්ල ඒ ආකාරයෙන්ම ස්ථාපිත වෙලා නව දූෂිතයන්ගෙන් පිරෙන එක. ඒකයි සිද්ධ වෙන්නේ.

මෙහි තිබෙන ඛේදවාචකය මොකක්ද? මෙහි ඛේදවාචකය ගැන අපේ ඈත ගම්වලට ගිහිල්ල බලන්න. ඒ දරුවන්ට ඉගෙන ගන්න පාසලක් නැහැ; ඒ දරුවන්ට අධ්‍යාපනයක් නැහැ; හරිහමන් ආහාර වේලක් නැහැ; ගමේ පාරේ යන්න විධියක් නැහැ; ගැබිණි මවට පෝෂ්‍යදායි ආහාර වේලක් නැහැ. මුළුමනින්ම ඒ අයගේ සමාජ ජීවිතය කඩා වට්ටලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. මේ දූෂිත වළල්ල මහා අපරාධවලට හවුල් වී තිබෙනවා.

### අප සතු මහඟු වගකීම

දශක ගණනාවක් අපේ රටේ ජනතාව මේ අපරාධකරුවන්ගේ කොල්ලකරුවන්ගේ, ය වට්ලිකාරයන්ගේ ග්‍රහණයට හසු වී තිබෙනවා. මේ රටේ ජනතාව කවදාද ඒ අපරාධකරුවන්ගේ, මංකොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන් මිදෙන්නේ? ඒ නිසා ජනතාවට සුවිශේෂී වගකීමක් තිබෙනවා, මේ අපරාධකරුවන්ගේ, කොල්ලකරුවන්ගේ ග්‍රහණයෙන් මේ මාතෘභූමිය මුදවා ගන්න. නැවක් සෝමාලියාවේ මුහුදු මංකොල්ලකරුවන්ට අහුවුණා වාගේ, ශ්‍රී ලංකාව කියන දූපත හැත්තෑ වසරක් මේ මංකොල්ලකරුවන්ගේ, පාදඩයන්ගේ ග්‍රහණයට හසු වී තිබෙනවා. මෙම මංකොල්ලකරුවන්ගෙන් ශ්‍රී ලංකා දූපත මුදා නොගන්නා තාක්කල් අපට ඇසෙයි, ඈත ගමක කන්න දෙයක් නැතිව කෝවක්කා ගෙඩි කාලා මැරෙන දරුවන් ගැන; ණය ගෙවා ගන්න බැරිව වහ බීලා මැරෙන ගොවියෝ ගැන; මාතර ගඟට ගිහිල්ල කිඹුලා කාපන් කියලා දරුවෝ විසි කරන අම්මලා ගැන. මෙම ඛේදවාචකය අවසන් කිරීම සඳහා වන මහඟු වගකීමක් අපට තිබෙනවා.

අපි ඒ හැම දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ, මෙවැනි විවාදයකින් අවසන් වීමෙන් තොරව, මේ කොල්ලකරුවන්ගේ, මේ අපරාධකරුවන්ගේ ග්‍රහණයෙන් මේ මාතෘ භූමිය මුදා ගැනීම දක්වා මේ අරගලය ඉදිරියට දියත් කරමු කියන එකයි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




ආදරයට කුලමල නැති දෑවැදි නැති මිලක් නැති හෙටක්...



රුසියානු කොමියුනිස්ට් පක්ෂ තරුණ සංගමයේ 6 වැනි සමුළුව නියෝජනය කරමින්...



බ්‍රිතාන්‍ය කොමියුනිස්ට් පක්ෂය සමඟ හමුවක...



ප්‍රංශයේදී ශ්‍රී ලාංකිකයින් දැනුවත් කරමින්...



කුවේටයේ 'වැලිකතරේ සිත්තම' කලා උළෙලින්...

# ජනවාරි 08 ජනතා අපේක්ෂා ඉටු කිරීමට ජ.වි.පෙ. ජනතා මධ්‍යස්ථානයක් ගොඩනගනවා

### ජ.වි.පෙ. නායක
## අනුර දිසානායක සහෝදරයා



තවදුරටත් ජනාධිපතිවරයාට හෝ අගමැතිවරයාට ජනතාවගේ බලාපොරොත්තු ඉටුකිරීමට හැකියාවක් නොමැති බව පැවසූ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, ජනවාරි 08 ජනතාවගේ බලාපොරොත්තු ඉටුකිරීමට හැකියාව තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ කරගත් ජනතා ව්‍යාපාරයකට පමණක් බවත් ඒ වෙනුවෙන් ජ.වි.පෙ. ප්‍රමුඛ කරගත් දේශපාලන මධ්‍යස්ථානයක් ගොඩනැගීමට කටයුතු කරන බවත් ප්‍රකාශ කළේය.

ඔහු මේ බව කියා සිටියේ පසුගිය පෙබරවාරි 15වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය හමුවකදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මේ වන විට රට තුළ අස්ථාවර තත්වයක් ඇතිවී තිබෙනවා. එයට සම්පූර්ණයෙන්ම රනිල් වික්‍රමසිංහ සහ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා වගකිව යුතුයි. 2015 ජනවාරි 8වැනිදා පැවති පාලනය බිඳ දමද්දී රටේ ජනතාවට දේශපාලන වුවමනාවක් තිබුණා. ඒ වුවමනාව කැටිකර දැක්වුවේ යහපාලනය කියන වචනයයි. රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම, වංචා දූෂණ නතර කිරීම, දූෂිතයින්ට දඬුවම් ලබාදීම, ආර්ථිකය යහපත් දිසාවකට හැරවීම, යහපත් දේශපාලන සංස්කෘතියක් ස්ථාපිත කිරීම එම අවශ්‍යතාවය වුණා. නමුත් ආණ්ඩුව පාලන බලය ලබාගත් මොහොතේ සිට ජනතා වුවමනාවට පටහැණිව කටයුතු කළා.

මැතිවරණයෙන් පසුව ඇතිවී තිබෙන බල පොරය තුළ ජනතාවගේ ජන ජීවිතය සම්බන්ධයෙන් කිසිදු අවධානයක් යොමු වෙලා නැහැ. රටේ ඇතිවෙලා තිබෙන ආර්ථික අර්බුදය පිළිබඳව ගොවි ජනතාවගේ ප්‍රශ්න, ධීවර ජනතාවගේ ප්‍රශ්න, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවෙලා තිබෙන අර්බුද ගැන ඔවුන්ට කිසිදු අවධානයක් නැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම පැත්තෙන් ගත්තත් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම, නව මැතිවරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම ගැන සාකච්ඡාවක් නැහැ. වංචා දූෂණ අවම කිරීම, දූෂිතයින්ට දඬුවම් ලබාදීම ගැන සාකච්ඡාවක් නැහැ. මුළුමනින්ම මෙම සාකච්ඡාවල අරමුණ වී තිබෙන්නේ ඔවුන්ගේ බලය තහවුරු කර ගැනීමත් ඉදිරියේදී බලය ලබාගැනීමත් පමණයි. එම සියලු පාර්ශ්වයන්ගේ ප්‍රවේශය වී තිබෙන්නේ එයයි.

2001දී රට තුළ ඇතිවී දේශපාලන අස්ථාවරත්වය හමුවේ ජනතා විමුක්ති පෙරමුණේ අපි එය කළමනාකරණය කළේ ජනතාවට වාසි ලබාගත හැකි ආකාරයටයි. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීම වෙනුවෙන් ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒම, ගොවි ණය කපා හැරීම වැනි ජනතා හිතවාදී ක්‍රියාමාර්ග වෙනුවෙන් අපි කටයුතු කළා. ඒ ආකාරයෙන්ම මේ මොහොතේත් අපේ ප්‍රවේශය වී තිබෙන්නේ ජනතාවට ප්‍රතිලාභ ලබාදීම වෙනුවෙන් දේශපාලනය මෙහෙයවීමයි."

මෙම මාධ්‍ය හමුව සඳහා ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සහ දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයාද එක්ව සිටියේය.

# සිදුවන දේ සහ ජ.වි.පෙ. කියූ දේ අතර සත්‍යය ජනතාවට තේරුම් යාවි

### ජ.වි.පෙ. ප්‍රධාන ලේකම්
## ටිල්වින් සිල්වා සහෝදරයා



ජ.වි.පෙ. ප්‍රතිපත්තියක් මත දේශපාලනය කළ බවත් විශාල ජනතාවක් ආමන්ත්‍රණය කළ බවත් විශාල ජනතාවකට දේශපාලනය කියාදී තිබෙන බවත් පෙන්වා දුන් ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, එබැවින් පළාත් පාලන ආයතනවල ඉදිරියේදී සිට සිදු වන දෙය සහ ජ.වි.පෙ. කියූ දෙය අතර සත්‍යය ජනතාවට තේරුම් යනු ඇතැයි කියා සිටියේය.

එසේම ඉදිරියේදී මෙම තත්වයට වඩා වෙනස් දේශපාලන තත්වයන් අනිවාර්යය ලෙස නිර්මාණය වනු ඇතැයි කී ඔහු මේ තත්වය තුළ ලබාගත් ඡන්ද ප්‍රමාණය සහ මන්ත්‍රී ධුර ප්‍රමාණය අතැතිව ඉදිරියට යෑමට ජ.වි.පෙ.ට ශක්තිය හා ධෛර්යය ඇතැයි අවධාරණය කළේය.

ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 11වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය සාකච්ඡාවට එක්වෙමිනි. වැඩිදුරටත් අදහස් පළ කළ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද පැවසීය.

"පසුගිය අවුරුදු දෙක තුළ අපේ රටේ දේශපාලනයේ තුළ අරාජිකත්වයක් තිබුණා. ජනපති හා අගමැති අතර ගැටුම්කාරී තත්වයක් තිබුණා. ඔවුන් තමන්ගේ පටු දේශපාලන අරමුණු වෙනුවෙන් කටයුතු කිරීම නිසා, ජනතාවගේ වුවමනාවන් ඉටුකිරීම සම්පූර්ණයෙන් පසෙකට ගියා. මෙම අරාජිකත්වය ඉදිරියේදීද නිමා වන්නේ නැහැ. එවැනි අරාජික තත්වයක් ජනතාවට වාසිදායක ආකාරයට කළමනාකරණය කරගැනීමට අපි කටයුතු කරනවා. මේ තාවකාලිකව බලය ගත්ත අයට මේ රටේ ජනතාවගේ ප්‍රශ්න කිසිවක් විසඳන්න බැහැ. ඒ අනුව මේ රටේ ප්‍රශ්න විසඳන්න සිදුවන්නේ ජනතා විමුක්ති පෙරමුණටයි. ඒ විශ්වාසය මත අප ඉදිරියට යනවා."

# කවුරු දිනුවත් ප්‍රශ්නවලදී පොදු ජනතාවට ජ.වි.පෙ. පිහිට පමණයි

### ජ.වි.පෙ. නායක
## අනුර දිසානායක සහෝදරයා



පක්ෂයක් ලෙස අපේක්ෂා කරන ලද බලය ලැබුණු ප්‍රතිඵලය තුළ නොමැති වුවත් මන්ත්‍රී සංඛ්‍යාවේත්, ඡන්ද ප්‍රමාණයේත් සැලකිය යුතු වර්ධනයක් අත්පත් කරගැනීමට ජ.වි.පෙ. සමත් වී ඇතැයි පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, කවුරුන් මැතිවරණය ජයග්‍රහණය කළද එළඹෙන දිනයේදීද පොදු ජනතාව තම ප්‍රශ්නවලට මුහුණ දෙන විට හොයාගෙන එන්නා වූ දේශපාලන ව්‍යාපාරය ජ.වි.පෙ. බව පැහැදිලි යැයි ප්‍රකාශ කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 11වැනි දින පස්වරුවේ ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය.

මේ තත්වය තුළ වර්ධනය වන ජනතා විරෝධී දේශපාලන සංස්කෘතියට එරෙහිව ප්‍රබල ජනතා ව්‍යාපාරයක් ගොඩනැගීමෙන් තොරව පාලනය වෙනස් කළ හැකියැයි තමන් නොසිතන බව කී ඔහු ඒ සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීමට කැපවන බවට සපථ කළේය.

මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර සහෝදරයා මෙසේද පැවසීය.

"2015 ජනවාරි 08වැනිදායින් පසුව රනිල්-මෛත්‍රී හවුල් ආණ්ඩුවේ ගුණාගුණ මැන බැලෙන අවස්ථාව බවට මෙම මැතිවරණයට පත්වී තිබුණා. ආණ්ඩුව ජනතාව විසින් ප්‍රතික්ෂේප කර තිබෙන බව මෙම මැතිවරණයේ ප්‍රතිඵලය තුළ ඉතා හොඳින් පෙන්නුම් කර තිබෙනවා. 2015 ජනවාරි 08 දා ජනතාව විසින් අපේක්ෂා කළ කාර්යයන්ට මුළුමනින්ම පිටුපස හරවා ආණ්ඩුව පසුගිය වසර 3ක කාලය පැමිණ ඇති බව මෙම මැතිවරණය ප්‍රතිඵලය විසින් පෙන්වා දී තිබෙනවා.

එහිම අනෙක් ප්‍රතිඵලය තමයි, ජනවාරි 08 දා පරාජයට පත්කරන ලද දුෂ්ට බලවේග නැවත හිස එසවීම. එය මහජනයාගේ ධනය තමන්ට රිසිසේ කොල්ලකන ලද, ශ්‍රේෂ්ඨාධිකරණ අගවිනිසුරුවරුන් නෙරපා දැමූ, මාධ්‍ය ආයතනවලට බෝම්බ ගැසූ, මාධ්‍යවේදීන් ඝාතනය කළ, බලය වෙනුවෙන් ඕනෑම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට නොපැකිලුණු බලවේගයක්. තමන්ගේ බල ව්‍යාපෘතිය වෙනුවෙන් සියල්ල පාවිච්චි කරන ලද බලවේගයක්. ඔවුන්ට නැවත හිස එසවීමට හැකි වාතාවරණයක් මෙම පළාත් පාලන මැතිවරණයෙන් ලැබී තිබෙනවා.

ජනතාව පැත්තෙන් කල්පනා කර බැලුවොත් මෙතැන් සිට දිගහැරෙන කාලය අතිශය තීරණාත්මකයි. මෙම පළාත් පාලන ආයතන ජනතාවගේ ජීවිත සමග සමීප ආයතනයි. ඒවායේ ක්‍රියාකාරකම් ජනතාවට මහත්සේ බලපානවා. ජනතාව විසින් අනුමත කරන්නේත් වර්ධනය කිරීමට සූදානම් වන්නේත් මෙවැනි දේශපාලන සංස්කෘතියක් නම්, මෙවැනි ආර්ථික රටාවක් නම්, මෙවැනි අපරාධ නම් එහි වගකීමක් ජනතාවටත් තිබෙනවා."


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.